සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

අභියෝග හමුවේ ඉදිරියට

මේ අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුල සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එහි ශක්තිය සහ ඔරොත්තු දීමේ හැකියාව විදහා දක්වමින් ඉදිරියට ගමන් කිරීමට සමත් විය. පශ්චාත් වසංගත ලෝකයේ නව යථාර්ථයන් සදහා හැඩගැසීමට සහ ඉහල සේවා මට්ටම් පවත්වා ගැනීමට අප මණ්ඩලය විසින් පද්ධති අනුකූලනය කර බාධාවකින් තොරව කාර්යක්ෂමව සේවා සැපයීමට වග බලා ගත්තේය. රාජ්‍ය ආයතනයක් ලෙස අනාගතයට සූදානම් වීමේ අරමුණින "පූර්ණ ස්වයංක්‍රීය සාමාජික කේන්ද්‍රීය අයදුම් පද්ධතියක්" ක්‍රියාවට නැංවීම තුලින් පරිසර හිතකාමී, කඩදාසි රහිත පරිසරයක් නිර්මාණය කිරීමට අපට හැකි විය. රටේ දෙවැනි විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල ලෙස චිරස්ථායි විශ්වාසය සහ ස්ථාවරත්වය මත පදනම්ව අභියෝග හමුවේ ඉදිරියට ගමන් කරමින් අප සාමාජිකයන්ට ඉහළම ප්‍රතිලාභ ලබා දීමට හැකි වූයේ අප මණ්ඩලයේ ස්ථායිතාව තව තවත් සනාථ කරමින්ය.

පටුන



සභාපතිතුමාගේ සමාලෝචනය **18**

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය භාරකරුවෙක් හා අරමුදල් කළමනාකරුවෙක් ලෙස අසමසම ආයතනික ව්‍යුහයක් තුළ වර්තමානයේ ක්‍රියාත්මක වන අතර, එහි ප්‍රධාන සහ සහය ක්‍රියාවලි ඩිජිටල්කරණය තුළින් අනාගතයට සූදානම් මූල්‍ය ආයතනයක් බවට පත්වන බව ස්ථිරය. අපගේ අපේක්ෂාවක් වන සහ රජයේ ඊ-පාලන වැඩසටහනට සමගාමීව කඩදාසි රහිත පරිසරයක් කරා දීර්ඝ කාලීන පරිවර්තනය මණ්ඩලය අපේක්ෂා කරයි".

මෙම වාර්තාව පිළිබඳව	3
අප කවුරුන්ද යන වග	4
අපගේ වගකීම්හී ප්‍රස්තුතය	4
ප්‍රධාන මූල්‍ය තත්ත්වයන්	5
සුවිශේෂී අවස්ථා	6
අගය නිර්මාණය කිරීමේ මාදිලිය	8
ආයතනික සමාලෝචනය	10
මණ්ඩලයේ අංශ. කොටස්වල කාර්යයන්	11
කොවිඩ් 19 වසංගතයට ප්‍රතිචාර දැක්වීම	13
කාර්යසාධන සමාලෝචනය	15
නාහිගත සංක්‍රමණය	16
සභාපතිතුමාගේ සමාලෝචනය	18
කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ	
ආයෝජන අංශය	20
දායක මුදල් එකතු කිරීමේ සහ සේවා යෝජක සම්බන්ධතා	24
සාමාජික සේවා අංශය	25
අපගේ සේවකයින්	26
තොරතුරු තාක්ෂණය	32
නීති අංශය	33
මූල්‍ය අංශය	33
අභ්‍යන්තර විගණන අංශය	33
අධ්‍යක්ෂ මණ්ඩලය	34
ආයතනික කළමනාකරණාකාරිත්වය	38
ආයතනික පාලනය	43
අනු කමිටු	
විගණන කමිටු වාර්තාව	47
අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව	49
ආයෝජන කමිටුව	51
කළමනාකරණ කමිටුව	51
අවදානම් කළමනාකරණය	52
මූල්‍ය තොරතුරු	
ලාභ හෝ අලාභ ගිණුම සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	56
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	58
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය	59
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	61
භාණ්ඩාගාර බැඳුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම	62
ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල වටිනාකම	63
ස්කන්ධ ආයෝජනය පිළිබඳ ප්‍රකාශය	64
වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති	66
මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්	79
අතිරේක තොරතුරු	
විගණකාධිපතිගේ වාර්තාව - 2020	97
කෙටුම්පත් විගණකාධිපතිගේ වාර්තාව- 2020 පිළිබඳ මණ්ඩලයේ නිරීක්ෂණ	102
සංඛ්‍යා ලේඛණ ඇමුණුම	107
අපගේ ලඟාවීම	108

අයිකන් මඟපෙන්වීම

ආයෝජන ප්‍රාග්ධනය | **සාමාජික ප්‍රාග්ධනය** | **සේවක ප්‍රාග්ධනය** | **හවුල්කාර ප්‍රාග්ධනය** | **සමාජීය හා ප්‍රජා ප්‍රාග්ධනය**

මෙම වාර්තාව පිළිබඳව





සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2020

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි ශක්තිය සහ ඔරොත්තුදීමේ හැකියාව ප්‍රදර්ශනය කරමින් අති විශේෂ අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් තුළින් එහි ගමන්මඟ ඉදිරියට ගෙන යන ලදී. මණ්ඩලය විසින් ක්‍රියාවලි සහ පද්ධති ක්‍රමවත් කරමින් සහ පහසු සහ කාර්යක්ෂම සේවාවක් ලබා දෙමින් අපේක්ෂාවන්ට වඩා ඉදිරි සේවා මට්ටම් ලඟා කර ගනිමින් 'නව සාමාන්‍ය' යොදා ගනු ලැබීය. අනාගතයට සූදානම් රාජ්‍ය ව්‍යවසායක් ලෙස ඉදිරියට යමින්, මණ්ඩලය සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය කළ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී සැලකියයුතු පියවර තබා ඇති අතර, මෙම පද්ධතිය කඩදාසි රහිත පරිසරයක් කරා පරිවර්තනය වීමට මණ්ඩලය ශක්තිමත් කරනු ඇත. ජාතියේ දෙවැනි විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල ලෙස චිරස්ථායී විශ්වාසය සහ ස්ථාවරත්වය මත හිඳිමින්, ඔරොත්තුදීමේ හැකියාව සමඟ නැඟි සිටීමට මණ්ඩලයේ ස්ථීරභාවය පිළිබඳ උදාහරණ දෙමින්, අපගේ සාමාජිකයින්ට ඉහළම ප්‍රතිලාභ ලබාදීම තුළ අපි සාර්ථකත්වයට පත්ව ඇත.

වාර්තාවේ අන්තර්ගතය

මෙය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 40ස් වන වාර්ෂික වාර්තාව වන අතර මෙමඟින් ආයතනය 2020 දී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දී ඇති ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයයි

2020 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2020 ජනවාරි 1 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය පුරා ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. නවතම වාර්තාව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතර ඒ සඳහා මෙම වාර්තාව පුරාම සංසන්දනාත්මක තොරතුරු ලබා දී ඇත. මෙම වාර්තාවේ අන්තර්ගතය සංවිධානයට මෙන්ම එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට ද වැදගත් වන කරුණු අවධාරණය කරමින් නිර්මාණය කර ඇත.

වාර්තාවේ අරමුණ

අපගේ අනර්ඝ පාර්ශවකරුවන් සමඟ කෙටිකාලීන, මධ්‍යම හා දිගු කාලීනව වටිනාකම් නිර්මාණය කිරීමේ අද්විතීය කාර්යභාරය බෙදාහදා ගැනීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණයි. එමෙන්ම එමඟින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත සන්නිවේදනයක් ද ඉදිරිපත් කරන අතර එහි මූල්‍ය කාර්යය සාධනය සහ සංවිධානය විසින් නිර්මාණය කරන ලද සමාජමය මං සලකුණු අතර සම්බන්ධතාවයද පෙන්නුම් කරයි.

වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත වලින් සමන්විත වන අතර සැසඳීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි. මූල්‍ය ප්‍රකාශන සහ අදාළ සටහන් රජයේ විගණක විසින් විගණනය කරනු ලබන අතර සහතික කිරීමේ වාර්තාව ද මෙම වාර්තාව තුළ ඇත.

වාර්තාවේ අනුකූලතාව

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ආයතනික පාලනය පිළිබඳ හොඳම චර්යා ආචාර ධර්ම සංග්‍රහය හා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සමඟ ආයතනය අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳව පාලන වාර්තාව සාකච්ඡා කරයි.

විමසීම් කළයුතු නිළධාරිවරයා

පී.ඒ.එස්.සුමනසේන මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
දුරථ: 94 11 7747250
ෆැක්ස්: 94 11 7747209
විද්‍යුත් ලිපිනය: finance@etfb.lk

අප කවුරුන්ද යන වග

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනත යටතේ පිහිටුවන ලද අතර 1981 මාර්තු 1 වන දින සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී. එය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද අතර දැනට ක්‍රියාත්මක වන්නේ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ ය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොමැති සියලුම රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් ඔවුන්ගේ සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 3% ක් මාසිකව අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එබැවින් සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, මෙයට සේවකයා/ සාමාජිකයා වෙනුවෙන් දායකත්වය සපයන්නේ සේවායෝජකයා පමණක් වන අතර එබැවින් එය සාමාජිකයා දායක නොවන ප්‍රතිලාභයකි. ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ සහ සංක්‍රමණික සේවකයින්ගේ ස්වේච්ඡා සාමාජිකත්වය වැඩි කිරීම සඳහා විශේෂ අවධානය යොමු කෙරේ.

මණ්ඩලයේ අරමුණ

(1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 07 වගන්තිය පරිදි)

(අ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගි වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම;

(ආ) ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම: සහ

(ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි විය හැකි අන් සියලු ක්‍රියා හෝ දෑ ඉටු කිරීම.

අපගේ වගකිමිහී ප්‍රස්තුතය



දැක්ම

ආයතනික විශිෂ්ටත්වය තුළින් සමස්ත පාර්ශවකරුවන් සඳහා වූ ක්‍රියාශීලී හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම.

මෙහෙවර

සාමාජිකයන් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ඨ සේවාවක් සලසන සුහදශීලී හා විචක්ෂණශීලී භාරයක් වීම.

වටිනාකම්

අ. නිර්මාණශීලී, නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය

ආ. ජනතාවට සුහදශීලී සේවා වටපිටාව

ඇ. සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්

ඈ. විශිෂ්ඨ ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්

ඉ. ඉහළ මූල්‍ය ස්ථාවරත්වය සහ

ඊ. තෘප්තිමත් පාරිභෝගිකයින්

ප්‍රධාන මූල්‍ය තත්ත්වයන්

	2020	2019	වෙනස්
	රු. 000'	රු. 000'	%
මෙහෙයුම්			
මුළු ආදායම	**34,729,466**	32,076,433	8%
මුළු පොළී ආදායම	**33,397,541**	31,554,779	6%
මුළු වියදම්	**2,229,296**	2,314,889	(4%)
මෙහෙයුම් වියදම්	**1,480,865**	1,476,499	0%
බදුවලට පෙර ලාභය	**32,500,170**	29,761,544	9%
බදු වියදම	**4,492,839**	4,242,123	(6%)
බදුවලට පසු ලාභය	**28,007,331**	25,519,421	10%
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය			
මුදල් හා මුදලට සමාන දෑ	**680,784**	548,572	24%
FVTPL මූල්‍ය වත්කම්	**2,930,900**	2,699,451	9%
FVTOCI මූල්‍ය වත්කම්	**7,638,149**	7,899,643	(3%)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්	**360,695,932**	324,688,318	11%
සාමාජික අරමුදල් හා සංචිත	**376,578,656**	340,852,277	10%
සාමාජික දෘෂ්ටිකෝණය			
සාමාජික අරමුදල	**375,215,484**	339,244,338	11%
පොළී හා ලාභාංශ	**27,793,740**	25,129,210	11%
පොළී හා ලාභාංශ (%)	**8.00%**	8.00%	0%
සාමාජික ප්‍රතිලාභ	**405,396**	454,714	(11%)
ආයෝජන ප්‍රතිලාභ	**9.08%**	9.44%	(4%)
ස්කන්ධය මත ප්‍රතිලාභ	**7.44%**	7.46%	0%
වත්කම් මත ප්‍රතිලාභ	**7.37%**	7.40%	0%



සාමාජික අරමුදල (රු. මි.)

375,216

2019 **339,244**



මුළු වත්කම් (රු.මි.)

379,926

2019 **343,325**



බදු පසු ලාභය (රු.මි.)

28,007

2019 **25,519**

ප්‍රධාන සන්ධිස්ථාන

1986

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය:
රු. 100,000/-

1989

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: **නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය:**
රු .200,000/-

1991

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය:
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ: හෘද සැත්කම් සඳහා මූල්‍ය සහය
රු. 300,000/-



2006

- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූල්‍ය සහය
- අභ්‍යන්තර අක්ෂි කාච ප්‍රතිපූරණය
- 5 වසර ශිෂ්‍යත්වය
- "ශ්‍රම සුව රැකවරණ" රෝහල්ගත කිරීමේ යෝජනා ක්‍රමය
- "වියන" අඩු පොළි නිවාස ණය යෝජනා ක්‍රමය

වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් සඳහා මූල්‍ය සහය
රු. 300,000/-



2010
අභ්‍යන්තර අක්ෂි කාච ලබාගැනීම සහ ප්‍රතිපූරණය
රු. 30,000/-

2010

- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූල්‍ය සහය
- අභ්‍යන්තර අක්ෂීය කාච ප්‍රතිපූරණය:
- 5 වසර ශිෂ්‍යත්වය
- "ශ්‍රම සුව රැකවරණ" රෝහල්ගත කිරීමේ යෝජනා ක්‍රමය
- "වියන" අඩු පොළි නිවාස ණය යෝජනා ක්‍රමය
- වකුගඩු බද්ධ කිරීමේ ශල්‍ය කර්මය සඳහා මූල්‍ය සහය

උසස් පෙළ ශිෂ්‍යත්ව
රු. 12,000/-
ශිෂ්‍යත්ව 5,000

2016

1992

- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූල්‍ය සහය

අභ්‍යන්තර අක්ෂීය කාච ප්‍රතිපූරණය:
රු. 18,000/-



1994

- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූල්‍ය සහය
- අභ්‍යන්තර අක්ෂීය කාච ප්‍රතිපූරණය

5 වසර ශිෂ්‍යත්වය
රු. 15,000/-
ශිෂ්‍යත්ව 9,000

1997

- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූල්‍ය සහය
- අභ්‍යන්තර අක්ෂීය කාච ප්‍රතිපූරණය
- 5 වසර ශිෂ්‍යත්වය

"ශ්‍රම සුව රැකවරණ"
රෝහල්ගත කිරීමේ යෝජනා ක්‍රමය
මුළු සේවා කාලසීමාව තුළ
රු. 50,000ක උපරිමයක් දක්වා
වසරකට රු. 25,000/-



2002

- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූල්‍ය සහය
- අභ්‍යන්තර අක්ෂීය කාච ප්‍රතිපූරණය
- 5 වසර ශිෂ්‍යත්වය
- "ශ්‍රම සුව රැකවරණ" රෝහල්ගත කිරීමේ යෝජනා ක්‍රමය

"වියන" අඩු පොළි
නිවාස ණය යෝජනා ක්‍රමය

අගය නිර්මාණය කිරීමේ මාදිලිය

අගයන් සබලකාරක (ආදාන)

ආයෝජන ප්‍රාග්ධනය

සාමාජික අරමුදල — **බිලියන 339**

සාමාජික ප්‍රාග්ධනය

මුළු සේව්‍යයන් — **75,756**

මුළු සාමාජිකයින් ගිණුම් — **මි. 15,9 ක ගිණුම්**

දේශීය සහ සංක්‍රමණ — **සේවකයින් 41,919**

සේවක ප්‍රාග්ධනය

මුළු කාර්ය මණ්ඩලය — **987**

කාර්ය මණ්ඩලයෙන් **45%** වැඩි පිරිසකට මණ්ඩලය සමඟ වසර 20කට වැඩි පළපුරුද්ද ඇත.

දක්ෂ, පුහුණු සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය

හවුල්කාර ප්‍රාග්ධනය

මුදල් අමාත්‍යාංශය

සේවක අර්ථසාධක අරමුදල (EPF)

සමාජ හා ප්‍රජා ප්‍රාග්ධනය

වැඩකරන පුද්ගලයින්

අගය නිර්මාණය (ක්‍රියාවලි)

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

ඉලක්ක හා අරමුණු

උපායමාර්ග සහ කටයුතු

මූලික කටයුතු

එකතුකිරීම අනුකූලතාව සහ බලගැන්වීම්
සේව්‍ය සම්බන්ධතා
සාමාජික සේවා
ආයෝජන

ද්විතීය කටයුතු

මූල්‍ය තොරතුරු තාක්ෂණය
මානව සම්පත
අභ්‍යන්තර විගණනය
සංඛ්‍යාලේඛණ

1980 අංක 46 දරන පනත

ආයතනික යහ පාලනය
ආයතනික අවදානම් කළමනාකරණය



නිර්මාණය කළ වටිනාකම (නිමැවුම්)

ආයෝජිත ප්‍රාග්ධනය

සාමාජික අරමුදල	**බිලියන 375**
ආයෝජන ප්‍රතිලාභ	9.08%

සාමාජිකයින්

පොළිය	**3%**
ලාභාංශ	**5%**

සේවකයින්

පුද්ගල වියදම්	**බිලියන 1.3**
පුහුණු හා සංවර්ධන පිරිවැය	**බිලියන 2.3**
සේවක පිරිවැටුම	**5% ට අඩු**

ප්‍රජාව

හිමිකම් ගෙවීම (ලාභාංශ හා පොළී ඇතුළුව)	**බිලියන 19**
හෘද සැත්කම්	**මිලියන 108**
නිවාස යෝජනා ක්‍රමය	**මිලියන 1,003**
මරණ ප්‍රතිලාභ	**මිලියන 94**
වසර 5 ශිෂ්‍යත්වය	**මිලියන 135**
උසස් අධ්‍යාපනික දීමනාව	**මිලියන 45**
ශ්‍රම සුව යෝජනා ක්‍රමය	**මිලියන 7**
ස්ථිර ආබාධිතතාව	**මිලියන 11**
වකුගඩු බද්ධ කිරීම්	**මිලියන 3**
අභ්‍යන්තර අක්ෂීය කාච	**මිලියන 3**

ආයතනික සමාලෝචනය

වර්තමානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට (ETFB) භාරකරුවෙකුගේ හෝ අත්භාරකරුවකුගේ භූමිකාව ඉටු කිරීම සඳහා සාම්ප්‍රදායික සංවිධාන ව්‍යුහයක් ඇති අතර අනාගතයේ දී සංවිධානය වඩාත් ශක්තිමත් මූල්‍ය සංවිධානයක් බවට පත් කිරීම කළමනාකාරිත්වයේ අපේක්ෂාවයි. පනත මගින් සංවිධානය ව්‍යුහය පිළිබඳව විස්තර නොකෙරේ. කෙසේ වෙතත්, 5 වන වගන්තිය යටතේ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සඳහා රීති සම්පාදනය කිරීමට මණ්ඩලයට හැකිය.

අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා කළමනාකරණයේ සමස්ත වගකීම එහි අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. මණ්ඩලය සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් හතර දෙනෙකු අදාළ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. සාමාජිකයන් දෙදෙනෙකු මුදල් හා වෙළඳ විෂයයන් භාර අමාත්‍යවරුන් විසින් නම් කරනු ලැබේ. එක් සාමාජිකයෙකු ලංකා සේවය සම්මේලනය විසින්ද සාමාජිකයින් දෙදෙනකු, සමාජිකයින් 100,000 ට වඩා සිටින වෘත්තීය සමිති විසින්ද පත් කරනු ලැබේ.

මණ්ඩලයේ සභාපතිවරයා තෝරාගනු ලබන්නේ විෂය භාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි වන අතර ඔහු පනත මගින් සපයා ඇති පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී වරයාද වේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මුලදී ව්‍යුහගත වූයේ මධ්‍යගත සංවිධානයක් ලෙස ය. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සේවා යෝජකයින්ගෙන් බහුතරයක් බස්නාහිර පළාතේ සංකේන්ද්‍රණය වී තිබීම ය. බොහෝ විභවයක් සහිත ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල විවෘත කිරීමත් සමඟ ප්‍රාදේශීය කාර්යාල ජාලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අවසන් කිරීමෙන් පසු බලාත්මක කිරීමේ සහ නීතිමය කටයුතුවල වේගවත් සංවර්ධනයක් සිදු විය. පසුව සාමාජික සේවා ක්‍රියාකාරකම් වන හිමිකම් ඉල්ලුම්පත් භාරගැනීම, හිමිකම් ගෙවීම්, සාමාජික දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය විමධ්‍යගත කරන ලදී.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ක්‍රියාකාරී ප්‍රදේශ පුළුල් ලෙස, මෙහෙයුම් සහ උපකාරක සේවා ලෙස බෙදිය හැකිය. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන අංශ මෙහෙයුම් ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇත. පරිපාලන හා මානව සම්පත්, මූල්‍ය, තොරතුරු තාක්ෂණ හා අභ්‍යන්තර විගණනය යනාදිය උපකාරක සේවා ලෙස හඳුනාගෙන ඇත.

පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි සංවිධානයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස රාජකාරී ඉටු කිරීමට සභාපතිවරයාට බලය ඇත. සාමාන්‍යාධිකාරී සහ අතිරේක සාමාන්‍යාධිකාරී ප්‍රධාන විධායක නිලධාරීගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ආයතනයේ සෑම කොට්ඨාශයක්ම මෙහෙයවනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවයෙකු විසිනි.



මණ්ඩලයේ අංශ,කොටස්වල කාර්යයන්

01

දායක මුදල් රැස්කිරීම් සහ සේවා යෝජක සබඳතා කොට්ඨාශය

පුද්ගලික අංශයෙහි සහ විශ්‍රාම වැටුපක් නොගෙවන රාජ්‍ය ආයතනවල සේවයෙහි නිරත සේවක සේවිකාවන්ගේ දළ ඉපැයීම්වලින් 3%ක් වූ ප්‍රමාණයකින් දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයා විෂයෙහි අනිවාර්ය කරුණක් වන්නේ ය. එම සේවායෝජකයන් වෙතින් කලට වේලාවට දායක මුදල් රැස්කර ගැනීම, අධිභාර වෙතොත් ඒවා අයකර ගැනීම, ගෙවීම් පැහැර හරින්නන් හා දායක මුදල් නොගෙවන්නන් සොයා බැලීම සහ ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව නීති මඟින් කටයුතු කිරීම යනාදිය දායක මුදල් රැස්කිරීමේ ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යන් සමහරකි. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා අංශය, මණ්ඩලය වෙත ලැබිය යුතු දායක මුදල් රැස්කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් වගකීම උසුලයි.

02

ආයෝජන කොට්ඨාශය

ආයෝජන කොට්ඨාශය මණ්ඩලයේ ආයෝජන කාර්ය භාරය කළමනාකරණය කිරීම අරඹයා පිහිටුවන ලද ආයතනයට අයත් දැඩිව සහබද්ධ වූ ව්‍යාපාරික ඒකකවලින් එකකි. මෙම ඒකකයෙහි ප්‍රමුඛ අරමුණ වනුයේ, ආයෝජන තුළින් හැකි උපරිම ලාභ සලසා ගන්නා අතරම ඒවායේ ආරක්ෂාව සහතික කරමින් ද්‍රවශීලතා මට්ටම පවත්වාගෙන යාමයි. ආයෝජන තීරණ වලට එළඹීම පිණිස වන්නා වූ සියලුකරුණු ග්‍රහණය කර සෑදූ ආයෝජන ප්‍රතිපත්තියක් ආයෝජන අංශය සතුය.

03

සාමාජික සේවා කොට්ඨාශය

මෙම කොට්ඨාශය අයත් ප්‍රධාන කර්තව්‍යයන්හීලා, සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජික සාමාජිකාවන් වෙත වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම, සාමාජික පොදු ප්‍රතිලාභ (සාමාන්‍ය හා මරණ හිමිකම්) ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් ඉටුකිරීම සහ සක්‍රීය සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් වෙනත් සුභසාධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම යනාදී කටයුතු අන්තරගත වේ. මෙම අංශයේ කටයුතු තවදුරටත් සවිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පොදු කාර්ය යටිතල ව්‍යුහය සලසා දීම සඳහා ප්‍රමාණවත් පරිදි පියවර ගනු ලැබ තිබේ.

04

මූල්‍ය කොට්ඨාශය

මුදල් කොට්ඨාශය හා සහබද්ධව පවත්නා කර්තව්‍යයන්හීලා, මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, රජයේ බදු ඇතුළුව කාර්ය මණ්ඩලය හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම, රජයේ විගණන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ආයතනික සැලසුම් හා වෙනත් කළමනාකරණ තොරතුරු වාර්තා පිළියෙළ කිරීම.

05

පාලන සහ මානව සම්පත් කොට්ඨාශය

වත්මන් තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ බෙහෙවින් වැදගත් වන්නාවූ නවීන මානව සම්පත් විධික්‍රම හා විශිෂ්ටතම කාර්යාල පරිචයන් සමඟ ගැළපෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ තිබේ. සේවා සපයන ආයතනයක් වශයෙන් කටයුතු කරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විෂයයෙහි ද ජනතාවගේ (සේවා නියුක්තයන්ගේ) සේවා අවශ්‍යතාවය මත රැඳෙමින් කටයුතු කිරීම ඉතා ඉහළ තලයක විය යුතු වන්නේය. එබැවින්, පාලන හා මානව සම්පත් කොට්ඨාශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සංවර්ධනය කර වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. ඒ අනුව, පාලන හා මානව සම්පත් අංශය විසින් පිළිපදින ලැබිය යුතු දැනටමත් පවත්නා ක්‍රම සහ කාර්ය පටිපාටි යාවත්කාලීන කර වැඩි දියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන්නාවූ පුහුණුව ලබාදීම සඳහාත් විවිධ මූල පිරීමේ කාර්යයන් සිදු කර ඇත.

මණ්ඩලයේ අංශ,කොටස්වල කාර්යයන්

06

තොරතුරු තාක්ෂණ කොට්ඨාශය

අරමුදලේ සාමාජික පාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු කොට්ඨාශය අංශය ප්‍රධාන වශයෙන් වගකීම උසුලයි. ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව ක්‍රියා කරමින් ආයතනයට අයත් තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස වූ සියළු මූලාරම්භක කටයුතු ඉටු කරනු ලැබ තිබේ.

07

විගණන සහ සහතිකකිරීමේ කොට්ඨාශය

ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රමාණවත් පරිදි ස්ථාපනය කරනු ලැබ ඇති බවටත්,එම පද්ධති අඛණ්ඩව හා ප්‍රශස්ත මට්ටමකින් අනුගමනය කරනු ලබන බවටත් සහතික වීමේ වගකීම අභ්‍යන්තර විගණන කොට්ඨාශය උසුලයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධාන විධායක නිලධාරී වෙත සෘජුවම වාර්තා කරනු ඇත. කළමනාකරණයේ මතය වනුයේ, අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රම හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත්භාවය නැවත තක්සේරු කිරීම සඳහාත්, ආයතනයෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා අභ්‍යන්තර විගණනයේ කාර්ය භාරය ඵලදායී මෙවලමක් ලෙස ශක්තිමත් කිරීම සඳහාත් නිසි අධ්‍යයනයක් කළ යුතුය යන්න ය. කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා අධ්‍යයනයක් සිදුකළ යුතු බව කළමනාකරණයේ මතය වේ.

08

නීති කොට්ඨාශය

මණ්ඩලයට අදාළ වන්නාවූ සියලුම නෛතික කටයුතු අරභයා උපදේශක සේවා ඒකකයක් ලෙස නීති අංශය ක්‍රියාත්මක වේ. අදාළ නෛතික කටයුතු ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය ව්‍යාප්ත කරනු ලැබීමත් සමඟ ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගත කරනු ලැබ තිබේ. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) අධීක්ෂණය යටතේ නීති අංශය කටයුතු කරන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් හා සේවායෝජක සබඳතා) වෙත වාර්තා කරයි.

කොවිඩ් 19 වසංගතයට ප්‍රතිචාර දැක්වීම

වසංගතය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රතිචාරය එහි සේවකයින් සහ පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව සහතික කරමින් වසංගතය හමුවේ ව්‍යාපාර අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා එහි ශක්තිමත් බැඳීම පාදක කරගෙන ඇත. අපගේ සාමාජිකයින්ට බාධාරහිත ආකාරයකින් අපගේ සේවාවන් සඳහා ප්‍රවේශය පැවති බවත් වසංගතය මගින් ඇතිකළ බාහිර තත්ත්වයන්ට කඩිසරව අනුගත වූ බවත් අපි සහතික කරමු.

පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව

සෞඛ්‍ය රෙගුලාසිවලට අනුකූලව ආරක්ෂිත සහ සුරක්ෂිත සේවා ස්ථානයක් පවත්වා ගැනීම



සියලුම පැමිණෙන්නන්ගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම



කාර්යාලය තුළ සමාජ දුරස්ථභාවය පිළිබඳ ක්‍රියාමාර්ග



ඇතුළත් විමේදි දෑත් සේදීමේ පහසුකම් ලබාදීම



කාර්ය මණ්ඩලය සඳහා පුද්ගලික ආරක්ෂක උපකරණ ලබාදීම



පිරිසිදු හා සෞඛ්‍යානුකූල පරිසරයක් නිර්මාණය කිරීමට පොදු අවකාශ විධිමත් පරිදි සැනිටයිසර් කිරීම



සියලු ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිපදිමින් වසංගතය තුළ අඛණ්ඩ සේවය

කොවිඩ් 19 වසංගතයට ප්‍රතිචාර දැක්වීම

එන්නත්කරණය තුළින් කොවිඩ් 19 වයිරසය වැලැක්වීම දිරිමත් කිරීම සහ වයිරසයෙන් ආසාධිත වූ කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීම

	2020	2021 සැප්තැම්බර් දක්වා
කොවිඩ් වයිරසය සඳහා පොසිටිව් වූ සේවක සංඛ්‍යාව	-	118
අභ්‍යන්තරව පීසීආර් පරීක්ෂාව කළ සංඛ්‍යාව	44	146

බාධාරහිත සේවා මට්ටම් සහ ව්‍යාපාර අඛණ්ඩතාව පවත්වා ගැනීම

ප්‍රාදේශිය කාර්යාල ඇතුළත්ව දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ දායක මුදල් සිදුකිරීම, ආපසු ගෙවීමේ හිමිකම් සහ ප්‍රතිලාභ හිමිකම් පිරිසැකසුම් කිරීම වැනි පොදු ජනතාවට අත්‍යවශ්‍ය සියලුම සේවා ලබාදීමට මණ්ඩලය පහසුකම් ඇතිකරමින් ඒවා ශක්තිමත් කරන ලදී.

(රු.මි.)	අධික අයකිරීම් කපාහැරීම	ආපසු ගෙවීමේ හිමිකම්	ප්‍රතිලාභ හිමිකම්
1 වැනි රැල්ල (27.01.2020 - 03.10.2020)	649	2,367	22
1 වැනි රැල්ල (2020.10.04 - 2020.04.14)		3,700	56
එකතුව.	649	6,067	78

2020 දී පනවන ලද අගුළුදැමීම් සහ සංචරණ සීමාකිරීම් තුළ පහසු සහ බාධා රහිත සේවා මට්ටම් ඇති කිරීම පිණිස, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කණ්ඩායම් සාමාජිකයින් විසින් වැඩවල නව සාමාන්‍ය ක්‍රමයට ඔරෙත්තුදීම සහ අනුරූපවීම පෙන්නුම් කරමින් නිවසේ සිට වැඩ කිරීම කරා සංක්‍රාන්ති විය. පහසු සංක්‍රාන්තියක් ඇති කිරීම සඳහා ටැබ් සහ වෙනත් පහසුකම් සේවකයින් වෙත ලබාදෙන ලදී. සූම් වැනි මාර්ගගත අවස්ථා මගින් විධිමත් රැස්වීම් පවත්වන ලද අතර, ටීම්වීස් කණ්ඩායම් විසින් කණ්ඩායම් මඟ සම්බන්ධතාව සහ සහයෝගිත්වය සහතික කරන ලදී.



සේවා යෝජකයින් වෙත බාධා රහිත සේවාවන් සැලසීම

මණ්ඩලය කොවිඩ් 19 වසංගතයේ 1 වැනි සහ 2 වැනි රැල්ල තුළ වැඩිපුර අයකිරීම් කපාහරිමින් ව්‍යවස්ථාපිත දායක මුදල් මත මාස හයක සහන කාලසීමාවක් ලබා දෙන ලදි.

ඩිජිටල් ක්‍රම හරහා ඔවුන්ගේ දායක මුදල් නිරවුල් කිරීමට සාමාජිකයින්ට හැකියාව ඇති කරන ඩිජිටල් විසඳුම් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රම තුළින්, සේවා යෝජකයින්ට ඔවුන්ගේ සේවක භාර අරමුදල් දායකත්වයන් ගෙවිය හැකි අතර ගෙවීම් සඳහා සහය ලියවිලි ඉදිරිපත් කිරීමටද හැකි වේ. සෘජු බැර ක්‍රමය 2020 දී දියත් කරන ලද අතර, ජාත්‍යන්තර බැංකු සමඟ කටයුතු කරන විශාල සේවා යෝජකයින් 500කට පමණ මින් ප්‍රතිලාභ ඇති විය.

2020 දී ඩිජිටල් දායකත්ව ගණන	සේවා යෝජකයින් 63,271
2020 දී ඩිජිටල් ආකාරයෙන් ලද දායක මුදල්වල වටිනාකම	මිලියන 16,259

වඩා පුළුල් ප්‍රජාව ආරක්ෂා කිරීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි කණ්ඩායම සමඟ කොවිඩ් 19 සහන අරමුදල වෙත රුපියල් මිලියන 2ක් දායක විය.



කාර්යසාධන සමාලෝචනය

අගය එකතු කිරීමේ ප්‍රකාශය

මණ්ඩලයේ අගය නිර්මාණය පිළිබඳ විශ්ලේෂණයක් සහ සමූහයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර වෙන්කිරීම පහතින් දැක්වේ

	2020	2019	වෙනස
	රු.මි.	රු.මි.	%
එකතුකළ වටිනාකම			
ප්‍රධාන ව්‍යාපාරවලින් උපයන ලද ආදායම	33,697.51	31,647.42	6.48
සේවා පිරිවැය	(238.89)	(253.02)	(5.58)
ප්‍රධාන ව්‍යාපාරවලින් එකතුකළ වටිනාකම	33,458.61	31,394.40	6.58
වෙනත් ආදායම්	1,031.96	429.01	140.54
ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ අයකිරීම්	(0.07)	0.40	(118.54)
වටිනාකම් එකතු කිරීම	34,490.50	31,823.81	8.38
සේවකයින්ට වටිනාකම වෙන්කිරීම			
වැටුප්, වේතන සහ වෙනත් ප්‍රතිලාභ	1,290.11	1,292.86	(0.21)
සාමාජිකයින්ට			
සාමාජිකයින්ට ගෙවූ පොළිය	10,668.74	9,684.16	10.17
සාමාජිකයින්ට ගෙවූ ලාභාංශ	17,371.09	15,705.76	10.60
රජයට			
බදු	4,492.84	4,242.12	5.91
ප්‍රජාවට			
සාමාජික ප්‍රතිලාභ	405.40	454.71	(10.85)
ව්‍යාප්තිය සහ වර්ධනය සඳහා			
රඳවාගත් ලාභ	213.59	390.21	(45.26)
ක්ෂයකිරීම සහ ක්‍රමක්ෂය	48.73	53.98	(9.72)
වෙන්කළ මුළු වටිනාකම	34,490.50	31,823.81	8.38

එකතුකළ ආර්ථික වටිනාකම (EVA)

එකතුකළ ආර්ථික වටිනාකම ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. එකතුකළ ආර්ථික වටිනාකම යනු සැලකියයුතු අවදානමට කොටස් හිමියන් සඳහා අවශ්‍ය අවම ප්‍රතිලාභ ඉක්මවායන හෝ අඩුකරන ඉපයීම් ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවකි.

	2020	2019
	රු.මි.	රු.මි.
ආයෝජිත ප්‍රාග්ධනය		
සාමාන්‍ය සාමාජික අරමුදල	357,229.91	322,849.57
එකතුකළා-ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම	9.17	9.24
	357,239.08	322,858.82
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ		
බදුකරණයට පසු ලාභය	28,007.33	25,519.42
එකතුකළ ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම	(0.07)	0.40
ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය	28,007.26	25,519.82
ආයෝජිත ප්‍රාග්ධනයේ ආවස්ථික පිරිවැය *	(22,506.06)	(29,703.01)
එකතුකළ ආර්ථික වටිනාකම්	5,501.20	(4,183.19)

*2020 සාමාන්‍ය බරතබන ලද - 6.30% මාස 12 භාණ්ඩාගාර බිල්පත් මත පදනම් වී ගණනය කරන ලදී (2019 - 9.20%)

නාභිගත සංක්‍රාන්තිය

උපායමාර්ගික අවශ්‍යතා

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ දිගු කාලීන උපායමාර්ගය වූහි සාමාජිකයින් වෙත ස්ථාවර සහ ආරක්ෂිත ප්‍රතිලාභයන් ලබාදෙමින් මූල්‍ය ස්ථාවරත්වය ලබාදීමේ වූහි ප්‍රධාන අරමුණ මත දැඩිව ස්ථානගත කර ඇත. අනාගතය කේන්ද්‍ර කරගත් රාජ්‍ය ආයතනයක් ලෙස, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය උත්තරීතර සේවාවක් ලබාදෙන සාමාජිකයින් කේන්ද්‍රකරගත් ආයතනයක් බවට පත්වීමේ වූහි පරමාර්ථය අත්කරගනිමින් ප්‍රධාන උපායමාර්ගික අවශ්‍යතා තුනක් කෙරෙහි අවධානය යොමු කරයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන උපායමාර්ගික අවශ්‍යතා පහත පරිදි වේ:

1* සාමාජිකයින්ගේ අරමුදල් පදනම් තුළ වර්ධනය සහ ස්ථීර ස්ථාවර ප්‍රතිලාභ ඉපයීම

2* සේවය පළමුව යන ආකල්පයෙන් යුක්තව සාමාජිකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත කාර්යක්ෂම සේවා ලබාදීම.

3* උත්තරීතර වටිනාකමක් ලබාදීම සඳහා ආයතනයේ රැකියා කොටස සහ ඵලදායිතා මට්ටම් වැඩි දියුණු කිරීම.

උත්තරීතර සේවාවක් ලබාදෙමින් ආයතනික අනර්ඝත්වය අත්කර ගනිමින් සියලුම පාර්ශ්වකරුවන් සඳහා ගතික සහ ශක්තිමත් භාරකරුවෙක් බවට පත්වීමේ වූහි දැක්ම තුළ මණ්ඩලය මෙම උපායමාර්ගය අනුගමනය කරයි. මෙම පැහැදිලි උපායමාර්ගික අවශ්‍යතා තුන ක්‍රියාත්මක කිරීම සඳහා කොවිඩ් 19 අර්බුදය බහුවිධ ක්‍රමෝපායික ප්‍රවේශයක අවශ්‍යතාව ඇති කර ඇත.

අභියෝගාත්මක බාහිර පරිසරයන් හමුවේ, ක්‍රියාත්මක කරමින් සිටින උපායමාර්ගික අවශ්‍යතාවල ප්‍රගතිය පිළිබඳ සැලකියයුතු පියවර අත්කර ගැනිමේදී මණ්ඩලය සාර්ථකත්වයට පත්ව ඇත.

උපායමාර්ගික අවශ්‍යතා	2020 දී ප්‍රගතිය
සාමාජිකයින්ගේ අරමුදල් පදනම් තුළ වර්ධනය සහ ස්ථීර ස්ථාවර ප්‍රතිලාභ ඉපයීම	
ඉදිරි වසර 5 තුළ සාමාජිකයින්ගේ අරමුදල රුපියල් ට්‍රිලියන භාගයක් දක්වා වර්ධනය කිරීම.	2020 දෙසැම්බර් 31 වන දිනට සාමාජිකයින්ගේ අරමුදල් ශේෂය රුපියල් බිලියන 375 කි. සාමාජික අරමුදල් පදනම 10% ක වාර්ෂික සාමාන්‍ය අනුපාතයකින් වර්ධනය වී ඇත. මෙම ප්‍රවණතාවයේ අඛණ්ඩතාව අනුව, ව්‍යාපාරික බාහිර තත්ත්වයන් වූලෙසම පවතින බැවින් අරමුදල් ශේෂය 2023 වන විට ට්‍රිලියන භාගයක සන්ධිස්ථානය කරා ළඟා වනු ඇතැයි පුරෝකථනය කෙරේ. සංක්‍රමණික සේවකයන් සහ ස්වයං රැකියාලාභී අංශ මෙම අරමුදල හා සම්බන්ධ වීමට දිරිමත් කිරීම මගින් සාමාජික පදනම පුළුල් කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය බලාපොරොත්තු වේ.
බලාත්මක කිරීම සහ පාරිභෝගික සම්බන්ධතා ක්‍රියාකාරකම් මගින් සේවකයින්ගේ 100% ආවරණය සහතික කිරීම. තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන (සේ.අ.අ, සමාගම් ලියාපදිංචි කිරීම, පුද්ගලයන් ලියාපදිංචි කිරීම, සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය, ආදිය) සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම ආරම්භ කිරීම	සේවකයින්ගේ 100% ආවරණය සහතික කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය උත්සාහ කරයි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, පෙර වසරවලට සාපේක්ෂව ආවරණ මට්ටම් කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කළේය. වසංගතය හේතුවෙන් ව්‍යාපාරික ආයතන මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2020 දී දැඩි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක නොකළේය. කෙසේ වෙතත්, අනාගතයේදී සේවා යෝජකයන්ගේ අනුකූලතාවය සහතික කිරීම සඳහා අවධානය යොමු කරන ලද පියවරයන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.
2025 වන විට ආදායම් මට්ටම රුපියල් බිලියන 50 දක්වා වැඩි කිරීම.	2020 මූල්‍ය වර්ෂය තුළදී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රුපියල් බිලියන 34ක වාර්ෂික ආදායමක් වාර්තා කළේය. ඉහළ ප්‍රතිලාභ උත්පාදනය කිරීම සඳහා යහපත් සහ විචක්ෂණශීලී ආයෝජන උපාය මාර්ග අනුගමනය කරමින් ආයෝජන කළඹ මත වූහි ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම මගින් ආදායම් මට්ටම් ඉහළ නැංවීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කැපවී සිටී. ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම 2025 දී ප්‍රක්ෂේපිත ආදායම් මට්ටම් ඉහළ නැංවීම සඳහා අනුගමනය කරන තවත් උපාය මාර්ගයකි. සාමාජිකයින්ට ස්ථීර සහ ස්ථාවර ප්‍රතිලාභයක් ලබා දීම සඳහා වූහි ආයෝජන කළඹේ අවදානම් පරාමිතීන් මත සම්මුතියකින් තොරව ආදායම් මට්ටම් ඉහළ නැංවීමට මණ්ඩලය කැපවී සිටී.

උපායමාර්ගික අවශ්‍යතා	2020 දී ප්‍රගතිය
සාමාජිකයින් සහ සේවා යෝජකයින් වෙත කාර්යක්ෂම සේවා ලබාදීම	
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල මණ්ඩලය දැනට ක්‍රියාවලි ප්‍රති-ඉංජිනේරු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් සිටී. මෙම සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධතිය කඩදාසි රහිත පරිසරයක් නිර්මාණය කරනු ඇත. සංවර්ධන කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහය ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් සපයනු ලබයි.	පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති සන්ධිස්ථාන සාක්ෂාත් කර ගැනීමත් සමඟ 2020 වර්ෂයේදී සැලකිය යුතු ප්‍රගතියක් ඇති විය. • මෘදුකාංග සංවර්ධන ජීවන චක්‍රය පුනරාවර්තනය සම්පූර්ණ කිරීම • පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) 60% සම්පූර්ණ කිරීම. (2021 දී ව්‍යාපෘතියෙන් 80%ක් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ)
දැනට පවතින සේවා යෝජක කේන්ද්‍රීය දත්ත පදනම වෙනුවට සාමාජික කේන්ද්‍රීය දත්ත පදනමක් කරා සංක්‍රමණය වීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය බලාපොරොත්තු වේ. ගිණුම් කිහිපයක් ඇති සාමාජිකයින්ට මෙය පහසු ප්‍රවේශය සක්‍රීය කරයි.	ව්‍යාපෘතියේ කටයුතු සිදුවෙමින් පවත්නා අතර 2022 දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතට සංශෝධන සමඟ පාරිභෝගික හිතකාමී ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සහ හඳුන්වාදීම.	වර්තමාන පරිසරයේ අවශ්‍යතාවලට අනුකූල වන නීති සම්පාදනය හඳුන්වාදීම සඳහා පනතේ සංශෝධන කෙටුම්පත් කර පරීක්ෂා කරමින් පවතී.
කඩිනම් සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා තත්‍ය කාලීන ප්‍රතිලාභ සහ හිමිකම් සැකසීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. මෙම නව මාර්ගගත පහසුකම් මගින් ස්මාර්ට් ෆෝන් සහ පරිගණක වැනි නවීන ඉලෙක්ට්‍රොනික උපාංග හරහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පද්ධතියට ප්‍රවේශ වීමට හැකියාව ලැබේ.	මෙම ව්‍යාපෘතිය 2022 මුල් භාගයේදී නිම කිරීමට බලාපොරොත්තු වේ.
රැකියා කොටස සහ ඵලදායිතා මට්ටම් වැඩි දියුණු කිරීම.	
වසර ගණනාවක් පුරා සියළුම සේවකයින්ගේ ධාරිතා මට්ටම් ගොඩනැගීම කෙරෙහි මණ්ඩලය ස්ථාවර අවධානයක් යොමු කර ඇත. ඉහළ ඵලදායිතාවක් සහ කාර්යසාධනයක් ඇති කිරීම සඳහා එහි සේවකයින්ගේ කුසලතා සහ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා පුහුණුව සහ සංවර්ධනය තුළ සැලකිය යුතු ලෙස ආයෝජනය කර ඇත.	වසංගතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස අඟුලු දැමීමත් සමඟ, මණ්ඩලයට නියමිත පුහුණු හා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත්, මාර්ගගත පුහුණු සැසි පවත්වන ලදී. තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව 2021 දී පුහුණු සැසි මාලාවක් හරහා සිය පුහුණු සහ සංවර්ධන මූලපිරීම් අඛණ්ඩව සිදු කිරීමට මණ්ඩලය බලාපොරොත්තු වේ.
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කාර්යක්ෂමතාව සහ ඵලදායිතා මට්ටම්වල ඉහළම ප්‍රමිතීන් නගා සිටුවවිමට කැපවී සිටී. නවතම ඵලදායිතා සංකල්ප පිළිබඳ තාක්ෂණික අවබෝධයක් ලබා ගැනීම සඳහා, මණ්ඩලය ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල හරහා කාර්යක්ෂමතා මට්ටම් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා ඵලදායිතා ලේකම් කාර්යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.	ජාතික ඵලදායිතා තරගය - 2020 සඳහා අනුරාධපුර, වවුනියාව සහ හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාල සහභාගි විය. ප්‍රාදේශීය කාර්යාල තුනම ස්ථාන පරීක්ෂාව සඳහා සුදුසුකම් ලබා ඇත.

සභාපතිතුමාගේ සමාලෝචනය



"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය භාරකරුවෙක් හා අරමුදල් කළමනාකරුවෙක් ලෙස අසමසම ආයතනික ව්‍යුහයක් තුළ වර්තමානයේ ක්‍රියාත්මක වන අතර, එහි ප්‍රධාන සහ සහය ක්‍රියාවලි ඩිජිටල්කරණය තුළින් අනාගතයට සූදානම් මූල්‍ය ආයතනයක් බවට පත්වන බව ස්ථිරය. අපගේ අපේක්ෂාවක් වන සහ රජයේ ඊ-පාලන වැඩසටහනට සමගාමීව කඩදාසි රහිත පරිසරයක් කරා දීර්ඝ කාලීන පරිවර්තනය මණ්ඩලය අපේක්ෂා කරයි."

හිතවත් කොටස් හිමියනි,

ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය (ETFB) අති විශේෂ අභියෝගාත්මක ව්‍යාපාර වාතාවරණයක් හමුවේ එහි සාමාජිකයින්ට සහ සමස්ත ආර්ථිකයට සැබැවින්ම සහයවීම සඳහා එහි වගකීම සහ හැකියාව පෙන්නුම් කරමින් සිටී. අපගේ 2020 වාර්ෂික වාර්තාවේ තේමාව වන 'ඔරොත්තුදීම සමඟ නැගිටීම' ජාතියට සහය වෙමින් සිය සාමාජිකයින් වෙත සේවාවන්හී අඛණ්ඩතාව සහතික කිරීම පිණිස අභියෝගාත්මක බාහිර තත්ත්වයන් හමුවේ වුවත් එහි මෙහෙයුම් ආකෘතිය නැවත පෙලගැස්වීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කඩිසරබව දක්ෂ ලෙස පිළිබිඹු කරයි.

විපත් කාලය යටතේ කටයුතු කිරීම

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය කොවිඩ් 19 හේතුවෙන් සිදුකළ අගුලු දැමීමේ බලපෑම මත 2020 දී 3.6කින් සංකෝචනය වූ අතර, ව්‍යාපාරික බාධාවන් ආර්ථික කටයුතු මත බරක් ඇති කරන ලදී. මෙය සාර්ව ආර්ථික ගතිකතාවන් තුළ අභියෝග නිර්මාණය කළේය. ඒ අනුව මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ අඩු පොළී අනුපාතයක් පැවති අතර, මූල්‍ය වසර තුළ ආසන්න වශයෙන් පදනම් ලකුණු 350 කින් පොළී අනුපාත පහත වැටුනී. මෙම පහත වැටීම තුළ වුවත්, අපගේ මනාව තුලනය කළ ආයෝජන කළඹ විචක්ෂණශීලීව කළමනාකරණය තුළින් සාමාජිකයින් වෙත 8% ක ආකර්ෂනීය ප්‍රතිලාභ අනුපාතයක් පවත්වා ගැනීම තුළ අප සාර්ථක වී ඇත.

බාධාවන් හේතු කොට ගෙන, බොහෝ ව්‍යාපාරවලට දැඩි ලෙස බලපෑම් කරන ලද අතර, ව්‍යාපාර වැසීමට ද එය හේතු විය. එය වඩා අඩු දායක මුදල්වලට දායක වීමට හේතු විය. මුදල් ප්‍රවාහ අභියෝග හේතුවෙන් නිසි වේලාවට දායක මුදල් තබාගැනීමට ආයතන ද පහසුවෙන් සතුටු කළ නොහැකි පරිදි ඇදීගෙන යන ලදී. මේ සියල්ල හමුවේ, ප්‍රශංසනීය ලෙස, එහි කළමනාකරණය යටතේ වත්කම්වල රු. බිලියන 380 දක්වා වර්ධනයක් මණ්ඩලයට දැකගත හැකි විය. අරමුදලේ ශුද්ධ වටිනාකම පෙර මූල්‍ය වසරේ වාර්තාකළ රු. බිලියන 341ට සාපේක්ෂව 2020 අවසානය වන විට රු. බිලියන 377 ක් වාර්තා කරමින් 10.5% කින් වර්ධනය විය. මණ්ඩලයේ මුළු ආදායම රු. බිලියන 38ක් වාර්තා කරමින් 8%කින් වැඩි වී ඇත. මුළු වියදම දැඩිව කළමනාකරණය කරමින් 4%කින් අඩු වූ අතර, එය පෙර වසරට වඩා 9%ක වැඩිවීමක් වන රු.බිලියන 32.5 දක්වා බදු පෙර ලාභයෙහි වැඩිවීමකට හේතු විය. ඉහත කරුණු සියල්ල හේතු කොට ගෙන, මණ්ඩලය මුදල් අමාත්‍යංශයේ අධීක්ෂණය යටතේ රජයට අයත් ව්‍යවසායන්හී සමස්ත ලාභදායී මට්ටම්වලට 20%ක් දායක වෙමින් වඩාත් ලාභදායී රජයට අයත් ව්‍යවසායක් ලෙස එහි ගමන් මඟ මෙහෙයවන ලද බව සැලකිය යුතුය.

2020 දී තවත් එක් වැදගත් සන්ධිස්ථානයක් වූයේ දැඩි කොවිඩ් සීමා කිරීම් හමුවේ කම්කරු මහ ලේකම් කාර්යාලයේ විශාල ඉඩකඩ සහිත නවතම ගොඩනැගිල්ල වන 'මෙහෙවර පියෙස' වෙත මෙහෙයුම් සහ සහය කාර්ය මණ්ඩලයේ විතැන්වීමයි.

වසංගතය තුළ ගමන් කිරීම

2020 දී වෙනත් වසරවල මෙන් නොව, ප්‍රධාන ප්‍රමුඛතාවන් දෙකක් වූයේ අපගේ සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කරමින් ව්‍යාපාර අඛණ්ඩතාව පවත්වා ගැනීමයි. මණ්ඩලය අගුලු දමනලද කාලසීමාව තුළ බාධාරහිත සේවාවක් ලබාදෙන ලද අත්‍යවශ්‍ය නොවන රාජ්‍ය සේවාවන්ගෙන් එකක් විය. අපගේ කැප වූ කණ්ඩායම එකට එකතු වී වසංගත කාලසීමාව තුළ එහි සාමාජිකයින් වෙත රුපියල්

බිලියනයකට වඩා සාර්ථකව මුදල් ගෙවීම සඳහා නව වැඩකිරීමේ මාර්ගවලට ඉක්මණින් අනුගත විය. දැඩි සංරෝධක හමුවේ වුවත් අපගේ ආයෝජන කටයුතුවල අඛණ්ඩතාව ද අපි පවත්වා ගෙන ඇත.

සේවා යෝජකයින් විසින් මුහුණපාන අභියෝග හඳුනාගනිමින්, මණ්ඩලය විසින් ව්‍යවස්ථාපිත දායක මුදල් මත මාස හයක සහන කාලසීමාවක් පිරිනමන ලදී. එමෙන්ම, සේවා යෝජකයින් සඳහා වඩාත් අවශ්‍ය සහන ලබාදෙමින් වසංගතයේ පළමු සහ දෙවැනි රැලි තුළ අධි අයකිරීම් කපාහරින ලදී.

නිවසේ සිට වැඩකිරීමේ, සංකල්පය යොදා ගනු ලැබූ අතර බාධා රහිත සේවා ලබාදීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය වෙත අවශ්‍ය ලැප්ටොප් සහ ටැබ් ලබාදීම ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. අපගේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල තුළ දායක මුදල්, ආපසු ගෙවීම් සහ ප්‍රතිලාභ හිමිකම් ලබාදීම සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින්, සේවකයින් වටමාරු සේවා මුර පදනමක් මත කටයුතු කරන ලදී. සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා මණ්ඩලය වෙහි සමස්ත කාර්ය මණ්ඩලයට ප්‍රවාහනය සපයන ලදී. බලාත්මක කිරීම සහ වෙනත් ක්ෂේත්‍ර පදනම් කටයුතු සීමා විය.

ඩිජිටල් අනාගතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය භාරකරුවෙක් හා අරමුදල් කළමනාකරුවෙක් ලෙස අසමසම ආයතනික ව්‍යුහයක් තුළ වර්තමානයේ ක්‍රියාත්මක වන අතර, එහි ප්‍රධාන සහ සහය ක්‍රියාවලි ඩිජිටල්කරණය තුළින් අනාගතයට සූදානම් මූල්‍ය ආයතනයක් බවට පත්වන බව ස්ථිරය. අපගේ අපේක්ෂාවක් වන සහ රජයේ ඊ-පාලන වැඩසටහනට සමගාමීව කඩදාසි රහිත පරිසරයක් කරා දීර්ඝ කාලීන පරිවර්තනය මණ්ඩලය අපේක්ෂා කරයි. මණ්ඩලය මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝපිතායතනයෙන් (ICTA) තාක්ෂණික සහ මූල්‍ය සහය ලබාගනී.

පසුගිය වසර දෙක තුළ ඉක්මණින් වෙනස්වන ව්‍යාපාරික වාතාවරණය නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල වටිනාකම ඉස්මතු කරන ලදී. සේවා යෝජක දායකත්වයන්, ආපසු ගෙවීමේ හිමිකම් සහ ප්‍රතිලාභ හිමිකම් කාර්යක්ෂමව පිරිසැකසුම් කිරීම සඳහා සාමාජිකයින්ගේ පළපුරුද්ද අගය කරන සාමාජික-කේන්ද්‍රීය තොරතුරු පද්ධති සහ ද්වාරයක් දියත් කිරීමේ ක්‍රියාවලිය තුළ අප නියැලි සිටී. මෙම මේඝ පදනම් යෙදුම අපගේ කණ්ඩායමට දුරස්ථව වැඩ කිරීමට පවා පහසුකම් සපයන අතර ඒ මගින් අනාගතය තුළ ඇතිවිය හැකි යම් අභියෝගාත්මක හදිසි අවශ්‍යතාව තුළින් සේවා මට්ටම් පවත්වා ගැනීමට ද හැකිවේ.

2020 වසර තුළ, සෘජු බැර පහසුකම මත අපි ස්ථිර ප්‍රගතිය ලබාගත් අතර වඩා විශාල පාරිභෝගික අංශය තුළ ආසන්න වශයෙන් සේවා යෝජකයින් 500ක් ලියාපදිංචි කිරීමේ පරමාර්ථය අප හඹායමින් සිටිමු. වසර තුළ හඳුන්වා දෙන ලද ඉ-ගෙවීමේ පහසුකම් අපගේ විශාල දායකයින්ගෙන් වඩා වේගවත් වර්ධනයකට දායක විය.

අපගේ මානව සම්පත්

වසර තුළ පැවති තත්ත්වයන්, ඵලදායී සහ අනුවර්තනය කළ හැකි කණ්ඩායම්වල මෙන්ම ශක්තිමත් පාලන භාවිතයන්ගේ තීරණාත්මක වැදගත්කම අවධාරණය කරයි. ඇත්ත වශයෙන්ම රජය, ජනතාව සහ සංවිධාන අප "නව සාමාන්‍යය" වැලඳ ගන්නේ කෙසේද යන්න යළි නිර්වචනය කිරීමට අරගල කරන බැවින්, ශක්තිමත් ප්‍රතිපත්ති රාමු කාලීන අවශ්‍යතාවලට ගැලපෙන පරිදි නම්‍යශීලී වීම අවශ්‍ය විය. මෙම කාලයන් අපට උගන්වා ඇත්තේ වම නීතිරීති සහ ප්‍රතිපත්ති මේ දක්වා පමණක් අපව ගෙන යා හැකි බවත් වම නීති රීති කොන්දේසිවලට ගැලපෙන ලෙස අර්ථකථනය කළ හැකි නිවැරදි පුද්ගලයන් සිටීම වඩාත් වැදගත් වන බවත්ය. වසර තුළදී, මෙම නැගී එන වර්ධනයන් අනුව කඩිසර බව සහතික කිරීම කෙරෙහි මණ්ඩලය අවධානය යොමු කළේය.

ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ පුහුණුව සහ සංවර්ධනය තුළින් නව දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමට සහ අපගේ දැනට සිටින කණ්ඩායමේ දැනුම, කුසලතා සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අපි පියවර ගෙන ඇත. අපගේ කණ්ඩායම් සවිබල ගැන්වීම සහ අමතර තීක්ෂ්ණ බුද්ධිය සහ තාක්ෂණය ගෙන වීම අපගේ සේවා අත්දැකීම තවදුරටත් ඉහළ නැංවීමට හැකියාව ඇති කරනු ඇත. සමාලෝචිත වර්ෂය තුළ, අපගේ සේවකයින්ට කාර්ය මණ්ඩල ණය සඳහා පූර්ණ වේතන සහ ණය විලම්භන කාලසීමා පහසුකම් ද ලබා දෙන ලදී.

සම්මාන සහ පිළිගැනීම්

මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2019 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ රාජ්‍ය අංශයේ සංගමය වන, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් 'ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා' යන කාණ්ඩය යටතේ අඛණ්ඩව දෙවන වසර සඳහා රන් සම්මානයෙන් පිදුම් ලැබ ඇත. මෙම සම්මානය තුළින් විනිවිදභාවය, වගවීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ අපගේ කැපවීම පිළිබිඹු කරයි.

ඉදිරි මඟ

මණ්ඩලය විසින් ඉදිරි වසර පහ සඳහා ප්‍රධාන සහ උපකාරක කටයුතු සම්බන්ධයෙන් උපාය මාර්ගික දිශාවක් අපේක්ෂා කරයි. එය මෙහෙයුම්වල සම්පූර්ණ ඩිජිටල්කරණය, ලාභයේ වර්ධනය සහ ආයෝජන කළඹ සහ රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට සහාය දක්වන අතරම කාර්යක්ෂම සහ සාමාජික කේන්ද්‍රීය අත්දැකීමක් ලබා දීම ඇතුළත් ප්‍රධාන බෙදාහැරීම් සකස් කර ඇත. වර්තමානයේ, අපි ආයතනික වෙබ් අඩවිය වඩාත් තොරතුරු සහ අන්තර් ක්‍රියාකාරී ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටිමු, එමඟින් අපගේ සේවා යෝජකයින්ට සහ සාමාජිකයින්ට සබැඳි සේවා පරාසයකට ප්‍රවේශය ලබා දේ.

අපි අපගේ සාමාජිකයින් වෙනුවෙන් කැපවී සිටින අතර, අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබා දීමට අපි දිගටම කටයුතු කරන්නෙමු. අපගේ අරමුණු වන්නේ මූල්‍ය සහ ආයෝජනවල සහභාගී වීම තුළින් සේවක හිමිකාරිත්වය, සුභසාධනය සහ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සහ සේවකයින්ට විශ්‍රාම ගැනීමෙන් පසු දායක නොවන ප්‍රතිලාභ ලබා දීමයි. අප සේවය කරන සාමාජිකයින්ගේ ඉරණම සමඟ අවියෝජනීය ලෙස බැඳී ඇති සංවිධානයක් ලෙස, ස්ථාවර වටිනාකමක් ලබා දීම සඳහා අරමුදල් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමේ ගැඹුරු වගකීම අපව මෙහෙයවනු ලබයි.

අගයකිරීම්

මිලියන ගණනක් සාමාජිකයින් සමඟ, කොවිඩ් -19 වසංගතයෙන් රට යථා තත්ත්වයට පත් කිරීමේදී මණ්ඩලය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. සාමාජිකයින්ගේ විශ්‍රාම අරමුදල් කළමනාකරණය කිරීමේදී අප කෙරෙහි තබා ඇති ඔවුන්ගේ අචල විශ්වාසය සහ පැහැදීම වෙනුවෙන් ඔවුන් වෙත මගේ අවංක ප්‍රශංසාව පිරිනැමීමට කැමැත්තෙමි. අපගේ කැපවූ සහ අභිප්‍රේරිත කණ්ඩායම ආදර්ශමත් සේවාවක් ලබා දීම සඳහා අභියෝගවලට මුහුණ දුන් අතර මම ඔවුන්ට නොමසුරුව ස්තූතිවන්ත වෙමි. කණ්ඩායමට, ඔවුන්ගේ බැඳීම සහ කැපවීම වෙනුවෙන් මගේ අවංක අගය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ලබාදුන් සහයෝගය වෙනුවෙන් ගරු මුදල් ඇමතිතුමාට මාගේ අවංක ස්තුතිය පුදකරමි. අභියෝගාත්මක වසරක සංකීර්ණතා හරහා ඉදිරියට ගමන් කිරීමට අප වෙත ලබා දුන් නොමසුරු මග පෙන්වීම සහ සහයෝගීතාව පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පුද කර සිටිමි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ සගයන්ගේ ඥානාන්විත උපදෙස් සහ උපාය මාර්ගික මඟ පෙන්වීම සඳහා මම මගේ ප්‍රශංසාව ප්‍රකාශ කරමි. සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් නිසා රටේ දෙවන විශාලතම විශ්‍රාමික අරමුදල වීමට සරිලන පරිදි අපේක්ෂාවන් සාර්ථකව ඉටු කිරීමට අපට හැකි විය.

(අත්සන් කළේ.)
ශ්‍රියාන් ද සිල්වා විජයරත්න
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

ආයෝජන අංශය

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය (මණ්ඩලය) ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදීම පිණිස එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ. ආදායම් ප්‍රකාශය, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, පිටු අංක 66 සිට 95 දක්වා සාධාරණ සහතිකයක් ලබාදෙන ආකාරයකින් සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

ගෝලීය ආර්ථිකයේ තත්ත්වය සහ ශ්‍රී ලංකාව තුළ පැවති ආර්ථික සහ පොදු සෞඛ්‍ය පරිසරය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කාර්යසාධනය කෙරෙහි සෘජු බලපෑමක් තිබුණි. ඉදිරි පිටුවලදී, 2020 වසර තුළ පැවති විකී සාර්ව සහ ක්ෂුද්‍ර ආර්ථික තත්ත්වයන්ගේ සන්දර්භය තුළ අපගේ කටයුතු පිළිබඳ සමාලෝචනයක් අපි ඉදිරිපත් කරමු.

ගෝලීය ආර්ථිකයේ පහතවැටීමේ බලපෑම ශ්‍රී ලංකාවේ ආර්ථික කෙරෙහි අතීශය ප්‍රබල බලපෑමක් තිබී ඇත. පුළුල්ව බලන කළ, මෙවැනි බලපෑම් අපගේ මූල්‍ය සහ ශ්‍රම වෙළෙඳපොල කෙරෙහි සහ අපගේ මෙහෙයුම් කෙරෙහි මෙන්ම සාමාජික අරමුදල් රැස්කිරීම කෙරෙහි ද දෝංකාරය ඇති කරන ලදී. ගෝලීය පසුබැසීමේ තත්ත්වයන් සහ පොළී අනුපාතවල ඇතිවූ පහළ වැටීම අපගේ අරමුදල් ආයෝජනය මත ප්‍රතිලාභවලට ද බලපා ඇත.



ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් 1995 අංක 16 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන පනතින් නීතිගත කළ පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත.

ඉහත අවශ්‍යතාවන්ට අනුකූල වෙමින්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන්

ශ්‍රී ලංකාවේ ආර්ථික කාර්ය සාධනය



ශ්‍රී ලංකා ආර්ථිකය 2019 දී අත්කරගත් 2.3%ක වර්ධනය අනුපාතයට සාපේක්ෂව 2020 දී 3.6% කින් හැකිළී ඇත. සියලුම ප්‍රධාන ආර්ථික අංශ වසර තුළ පහත වැටීමකට මුහුණ දුන්හ.

2020 දී එක් පුද්ගලයෙකුට දළ දේශීය නිෂ්පාදිතය පිළිවෙලින් 2019 පැවති රු. 688,573 (ඇ.ඒ.ඩො. 3,852)ට වෙනස්ව රු. 683,106 (ඇ.ඒ.ඩො. 3,682)ක් වියහැකි බවට තක්සේරු කරන ලදී.

රුපියල් අනුව එක් පුද්ගලයෙකුට දළ දේශීය නිෂ්පාදිතය පහත වැටීම ප්‍රධාන වශයෙන් වර්තමාන මිලගණන්වලට දළ දේශීය නිෂ්පාදිතය තුළ හැකිලීම හේතු විය. ඇමෙරිකානු ඩොලර් දළ දේශීය නිෂ්පාදිතය පහත වැටීම වර්තමාන මිලගණන් තුළ දළ දේශීය නිෂ්පාදිතයේ හැකිලීම සහ වාර්ෂික සාමාන්‍ය පදනමක් මත ගැනීමේදී ඇමෙරිකානු ඩොලරයට අනුව රුපියල දුර්වලවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

බාහිර අංශය

බාහිර ඉපයීම් 2019 මට්ටම්වල සිට 15.9%කින් 2020 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 10 දක්වා පහත වැටී ඇත. 2019 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 6.7හි පැවති සංචාරක ආදායම 2020 දී ඇමෙරිකානු ඩොලර් 0.7 දක්වා පහත වැටුණි. එසේම, ප්‍රවාහන අංශයේ ආදායම 2019 දී පැවති ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 සිට 2020 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2 දක්වා පහත වැටුණි. 2019 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 6.7 හි පැවති සේවක ප්‍රේෂණ 2020 තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 7.1 දක්වා වැඩිවිය.

ආනයන මත වියදම 2019 දී පැවති ඇමෙරිකානු ඩොලර් බිලියන 19.9ට සාපේක්ෂව 2020 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 16 දක්වා 19.5කින් පහත වැටුණි. මෙම පහත වැටීම අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන පිළිබඳ රජයේ සීමාකිරීම්, ගෝලීය සැපයුම් දාමයේ බිඳවැටීම් හා බැඳුණු අඩු වූ ආර්ථික කටයුතුවලට සම්බන්ධ අතරමැදි භාණ්ඩවල අඩු වූ ආනයනය සහ ගෝලීය වෙළෙඳපොල තුළ අඩු මිළගණන්වල ශුද්ධ ප්‍රතිඵලයකි. රජයේ ආනයන අඩු කිරීමේ ක්‍රියාමාර්ග වෙළෙඳ පරතරය අඩුකිරීමට හේතු වුවත්, එය ආර්ථික කටයුතු කෙරෙහි බලපෑම් නිර්මාණය කරන ලදී.

බාහිර වර්තන ගිණුමේ හිඟය 2019 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8ට සාපේක්ෂව 2020 දී ඇමෙරිකානු ඩොලර් බිලියන 1.1දක්වා පටු විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වර්තන ගිණුමේ හිඟය පසුගිය වසර තුළ පැවති 2.2%ට සාපේක්ෂව 2020 දී 1.3 දී පැවතියේය.

අංශමය කාර්යසාධනය

ප්‍රධාන ධාවකයෙක් වන ඉදිකිරීම් අංශයේ හැකිලීමත් සමඟ 2019 වසරේ දී 2.6% ක වර්ධනයට සාපේක්ෂව, කාර්මික අංශය 6.9% කින් හැකිලී ගියේය. කෘෂිකාර්මික අංශය පසුගිය වසරේ ලබා ගත් 1.0% ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී 2.4% ක පසුබෑමක් වාර්තා කළේය.

2020 දී ජාතික නිෂ්පාදන නිමැවුමෙන් 58.7% ක් සඳහා දායක වූ සේවා අංශය, 2019 දී 2.2% ක වර්ධනයට සාපේක්ෂව 2020 දී 1.5% ක හැකිලීමක් අත්විඳින ලදී. මෙය වසංගතය අතරතුර ඩිජිටල් අවකාශ සහ සන්නිවේදන සඳහා වැඩි වූ ඉල්ලුමට හේතු වූ තොරතුරු තාක්ෂණ වැඩසටහන්කරණය සහ විදුලි සන්නිවේදනය වැනි උප අංශවල වැඩිවීමක් විය. ප්‍රවාහනය, නවාතැන්, ආහාර පාන සේවා කටයුතු ඇතුළු සංචාරක ආශ්‍රිත සේවාවන්ට ගෝලීය සහ දේශීය සංචාරක සීමා කිරීම් සහ අගුලු දැමීම් හේතුවෙන් දැඩි ලෙස බාධා ඇති වූ අතර, සේවා අංශයේ සෘණ වර්ධන වේගයට බොහෝ දුරට දායක විය.

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොල



ශ්‍රම බලකාය

මි. 8.592 (2019)

මි. 8.467 (2020)



ආර්ථිකමය ලෙස අක්‍රීය ජනතාව

මි. 7.832 (2019)

මි. 8.273 (2020)



ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය

මි. 52.3 (2019)

මි. 50.6 (2020)



සේවයේ නියුතු ජනතාව

මි. 8.181 (2019)

මි. 7.999 (2020)



විරැකියා අනුපාතය

4.8% (2019)

5.5% (2020)



විදේශ රැකියා නියුක්තිය

203,087 (2019)

53,713 (2020)

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කටයුතු

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අංශ, ඒවායේ කාර්යයන්, සහ ආයතනික ව්‍යුහය මෙම වාර්තාවේ පිටු අංක 10 සිට 12 දක්වා විස්තර කර ඇත.

ආයෝජන කටයුතු සහ ආයෝජන වාතාවරණය

ශ්‍රී ලංකාවේ තත්ත්වය

ශ්‍රී ලංකාවේ පළමු කොවිඩ් -19 රැල්ල මාර්තු මාසයේදී මතු වූ අතර, දෙවන රැල්ල 2020 නොවැම්බර් මාසයේදී මතු විය. මෙම අවස්ථා දෙකේදීම රට සති ගණනක් අගුලු දමා තිබුණි. ගෝලීය සංචරණ සීමා කිරීම් සමඟ අගුලු දැමීම් සංචාරක කර්මාන්තය, ඇඟලුම් සහ කාර්මික අපනයන වැනි විදේශ විනිමය උපයන ප්‍රධාන අංශවලට අහිතකර ලෙස බලපෑවේය. තවද, ශ්‍රී ලංකාවේ රන්පවුම් ශ්‍රේණිගත කිරීම පහත හෙළීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මූලික වශයෙන් අභ්‍යන්තර අරමුදල් මත යැපීමට රටට බල කෙරුනි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) 2020 වර්ෂය තුළ ණය ගැනීමේ පිරිවැය අඩු කිරීම සඳහා පොලී අනුපාත අඩු කිරීමට පියවර ගන්නා ලදී. මෙය අපගේ ආයෝජන කටයුතු සහ කාර්යසාධනය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කළේය.

පොළී අනුපාත

එක්සත් ජනපද ෆෙඩරල් සංවිතය සහ අනෙකුත් ප්‍රධාන මහ බැංකු 2020 දී ඔවුන්ගේ පොලී අනුපාත පහළට සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව එහි වර්ධනය, ප්‍රකෘතිය සහ ස්ථාවරත්වය කේන්ද්‍ර කරගත් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයේ කොටසක් ලෙස එය අනුගමනය කළේය. මෙහි අපේක්ෂාව වූයේ බැංකුවල ණය වර්ධනය පුළුල් කිරීම, පවතින ව්‍යාපාර මෙහෙයුම්වලට සහාය වීම සහ රැකියා මට්ටම් ආරක්ෂා කිරීම මෙන්ම රජයේ ණය ගැනීමේ පිරිවැය ද අඩු කිරීම යි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 දී ප්‍රතිපත්ති පොලී අනුපාත පස් වතාවක් මුළු පදනම් ලකුණු 250 කින් අඩු කළ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 5% සිට 2% දක්වා සියයට 3 කින් අඩු කළේය. බැංකු අනුපාතිකය 15% සිට 8.5% දක්වා පදනම් ලකුණු 650 කින් අඩු කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම් (SDF) අනුපාතිකය, නිත්‍ය ණය පහසුකම් (SLF) අනුපාතිකය සහ SRR ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතවල වෙනස්වීම් පහත වගුවේ දක්වා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොළී අනුපාතවල වෙනස්වීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

මහබැංකුවේ කටයුතු වෙළෙඳපොල ද්‍රවශීලතාවය වැඩි කළේය. වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාරික අංශයට කාරක ප්‍රාග්ධනය සැපයීම සඳහා වූ ඉහළ සහනදායී ණය යෝජනා ක්‍රම සමඟින් ඇතැම් ණය අනුපාත අඩු කිරීම සහ උකස් පදනම් නිවාස ණය මත උපරිම මට්ටම් පැනවීම යන සියල්ලම පොලී අනුපාතවල පහළ යාමකට දායක වූ අතර, සමහර වෙළෙඳපොළ අනුපාත චෛතිහාසික අවම මට්ටම් කරා ළඟා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසර අවසන් වන විට පුද්ගලික අංශයට ලබා දෙන සමස්ත ණය ප්‍රසාරණයට හේතු විය. රාජ්‍ය අංශයට ලබා දෙන ණය වසර තුළ සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, අඩු පොලී අනුපාත අඩුම පිරිවැයට රජයේ අරමුදල් සැපයීමට පහසුකම් සැලසීය.

2020 වසර තුළ චෛතිහාසික පහළ මට්ටමේ පොලී අනුපාත, මිණුම් ලකුණු පොලී අනුපාතිකය වන මාස 12 භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයේ දැඩි පහත වැටීමේ ප්‍රවණතාවය තුළ මෙය පැහැදිලිව දක්නට ලැබේ. ඒ අනුව, 2020 වසර තුළදී සෑම අවස්ථාවකම රජයේ සුරුකුම්පත්වල ඉපයීම් පදනම් ලකුණු 226 - 414 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. එම ප්‍රවනතාව අනුගමනය කරමින් වාණිජ බැංකුවල සාමාන්‍ය බරතබන ලද තැන්පතු අනුපාතය (AWDR) ද 2019 දී පැවති 8.20% සිට 2020 දී 5.8% දක්වා පහත වැටී ඇත.

2020 වසර තුළ භාණ්ඩාගාර බිල්පත් අනුපාත ප්‍රවනතාව

2020 වසර තුළ මාස 12 භාණ්ඩාගාර බිල්පත් අනුපාතයේ විතැන්වීම්



ආයෝජන උපාය මාර්ගය

ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ආයෝජනවලට අදාළ ආරක්ෂාව, ප්‍රතිලාභ සහ ද්‍රවශීලතාවය යන ප්‍රධාන මූලධර්ම තුන යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව, අරමුදල ප්‍රධාන වශයෙන් රජයේ සුරුකුම්පත් ඇතුළත් ස්ථාවර ආදායම් සුරුකුම්පත්වල ආයෝජනය කරයි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 අවසානයේ දී රුපියල් බිලියන 258 ක් වූ රජයේ බැඳුම්කර දැරීම 2020 අවසන් වන විට රුපියල් බිලියන 297 දක්වා වැඩි විය. වඩා පුළුල් වත්කම් වෙන් කිරීමේ උපාය මාර්ගය පරිදි, මණ්ඩලය ස්ථාවර ආදායම් සුරුකුම්පත්වල 94% ට නොඅඩු ආයෝජනයක් කළ යුතු අතර, කොටස් ආයෝජනවල 6% ට වඩා වැඩි නොවිය යුතුය. ඒ අනුව, මණ්ඩලය 2020 වසර අවසන් වන විට ස්ථාවර ආදායම් සුරුකුම්පත්වල 97% ක් සහ ස්කන්ධවල 3% ක් ආයෝජනය කර තිබුණි. රජයේ බැඳුම්කර ස්ථාවර ආදායම් හිමිකමෙන් බහුතරයක් වේ.

කළඹ තුළනය කිරීම





අරමුදල 2020 අවසානයේ දී රුපියල් මිලියන 359,719 ක් වූ ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ප්‍රධාන වශයෙන් ආයෝජනය කර ඇත. මෙම කොටසෙහි ප්‍රධාන දිගුකාලීන ආයෝජනය වූයේ රජයේ බැඳුම්කර වන අතර, එය දැඩි ආර්ථික තත්ත්වයන් යටතේ රජයේ අරමුදල් අවශ්‍යතා පසුරාලමින් 2020 අවසානයේ දී, රුපියල් මිලියන 258,372 සිට රුපියල් මිලියන 297,027 දක්වා වැඩි විය. 2020 අවසානයේ දී ස්කන්ධ කළඹේ වටිනාකම රුපියල් මිලියන 11,040 ක් ලෙස වාර්තා විය.

ස්ථාවර ආදායම් ආයෝජන

ඉහත සඳහන් කළ පරිදි, අරමුදලේ ආරක්ෂාව සහතික කරමින්, ස්ථාවර ආදායම් ආයෝජන 2020 අවසානයේ මුළු අරමුදල් ආයෝජනවලින් 97% ට සමාන විය. එබැවින්, අරමුදලේ කාර්යසාධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය ලෙස වෙළෙඳපොළ පොලී අනුපාත පැවතුණි.

2020 දෙවන අර්ධය තුළදී, බැඳුම්කර වෙළෙඳපොලේ සහ වාණිජ බැංකුවල තැන්පතු මත පොලී අනුපාත පහත වැටීමේ ප්‍රවණතාවයෙන් පසුව ආයෝජන ආදායම සැලකිය යුතු ලෙස අඩු විය. ප්‍රාථමික වෙන්දේසිවල උපරිම ඉපයීම් ද පහත වැටුනි. කෙසේ වෙතත්, රජයේ බැඳුම්කරවල විවිධ කාල සීමාවන්හි ආයෝජනය කිරීමෙන් සහ රජයේ අරමුදල් තුළනය කිරීමෙන් බලපෑම අවම කර ගැනීමට මණ්ඩලය සමත් විය.

2020/12/31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම් පිළිබඳ විස්තර

පරිණත කාලය	ක්ෂය කළ පිරිවැය (රු. 000)	ප්‍රතිශතය
0 - 1	13,651,748	5%
1 - 5	155,470,671	52%
5 - 10	103,691,880	35%
10 <	24,212,800	8%
එකතුව	297,027,099	100%

ස්කන්ධ ආයෝජන

අරමුදල් ආයෝජනවලින් 97% ක් ස්ථාවර ආදායම් වත්කම්වල වූ බැවින්, අරමුදල ඉතිරි 3% ස්කන්ධ වෙළෙඳපොළෙහි ආයෝජනය කර ඇත. අපගේ ස්කන්ධ කළඹ, ද්‍රවශීලතාවය, අබණ්ඩ ලාභාංශ, ප්‍රාග්ධන ලාභය සහ අස්ථාවර වෙළෙඳපොල තත්ත්වයන් යටතේ වුවද ස්ථාවර ඉපැයීම් වර්ධනය සහතික කිරීම සඳහා S&P 20 දර්ශකය කවුන්ටරවලට ප්‍රධාන වශයෙන් නිරාවරණය වේ.

ස්කන්ධ ආයෝජන සිත් ඇදගන්නා ලාභාංශයක් උත්පාදනය කිරීමට උපකාරී වූ අතර, 2019 වර්ෂයේදී ජනනය කරන ලද රුපියල් මිලියන 494ට වඩා 74% ක වර්ධනයක් වාර්තා කරමින් 2020 වසර තුළදී රුපියල් මිලියන 858 ක ප්‍රාග්ධන ලාභයක් ලබා ගැනීමට හැකි විය.

අභියෝගාත්මක වෙළෙඳපොළ තත්ත්වයන් තුළ මෙය සාක්ෂාත් කර ගන්නා ලදී. S&P SL 20 දර්ශකය 10.18%ක සෘණ ප්‍රතිලාභයක් වාර්තා කරමින් 2020 ජනවාරි මාසයේ 2,937 සිට 2020 අවසානය වන විට 2,638 දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, එම කාලසීමාව තුළ, කවුන්ටර කිහිපයක් හේතුවෙන් සමස්ත කොටස් දර්ශකය 6,129 සිට 6,774 දක්වා වර්ධනය විය. 2020 වසර තුළ විදේශීය ශුද්ධ පිටතට ගලායාම රුපියල් මිලියන 51,356 ක් වූ අතර, ඉන් ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළ පිළිබඳ විශ්වාසය නොමැතිකම සහ බාහිර පීඩනය හේතුවෙන් ප්‍රධාන ව්‍යවහාර මුදල් අනුව ශ්‍රී ලංකා රුපියලෙහි අපේක්ෂිත සීෂ්‍ර අවප්‍රමාණය පෙන්නුම් කරයි. කොවිඩ් -19 හි ආරම්භක රැල්ල අතරතුර 2020 මාර්තු සිට මැයි දක්වා කොළඹ කොටස් වෙළෙඳපොල (CSE) වසා දැමීම කොටස් වෙළෙඳපොලේ කාර්යසාධනයට ද බලපෑවේය.

ස්ථාවර සහ ස්කන්ධ වෙළෙඳපොළ යන දෙකටම බලපාන විභවයන් සහ සාධක ප්‍රවේශමෙන් නිරීක්ෂණය කිරීමෙන් මිශ්‍ර වෙළෙඳපොළ කාර්යසාධනයේ ප්‍රතිලාභ ලබා ගැනීමට මණ්ඩලය සමත් විය. උද්ධමන අපේක්ෂාව ඉහළ යාමෙන් පසු අනුපාත වැඩි වීමක් අපි අපේක්ෂා කළෙමු. අපගේ ආයෝජන තීරණ ගැනීමේදී නැගී එන නව ප්‍රභේද සහිත කොවිඩ් -19 හි සීෂ්‍ර ව්‍යාප්තියත් සමඟ මතු වූ අනාගත අවිනිශ්චිතතාවයන් අපි සමීපව නිරීක්ෂණය කළෙමු.

ආයෝජන කොටස

මණ්ඩලයේ මුළු ආයෝජන කළඹ 2019 අවසානයට පැවති රු.මිලියන 334,862 සිට 2020 අවසානයට රු. මිලියන 370,758 දක්වා ඉහළ ගිය අතර, එය 11%ක වැඩිවීමකි.

සේ.නි.භා. අ.සාමාජික අරමුදල් වර්ධනය



මෑත වර්ෂ තුළ අත්කරගත් වර්ධනය සමඟ මෙය අනුරූප වේ.

වසංගතය තුළ ආයෝජනය කිරීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අපගේ ආයෝජන කටයුතුවල පැවති අභියෝගාත්මක තත්ත්වයන් සහ අවිනිශ්චිතතාවයන් තුළ ක්‍රියාත්මක කිරීමට සිදු විය.ආයෝජන කණ්ඩායමට රජයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් සමහර අවස්ථාවලදී මාර්ගගත අවකාශයන් භාවිතා කරමින් විකල්පයක් ලෙස නිවසේ සිට වැඩ කිරීමට සිදු විය. මෙම මෙහෙයුම් අභියෝග හමුවේ, අපගේ දෛනික මෙහෙයුම් බාධා රහිතව අබණ්ඩව ගෙනයාමට අපි සමත් වූ අතර, අපගේ කණ්ඩායමේ බැඳීම සහ කැපවීම හේතුවෙන් ඉහළ මට්ටමේ

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

කාර්යසාධනයක් පවත්වා ගැනීමට ද අපට හැකි විය.

අනාගත දැක්ම

2021 වසර තුළ සහ ඉන් ඉදිරියට, අරමුදල් ආයෝජනයේ ආරක්ෂාව, ප්‍රතිලාභ සහ ද්‍රවශීලතාව පිළිබඳ මූලධර්ම අනුගමනය කරමින් අපගේ ආයෝජන කටයුතු අපි ඉදිරියට ගෙන යන්නෙමු. ස්ථාවර ආදායම සහ ස්කන්ධ වෙළෙඳපොල සහ අදාළ සාධකවල කාර්යසාධනය සමීපව නියාමනය කිරීම අපි තවදුරටත් සිදු කරන්නෙමු.

2021 අගෝස්තු මාසය තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව SDF අනුපාතය 5%දක්වා සහ SLF අනුපාතය 6% දක්වා වැඩි කරමින් ප්‍රතිපත්ති අනුපාත පදනම් ලකුණු 50 කින් වැඩි කරන ලදී. එමෙන්ම මහ බැංකුව 2021 සැප්තැම්බර් වරාය නගරයේ මෙහෙයුම් ආරම්භ කිරීම සහ ඉන් ඇති වන නව විදේශීය සෘජු ආයෝජන ඉදිරි වර්ෂවල ශ්‍රී ලංකාවේ උපකාරී ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කරනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකය සහ රැකියා වර්ධනය වඩා පුළුල් මට්ටමකින් අරමුදල මත වර්ධනය සඳහා වඩා වැඩි අවස්ථා විවෘත කරනු ඇත.

දායක මුදල් එකතු කිරීම සහ සේවා යෝජක සම්බන්ධතා

ප්‍රමාද වූ දායක මුදල් මත අයබදු සහ අධිභාර එකතු කිරීම ඇතුළුව සේවා යෝජක දායක මුදල් කාලීනව එකතු කිරීම සහ අනුකූලතාව සඳහා මණ්ඩලයේ දායක මුදල් එකතු කිරීම සහ සේවා යෝජක සම්බන්ධතා අංශය වගකිව යුතුය.

යෝජකයින් අතර පැහැදිලි විෂමතාවක් ඇත. මෙම 600,000කට ආසන්න පරතරය සියලුම සේවකයින් ලියාපදිංචි කිරීමෙන් පමණක් අවසන් කරනු ලැබිය හැකිය. 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ විධිවිධානවලින් සේවා යෝජකයින් ස්ථිර සේවකයින්ගෙන් පමණක් නොව, අනියම් සේවකයින්, කොන්ත්‍රාත් සේවකයින්, කෑලි අනුව ගෙවන සේවකයින්, දෛනික වැටුප් ගෙවන සේවකයින් ද මෙම ක්‍රමයට ඇතුළත් කර ඔවුන් වෙනුවෙන් සේවකයින්ගේ මූලික වැටුපෙන් 3%ක් දායකවීම අත්‍යවශ්‍ය බවට නියම කර ඇත.

■ **දායක වී ඇති සේවා යෝජකයින් අතර අනුකූලතා අනුපාතය.** සාමාජිකත්ව ප්‍රතිලාභ මාස 12ක කාලසීමාවක් පුරා ඔවුන් වෙනුවෙන් මණ්ඩලයට අබණ්ඩව දායක වී

	2019 දෙසැම්බර් 31	2020 දී අළුත්	2020 වසර තුළ ඉවත් වූ	2020 දෙසැම්බර් 31	වෙනස%
සේවා යෝජකයින්					
මුළු සාමාජිකයින්	2,800,000	480,000	600,000	2,680,000	(4.2%)
සක්‍රීය සේවායෝජකයින්*	83,777	4,851	12,897	75,731	(9.3%)
ETF සාමාජිකයින්					
සාමාජිකයින් (සක්‍රීය සහ දායක මුදල් ගෙවන සේවා යෝජක නියෝජනය)	2,800,000	480,000	600,000	2,680,000	(4.2%)
ස්වයං-රැකියා සාමාජිකයින් සක්‍රීය ප්‍රමාද	41,989	476	598	41,867	(0.029%)
සංක්‍රමණ සේවක සාමාජිකයින්	231	4	15	220	(4.76%)

1 දින සිට 4% දක්වා පදනම් ලකුණු 200 කින් SRR වැඩි කරන ලදී. මෙම ප්‍රතිපත්ති තීරණ පොළී අනුපාත පහළයාම සඳහා උපකාරී පරිසරයක් නිර්මාණය කළේය. අපේක්ෂිත සැලකියයුතු අයවැය හිඟයන්ගෙන් කොටසක් අභ්‍යන්තරව අරමුදල් සපයනු ලැබේ. එමනිසා, මධ්‍ය කාලයේ සිට දිගුකාලය දක්වා විවිධ ආයෝජන නිෂ්පාදන තුළ ආයෝජනය කරමින් සහ ස්ථාවර ආදායම් සුරැකුම්පත්වලට වැඩි බර තබමින් මෙම තත්ත්වයේ සම්පූර්ණ වාසිය මණ්ඩලය ලබාගත යුතුව ඇත.

කොවිඩ් -19 වසංගතය අඩුකිරීම සඳහා එන්නත් කිරීමේ වැඩසටහන වේගයෙන් ක්‍රියාත්මක කිරීමත් සමඟ, ආර්ථික වර්ධනය මත ඉක්මන් ප්‍රතිසාධනයක් ආර්ථිකය අපේක්ෂා කෙරේ. සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රතිසාධනය, එමෙන්ම මෙම අංශය සේවා යෝජක දැනුවත් කිරීමේ කටයුතු සහ ස්වයං -රැකියාලාභීන් අතර මණ්ඩලයේ සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ද වගකීමට බැඳී සිටී.

මෙම අංශය මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛා ජාලය සමඟ ඉලක්කවලට අනුව සහ පහත සඳහන් ප්‍රධාන කාර්යසාධන දර්ශක සපුරාලීම පිණිස ක්‍රියාත්මක වේ.

■ **අනුකූල සේවා යෝජක සංඛ්‍යාව** ශ්‍රී ලංකාවේ සමස්ත සේවයේ නියුතු ජනගහනය ආවරණය කිරීම පිණිස වැඩිකර ගැනීමට අවශ්‍ය වී ඇත. කම්කරු දෙපාර්තමේන්තුව සහ මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව සේවයේ නියුතු සංඛ්‍යාව සහ ඔවුන් වෙනුවෙන් මණ්ඩලය වෙත දායක වන සේවා ඇති සේවකයින් සඳහා පමණක් ලබා දේ. එබැවින්, අපගේ කාර්යයන් සේවා යෝජකයින් ETF දායකත්වයන් අබණ්ඩව සිදු කරන බව තහවුරු කිරීම සොයා ගැනීම දක්වා දිවයයි.

■ **ශාඛා අයකිරීම තවත් එක් ප්‍රධාන මාත්‍රිකයකි. මින් ප්‍රමාද වීම,** පැහැර හැරීම සහ දායක නොවන සේවා යෝජකයින්ගෙන් ETF අයකිරීම් ගෙවීම් මට්ටම් සඳහන් කරයි.

වසංගතයට පෙර, සුදුසු සේවා යෝජකයින් ලියාපදිංචි කිරීම සහ දැනටමත් ලියාපදිංචි සේවා යෝජකයින් තුළ අනුකූලතාවය සහතික කිරීමේ අරමුණ සඳහා ශාඛා ජාලය විසින් සේවා යෝජකයින් 40,000 සහ 45,000 අතර ප්‍රමාණයක් වාර්ෂිකව පරීක්ෂා කිරීම් මණ්ඩලයේ ශාඛා විසින් සිදු කර ඇත. ක්‍රමානුකූලව, මෙයින්

70%ක් පමණ පැහැර හරින සේවා යෝජකයින් වෙති. සැම වසරකම, 3,000ක පමණ නව සේවා යෝජකයින් ලියාපදිංචි කෙරේ.

අඟුලු දැමීම හේතුවෙන්, 2020 මාර්තුවලින් පසු සේවා යෝජක පරීක්ෂා කිරීම් කිසිවක් පවත්වා නොමැත. 7,989ක් පරීක්ෂණ වසර තුළ සිදු කර ඇත. කෙසේවෙතත්, විද්‍යුත් තැපැල් යවමින්, දුරකථන ඇමතුම් ලබා දෙමින් සහ අයකරගැනීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටිවලට අනුකූලව ගෙවීම් නියෝග යවමින් ප්‍රමාද වූ සේවා යෝජකයින්ගෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් අපි කටයුතු කර ඇත.

සාමාජික සේවා අංශය

සාමාජික සේවා අංශය සාමාජික හිමිකම් පිරිසැකසුම සහ ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රම දහය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමට බැඳී සිටී. මෙම අංශය සාමාජික ගිණුම් යාවත් කිරීම, වාර්ෂික සමාජික ප්‍රකාශ නිකුත් කිරීම සහ වෙන් නොකළ සාමාජික ගිණුම් නිශ්කාෂණය කිරීමේ වගකීම ද දරනු ලබයි.

සාමාජික හිමිකම් පිරිසැකසුම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2020 දී ආපසු ගෙවීමේ හිමිකම් 157,790ක් අවසන් කරන ලද අතර, රු.බිලියන 14.8ක

	2019 දෙසැම්බර් 31	2020 දී අළුත්	2020 වසර තුළ ඉවත් වූ
ආපසු ගෙවීමේ හිමිකම්			
වැඩ අවසන් කළ සාමාජික හිමිකම් සංඛ්‍යාව	157,790	196,382	-19.65%
ගෙවූ මුදල (රු.බි.)	18.4	19.7	-6.6%
සාමාජික සේවා වියදම			
සක්‍රීය			
ප්‍රමාද	27,295	46,943	-42%
සාමාජික ප්‍රතිලාභ(රු.'000)	44,868	46,320	-11%

මුළු මුදලක් ගෙවන ලදී. මෙයට තුලනාත්මකව 2019 වසරේ ආපසු ගෙවීමේ හිමිකම්196,382 ක් වූ අතර ගෙවීම් රු.බිලියන 19.7ක් විය.

2020 මාස 10ක් අපගේ මෙහෙයුම්වලට බාධා වූ කොවිඩ් -19 වසංගතය හමුවේ, අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කැපී පෙනෙන උත්සාහයන් සහ බැඳීමට ස්තූතිවන්නට අපගේ සාමාජිකයින් වෙත විශිෂ්ඨ සේවාවක් ලබාදීමට අපට හැකි විය.

අපගේ මෙහෙයුම් කෙරෙහි බලපානලද බිඳවැටීමේ ප්‍රමාණය කොතෙක්ද යන්න පෙර කාලසීමාව තුළ පවත්වාගත් මට්ටම්වල සිට 2020 දී අපගේ සාමාජික සේවා වියදම්වල 42%ක පහත බැසීම තුළ පිළිබිඹු වේ.

සාමාජික ප්‍රතිලාභ

අපගේ සාමාජිකයින්ගේ සුභසාධනය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රමුඛතාවයකි. 1986 සිට, අපගේ සාමාජිකයින් සඳහා විවිධ ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ අපි එකතු කර ඇත. වර්තමානයේ, ආපසු ගෙවීමේ හිමිකම් ගෙවීම් මත අපගේ සාමාජිකයින්ට මූල්‍ය සහය පිරිනමන ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ දහයක් මණ්ඩලයේ සාමාජිකයින් භුක්ති විඳිති.

ETF සාමාජිකයින් සඳහා ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය		
ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (ආරම්භක වසර)	2020 ප්‍රතිලාභීන් (ගණන) ප්‍රතිලාභ (රු. මි.)	2019 ප්‍රතිලාභීන් (ගණන) ප්‍රතිලාභ (රු. මි.)
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (1986)	951 93,943	1,119 110,494
නිත්‍ය දුබලතා යෝජනා ක්‍රමය (1989)	64 10,807	71 11,881
හෘද සැත්කම් සඳහා මූල්‍ය සහය (1991)	405 108,058	636 173,125
අභ්‍යන්තර අක්ෂි කාච පිරිවැය ප්‍රතිපූරණය (1992)	සාමාජිකයින් 219 2,939	සාමාජිකයින් 310 4,058
පහ වසර ශිෂ්‍යත්ව සහය යෝජනා ක්‍රමය (1994) සමඟ නිත්‍ය දුබලතා හේතුවෙන් සේවය අවසන් වූ සාමාජිකයින්ගේ ළමුන් (2010)	සිසුන් 6,317 94,755	සිසුන් 6,048 90,720
"ශ්‍රම සුව රැකවරණය" රෝහල්ගත කිරීමේ වෛද්‍ය යෝජනා ක්‍රමය (1997)	සාමාජිකයින් 795 6,696	සාමාජිකයින් 1,087 9,812
"වියන" නිවාස ණය යෝජනා ක්‍රමය (2002 ජූනි)	94 192,574	18 38,910
වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්මය සඳහා මූල්‍ය සහය (2006)	සාමාජිකයින් 12 3,085	සාමාජිකයින් 20 5,708
අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්වූ ETF සාමාජිකයින්ගේ ළමුන් සඳහා උසස් අධ්‍යාපනික ශිෂ්‍යත්ව (2010 සිට)	සිසුන් 953 11,436	සිසුන් 6,001 72,012
ගෙවූ මුළු ව්‍යවස්ථාපිත නොවන සාමාජික ප්‍රතිලාභ	405,396	454,714

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

2020 දී හෘද සැත්කම, වකුගඩු බද්ධ කිරීම, අභ්‍යන්තර අක්ෂි කාච පිරිවැය ප්‍රතිපූරණය සහ නිත්‍ය දුබලතා සඳහා හිමිකම්, මරණ ප්‍රතිලාභ සඳහා සහ ශ්‍රම සුව රැකවරණය යටතේ ලබාදෙන ලද මූල්‍ය සහය රු.මි. 225 කි.

එක් එක් ETF සාමාජිකයින් වෙත සෘජුව දෙන ලද ප්‍රතිලාභවලට අමතරව, සාමාජිකයින්ගේ ළමුන් සඳහා අපි ප්‍රතිලාභ පිරිනමමු. වාර්ෂිකව, 5 වසර ශිෂ්‍යත්ව විභාගය සහ අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගය සමත් අය සඳහා මූල්‍ය ප්‍රතිලාභ පිරිනමමින් සාමාජිකයින්ගේ ළමුන්ගේ අධ්‍යාපනික ජයග්‍රහනයන් අපි සමරමු.

2020 වසර තුළ, පහ වසර ශිෂ්‍යත්වලාභීන් 6,317ක් සඳහා ප්‍රතිලාභ ලෙස රු.මි. 95ක මුදලක් ගෙවන ලදී. 2020 අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගය වසංගතය හේතුවෙන් ප්‍රමාද විය. විභාගය සමත් වූ සිසුන් සඳහා ප්‍රතිලාභ අයදුම්පත් මෙය ලියන අවස්ථාවේදී (2021 අගෝස්තු) කැඳවමින් සිටී.



5 වසර ශිෂ්‍යත්ව චෙක්පත අගමැති වෙත භාරදීම -



උසස් පෙළ ශිෂ්‍යත්ව චෙක්පත මහජන බැංකුව වෙත භාරදීම -

සාමාජික ගිණුම් පවත්වාගෙනයාම

වසර අවසානයේදී අරමුදල සමඟ පැවති සක්‍රිය සහ අක්‍රිය මුළු ගිණුම් සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 16.4ක් වූ අතර, එය 2020 වසර අවසානය වන විට සාමාජික ගිණුම්වලින් 98%ක් යාවත් කර තිබුණි. මෙම සාමාජික ගිණුම්වලින්, මිලියන 13.7 ක ගිණුම් අක්‍රිය ලෙස වාර්තා කර තිබුණු අතර, මිලියන 2.7ක සාමාජික ගිණුම් සක්‍රිය ලෙස පැවතුනි. සක්‍රිය ගිණුම් සඳහා වාර්ෂික සාමාජික ප්‍රකාශන සමාලෝචිත වසර තුළ අදාළ සේවා යෝජකයින් වෙත නිකුත් කර ඇත.

ඉදිරි ගමන්මඟ

සේවක නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා අපි සමාජික කේන්ද්‍රීය බිහිදොරක් දියත් කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටිමු. වැඩිදුර විස්තර මෙම වාර්තාවේ තොරතුරු තාක්ෂණ කොටස තුළ දක්වේ.

අපගේ සේවා යෝජකයින්

2020 අවසානයට, සේවක නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින් 996ක් සිටි අතර, එය නව බඳවාගැනීම්, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම් සහ රැකියාවේ වෙනස්වීම් හේතු කොට ගෙන 2019 පැවති 1040 ට වඩා සුළු වෙනස්වීමකි.

ස්ත්‍රීපුරුෂභාවය අනුව සේවකයින්

සේවක නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින්ගේ පිරිමින්ට කාන්තා අනුපාතය 2020 අවසානයට 51:49ක් විය.

පිරිමි / කාන්තා විශ්ලේෂණය

පිරිමි	කාන්තා	එකතුව
503	493	996
51%	49%	100%

මට්ටම	රැකියා ශ්‍රේණිය	පිරිමි	කාන්තා	එකතුව
ජ්‍යේෂ්ඨ	සාමාන්‍යාධිකාරී	1	-	1
	අතිරේක සාමාන්‍යාධිකාරී	1	-	1
	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	4	-	4
	සහකාර සාමාන්‍යාධිකාරී	5	2	7
	කළමනාකරු	24	21	45
	එකතුව	35	23	58
තෘතීක	කණිෂ්ඨ කළමනාකරු	36	36	72
	කළමනාකරණ සහකාර 4	82	106	188
	එකතුව	118	142	260
ද්විතීක	කළමනාකරණ සහකාර 2-2	-	1	1
	කළමනාකරණ සහකාර 1-2	210	301	511
	එකතුව	210	302	512
ප්‍රාථමික	ප්‍රාථමික මට්ටම	140	26	166
	එකතුව	140	26	166
මුළු එකතුව		503	493	996

වයස අනුව සේවකයින්

වයස අනුව සේවකයින් (2020.12.31 දිනට)		
වයස පරාශය (අවුරුදු)	එකතුව	
21-25	37	4%
26-30	133	13%
31-35	140	14%
36-40	163	16%
41-45	93	9%
46-50	138	14%
51-55	157	16%
55 ට ඉහළ	135	14%
එකතුව	996	100%

රැකියා ශ්‍රේණිය අනුව සේවකයින්

	රැකියා ශ්‍රේණිය	එකතුව	ප්‍රතිශතය
ජ්‍යේෂ්ඨ	සාමාන්‍යාධිකාරී	1	5.82%
	අතිරේක සාමාන්‍යාධිකාරී	1	
	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	4	
	සහකාර සාමාන්‍යාධිකාරී	7	
	කළමනාකරු	45	
	එකතුව	58	5.82%
තෘතීක	කණිෂ්ඨ කළමනාකරු	72	7.23%
	කළමනාකරණ සහකාර 4	188	18.88%
	එකතුව	260	26.10%
ද්විතීක	කළමනාකරණ සහකාර 2-2	1	0.10%
	කළමනාකරණ සහකාර 1-2	511	51.31%
	එකතුව	512	51.41%
ප්‍රාථමික	ප්‍රාථමික මට්ටම	166	16.67%
	එකතුව	166	16.67%
මුළු එකතුව		996	100.00%

ස්ථානය අනුව සේවකයින්

ETF මණ්ඩලයේ සේවකයින් 996 න් 615ක් ප්‍රධාන කාර්යාලයට පදනම් වන අතර, සේවකයින් 381ක් ශාඛා ජාලය හරහා විහිදී සිටී.

ස්ථානය අනුව සේවකයින්



ප්‍රධාන කාර්යාලය	**615**
ශාඛා ජාලය	**381**
එකතුව	**996**

සේවක කටයුතු වල නියැලීම













විස්තරය	විධායක	විධායක නොවන	එකතුව
විශ්‍රාම ගැනීම	14	28	42
බඳවා ගැනීම	1	0	1
උසස්වීම්	15	0	15

සේවක ස්ථානමාරු

සේවකයින් විසින් ඔවුන්ගේ පහසුව සඳහා සිදුකළ ඉල්ලීම් මත 2020 වසර තුළ ස්ථාන මාරු කිහිපයක් සිදුකරන ලදී.

වැටුප් හා ප්‍රතිලාභ

මණ්ඩලයේ සියලුම සේවකයින් ස්ථිර පදනම මත වේ. ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවකයින් ලෙස, ඔවුන්ගේ මූලික වැටුපට අමතරව ඔවුන්

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

ප්‍රතිලාභ ගණනාවක් සඳහා හිමිකම් ලබයි. වසංගතය තුළ සේවකයින්ගේ වැටුප් සහ ප්‍රතිලාභවල කිසිදු වෙනසක් වී නොමැත.

	2020 රු.	2019 රු.	වෙනස %
වැටුප්	572,151	537,959	6%
ජීවන වියදම් දීමනාව	93,817	96,312	-3%
ආහාර දීමනාව	11,337	3,880	192%
අතීකාල	13,528	25,505	-47%
නිවාඩු දින වැටුප්	5,517	14,039	-61%
	696,350	677,695	3%

ප්‍රතිලාභ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින් සේවකයින් වෙත පිරිනමන ප්‍රතිලාභ ගණනාවක් සඳහා සුදුසුකම් ලබයි. මේවාට ශ්‍රේණිය පදනම් දිරිදීමනා, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණ පහසුකම්, වාර්ෂික ප්‍රසාද දීමනා, විවිධ ණය වර්ග, උසස් අධ්‍යාපනික සුදුසුකම් සඳහා වැටුප් වර්ධක ණය සහ සේවකයාගේ ස්ථිර අබාධිතතාව හෝ මරණය සඳහා වන්දි ගෙවීම ඇතුළත්ය.

	2020 රු.	2019 රු.	වෙනස %
දිරිදීමනා	121,686	145,504	-16%
නිල ඇඳුම් සහ මැසීමේ පිරිවැය	17,417	16,489	6%
විශ්‍රාමික විශේෂ ප්‍රසාද දීමනාව	6,040	3,627	67%
තේ සහ වෙනත් කාර්ය මණ්ඩල සුභසාධන වියදම	8,059	11,423	-29%
නිවාඩු මුදල් කිරීම	25,015	18,146	38%
වාර්ෂික ප්‍රසාද දීමනා	108,744	102,395	6%
වෛද්‍ය වියදම ප්‍රතිපූරණය	91,057	103,109	-12%
නිවාස ණය මත පොළිය	10,481	14,142	-26%
පොළී පිරිවැය	26,523	22,277	19%
වර්තමාන සේවා පිරිවැය	12,862	10,889	18%
සේ.අ.අ.	104,867	100,245	5%
සේ.නි.හා.අ.	20,991	20,056	5%
දුරකථන බිල්පත් ප්‍රතිපූරණය	5,652	2,566	120%
එකතුව	559,395	570,868	-2%

දිරිදීමනා

ශ්‍රේණිය අනුව පදනමක් මත ලබාදෙන ලද දිරිදීමනාවලට මාසික පදනමක් මත ගෙවනු ලබන පැමිණීමේ සහ කාර්යසාධන දිරිදීමනා ද ඇතුළත් වේ.

වෛද්‍ය පහසුකම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින්ගේ වෛද්‍ය පහසුකම්වලට පහත දෑ ඇතුළත්ය:

- එක් සේවකයෙක් සඳහා රු. 60,000.00 දක්වා වාර්ෂික බාහිර රෝහී අංශයේ (OPD) වෛද්‍ය ප්‍රතිපූරණය
- එක් සේවකයෙක් සඳහා රු. 100,000.00 දක්වා වාර්ෂික රෝහල්ගත කිරීම ප්‍රතිපූරණය

වාර්ෂික ප්‍රසාද දීමනා

දෙසැම්බර් මාසයේදී ගෙවූ වාර්ෂික දිරිදීමනා ජීවන වියදම් දීමනාව සහිත මාස දෙකක මූලික වැටුපට සමාන වේ.

ණය

විශේෂ ණය

ණය මුදල	රු 100,000.00
ආපසු ගෙවන කාලසීමාව	වාරික 60
පොළිය	වාර්ෂිකව 4.2%

නිවාස ණය

උපරිම ණය මුදල	රු 3,000,000.00
ආපසු ගෙවන කාලසීමාව	වසර 25 හෝ අවුරුදු 60 සම්පූර්ණවීම
පොළිය	1 වැනි 2,000,000 සඳහා වාර්ෂිකව 4.2%
	ඉතිරි 1,000,000 සඳහා වාර්ෂිකව 7.0%

වාහන ණය

ඕනෑම සේවකයෙකුට පාපැදි ණය සමඟ මෝටර් රථයක්, ත්‍රිරෝද රථයක් සහ මොටර් සයිකලය යන වර්ගීකරණයන්ගෙන් එක් ණයක් ලබාගත හැකිය.

මෝටර් රථ ණය	ණය මුදල	රු. 1,250,000.00 (MA 1-2 සහ පහළ)
		රු. 2,500,000.00 (MA 4 සහ ඉහළ)
	ආපසු ගෙවන කාලසීමාව	අවුරුදු 15
	පොළිය	වාර්ෂිකව 4.2%
ත්‍රිරෝද රථ ණය	ණය මුදල	රු. 900,000.00
	ආපසු ගෙවන කාලසීමාව	අවුරුදු 15
	පොළිය	වාර්ෂිකව 4.2%
මොටර් සයිකල් ණය	ණය මුදල	රු. 500,000.00
	ආපසු ගෙවන කාලසීමාව	අවුරුදු 10
	පොළිය	වාර්ෂිකව 4.2%
පාපැදි ණය	ණය මුදල	රු. 15,000.00
	ආපසු ගෙවන කාලසීමාව	වාරික 36
	පොළිය	වාර්ෂිකව 4.2%

ආපදා ණය

ණය මුදල	මූලික වැටුප+7,800 (ජීවන වියදම් දීමනාව) × මාස 12
ආපසු ගෙවන කාලසීමාව	වාරික 120
පොළිය	වාර්ෂිකව 4.2%

සේවකයාගේ ස්ථිර අබාධිතතාව හෝ මරණය සඳහා වන්දි ගෙවීම

සිදුවීම	ශ්‍රේණිය/තනතුර	වන්දි මුදල
සේවායෝජකගේ මරණය	සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ	1,500,000.00
	(ඉහළ කළමනාකරණය 2-1), (1-3), (1-1)	1,450,000.00
	මධ්‍යම කළමනාකරණය (1-3)	1,350,000.00
	කණිෂ්ඨ කළමනාකරු (1-1)	1,250,000.00
	කළමනාකරණ සහකාර (4)	1,125,000.00
	කළමනාකරණ සහකාර (2-2), (1-2)	1,000,000.00
	ප්‍රාථමික මට්ටම (1), (2), (3)	875,000.00

සිදුවීම	ශ්‍රේණිය/තනතුර	වන්දි මුදල
ස්ථිර අබාධිතතාව	සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ	1,750,000.00
	(ඉහළ කළමනාකරණය 2-1), (1-3), (1-1)	1,700,000.00
	මධ්‍යම කළමනාකරණය (1-3)	1,650,000.00
	කණිෂ්ඨ කළමනාකරු (1-1)	1,500,000.00
	කළමනාකරණ සහකාර (4)	1,350,000.00
	කළමනාකරණ සහකාර (2-2), (1-2)	1,200,000.00
	ප්‍රාථමික මට්ටම (1), (2), (3)	1,050,000.00

අතිරේක වැටුප් වර්ධක- උසස් අධ්‍යාපනික සුදුසුකම්

උසස් අධ්‍යාපනික සුදුසුකම් ලබා ගැනීම සඳහා අතිරේක වැටුප් වර්ධක ණය රැකියා ශ්‍රේණිය සහ ලබාගන්නා සුදුසුකම් මත පදනම් වී පිරිනමනු ලබයි.

රැකියා ශ්‍රේණිය	සුදුසුකම්	විශේෂ වැටුප් වර්ධක ගණන
කළමනාකරණ සහකාර (1-2) සහ (4)	ඩිප්ලෝමාව	01
	උපාධිය	02
	විද්‍යාපති	03
ඕනෑම ශ්‍රේණියක්	විද්‍යාපති	03

උසස් අධ්‍යාපනික සුදුසුකම් සඳහා වියදම ප්‍රතිපූරණය කිරීම

විෂය ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපනික ගාස්තුව යම් නියමයන් සහ කොන්දේසි සමඟ රු. 400,000/= දක්වා ප්‍රතිපූරණය කෙරේ

රු.	2020	2019
අධ්‍යාපනික ප්‍රතිපූරණය	1,582,375	2,614,127

කොවිඩ්-19 වසංගතයට මුහුණදීම

කොවිඩ් ආරක්ෂාව

වසංගතයේ මුල සිට, මණ්ඩලය පහත සඳහන් ක්‍රියාමාර්ග ඇතුළුව රජයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කළේය.

- සියලුම ETFB පරිශ්‍රවලට ඇතුළු වන කාර්ය මණ්ඩලයේ සහ පාරිභෝගිකයින්ගේ ශරීර උෂ්ණත්වය මැනීම.
- එක් එක් ETFB පරිශ්‍රයේ ප්‍රධාන දොරටුව ඉදිරිපිට සේදුම් බේසම් සවිකිරීම.
- පාරිභෝගික සේවා කාර්ය මණ්ඩලය සඳහා මුහුණු ආවරණ, අත්වැසුම් සහ මුහුණු නිවාරක සහ නඩත්තු කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂිත අත්වැසුම් ලබා දී ඇත.
- සියලුම ස්ථාන සඳහා අත් සනීපාරක්ෂක සපයන ලදී.
- බිම් ප්‍රදේශ ඇතුළුව කාර්යාල පරිශ්‍රයන් වරින් වර විෂබීජහරණය කිරීම.
- අමුත්තන්, සේවා යෝජකයින් සහ සාමාජිකයින් සමඟ සෘජුව සම්බන්ධ වන කාර්ය මණ්ඩලය සඳහා ස්ථාවර කොටස් සහ ආරක්ෂිත ආවරණ.

මෙයට අමතරව, 2020 වසර තුළ, මණ්ඩලය විසින් සියලුම සේවකයින් සඳහා පිරිසිදුකළ පානීය ජලය ලබාදීමේ ක්‍රම ස්ථාපිත කරන ලදී.

එන්නත් කිරීම්

2020 වසර තුළ එන්නත් කිරීම් ලබාගත නොහැකි වුවද, කොවිඩ් 19ට එරෙහිව අපගේ සියලුම සේවකයින් එන්නත් කරන බව සහතික කිරීම මානව සම්පත් අංශයේ ප්‍රමුඛතාවයකි. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් 75%ක් 2021 මැද වන විට සම්පූර්ණයෙන් එන්නත් කර තිබුණි.

වැඩ කිරීමේ රටාවල වෙනස්වීම්

තාක්ෂණික සීමාවන් සැලකිල්ලට ගනිමින් කළහැකි තරම් දුරකට, වසංගතය තුළ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ උපදෙස් සමඟ අනුකූලව අපගේ කාර්ය මණ්ඩලය නිවසේ සිට වැඩ කිරීම (WFH) සහ වටමාරු සේවා මුර ක්‍රමය දක්වා වෙනස් විය. මෙම සීමාකිරීම් සහ සංරෝධක 2020 මාර්තු ආරම්භයේ සිට පැවතුනි.

කළමනාකරණ රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, ප්‍රාදේශීය, අංශ සහ ශාඛා කාර්ය මණ්ඩලය සමඟ සන්නිවේදන මාර්ගගත අවකාශ මත පවත්වන ලදී.

වසංගතය ආශ්‍රිත වසාදැමීම් හේතුවෙන් සමහර සුභසාධන සහ පිරිසිදු කිරීමේ වියදම්වල සැලකියයුතු අඩුවීම් දක්නට ඇත.

	2020	2019	වෙනස %
තේ	3,689,148.00	7,262,839.00	(49%)
පිරිසිදු කිරීම	4,591,687.50	6,913,812.50	(34%)

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

නිවසේ සිට වැඩකිරීම සඳහා පහසුකම්

- ටැබ්ලට් පරිගණක. අගුලුදැමීම් කාලසීමා සහ වටමාරු වැඩ උපලේඛන තුළ නිවසේ සිට වැඩ කිරීම සඳහා සේවකයින්ට ටැබ්ලට් 130ක් අපි ලබාදුනිමු. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා මෙයට පෙර මිලදි ගෙන තිබූ මෙම ටැබ්ලට් ආපසු ගෙන නිවසේ සිට වැඩකරන සේවයින් වෙත ලබාදෙන ලදී.
- දත්ත ගාස්තු. නිවසේ සිට වැඩකරන කාලසීමාවන් තුළ සේවකයින් විසින් සිදුකරන වැඩ සඳහා දත්ත භාවිතා ගාස්තු අපි ප්‍රතිපූරණය කළෙමු.
- සංචරණ සීමා පැවති කාලසීමාවන් හි තමන්ට අයත් වාහනවල කාර්යාලය වෙත පැමිණි කාර්ය මණ්ඩලයට ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කරන ලදි.

2020 දී දරන ලද කොවිඩ් -19 ආශ්‍රිත වියදම්වලට පහත දෑ අතුළත් වේ:

	රු '000
පි. සි. ආර්. පිරිවැය	43
සනිපාරක්ෂණ පිරිවැය	1,145
කාර්ය මණ්ඩල ප්‍රවාහය පිරිවැය (කුලි ගාස්තු)	448
කාර්ය මණ්ඩල ඉන්ධන ප්‍රතිපූරණය	412
නිවසේ සිට වැඩ කිරීමේ පිරිවැය (ලැප්ටොප්)	4,152
ඉන්ධන වියදම්	
ඉන්ධන පිරිවැය	4,290
ඉන්ධන දිමනාව	3,879

දෛනික මානව සම්පත් කටයුතු

- 2020 වසර තුළ එදිනෙදා මානව සම්පත් කටයුතු කිහිපයක් අපි අඛණ්ඩව කරගෙන ගිය අතර එයට පහත දෑ අතුළත් වේ.
- අභ්‍යන්තර ශ්‍රේණි උසස්වීම්
- සේවකයින් සඳහා සේවක ණය ලබාදීම
- වෛද්‍ය ප්‍රතිපූර්ණ පහසුකම්
- මණ්ඩලයේ වාර්ෂික වත්කම් හරිවැරදි බැලීම සාමාන්‍ය පරිදි පවත්වා ඇත.
- විනයානුකූල ක්‍රියා චූදිත සේවකයින්ට විරුද්ධව පවත්වා ඇත.

පුහුණු සහ සංවර්ධනය

- කාර්යසාධන මට්ටම් වැඩි කිරීම සඳහා හැකියා ගොඩනැගීමේ පරමාර්ථය ඇතිව 2020 දී පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් 2020 දි වසංගතය සහ පනවන ලද අගුලු දැමීම් හේතුවෙන් නොපවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 දි පුහුණු සහ සංවර්ධනය තුළ ආයෝජනය 2019 දී පැවති රු. 3,597,000 ට සාපේක්ෂව 2020 දී රු. 1,992,000 දක්වා අඩුවිය.
- කෙසේවෙතත්, පුහුණු සැසි සීමිත ගණනක් මාර්ගගත අවකාශ තුළින් පවත්වන ලදී. ICTA ව්‍යාපෘති පුහුණු වැඩසටහන සාමාපික කේන්ද්‍රිය පද්ධතියට සංක්‍රාන්තිය ඇති කිරීම සඳහා සැලසුම්කළ පරිදි පවත්වන ලදී.

කාර්ය මණ්ඩලය ද බාහිර පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගි විය.

බාහිර පුහුණු වැඩසටහන්	සහභාගි වුවන් ගණන	සේවක වර්ගීකරණය	දින	රු.
සාර්ව පිස්කල් දළ විශ්ලේෂණය සහ මෑතකාලීන බදු වෙනස්වීම් පිළිබඳ සාරාංශය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	30.01.2020	2,500
Microsoft Power BI - එක් දින පුහුණු වැඩසටහන - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	31.01.2020	9,500
මූල්‍ය ප්‍රකාශ සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	2	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) කළමනාකරු (මුදල්)	07.02.2020	8,000
සමාජ ආරක්ෂණය පිළිබඳ පුහුණුව - UNICEF පදනම	1	කළමනාකරු (M/A - Lar. Cat)	10.02.2020 14.02.2020	නොමිලේ
රාජ්‍ය අංශය සඳහා මානව සම්පත, මතු බලාපොරොත්තු සහිත අනාගත කටයුතු - CIPM	6	සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන සහ මානව සම්පත්) කළමනාකරු (පරිපාලන සහ මානව සම්පත්) සහ තෝරාගත් කාර්ය මණ්ඩලය	11.02.2020	නොමිලේ
රාජ්‍ය සේවා විනය ක්‍රියාපටිපාටිය (3 දින පුහුණු වැඩසටහන) - මිලෝදා ආයතනය	2	නිති නිලධාරී සහකාර පරිපාලන නිලධාරී	2020 ජූලි 15-17	36,000
උසස් චික්ස්සෙල්. පුහුණු වැඩසටහන	30	තෝරාගත් කාර්ය මණ්ඩලය	2020 අගෝස්තු 17 සහ 21	213,820
ප්‍රසම්පාදන පුහුණුව - :ආයතනය* සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය	2	කළමනාකරණ සහකාර 12	මාස 4	50,000
මානව සම්පත් සායනය : කොවිඩ-19 හමුවේ මානව සම්පත් නැවත පිළිබිඹු කිරීම - CIPM		සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන සහ මානව සම්පත්)	05.12.2020	2,500
		සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන සහ මානව සම්පත්)		

මෙහෙවර පියෙස වෙත විතැන්වීම

2020 සැප්තැම්බර් ආරම්භයේදී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සියලුම මෙහෙයුම් සහ සහය අංශ මෙහෙවර පියෙස වෙත ගෙන යාමට අපට හැකි විය. 2021 අප්‍රේල් වන විට, කොළඹ 5 නාරාහේන්පිට මෙහෙවර පියෙසේ 19 සහ 23 මහල් වෙත සියලුම දෙනා ගෙන යමින් සමස්ත සංක්‍රාන්තිය අපි නිම කළෙමු. නව පරිශ්‍රයට වර්ග උඩි 50,000ක ප්‍රමාණයක් ඇති අතර, කාර්ය මණ්ඩලය සහ අපගේ අමුත්තන්ට වඩාත් නවීන, හාත්පස පැතිරුණ සේවා ස්ථානයක් ලබා දේ.

මෙයට පෙර මණ්ඩලයේ මෙහෙයුම් කම්කරු මහ ලේකම් කාර්යාලයේ ස්ථාන ගත වූ අතර, නාරාහේන්පිට වටා ගොඩනැගිලි 4ක විහිදී පැවතුනි. ඒවා සියල්ල එක් වහලක් යටට රැගෙන ඒම මණ්ඩලයේ මෙහෙයුම්වල ඵලදායිතාව ඉහළ නංවයි.





2020 සහ 2019 අතර පිරිවැය සන්සන්දනය

කුලී සහ බදු පිරිවැය. විතැන්වීමෙන් පසු බදු සහ කුලි පිරිවැයවල සැලකියයුතු වෙනසක් තිබුනද, දිගු කාලිනව අත්කරගත හැකි ඵලදායිතාව සහ වැඩි කළ සේවා තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ සාමාජිකයින්ට සාධාරණ ආයෝජනයක් ලබාදීමට අපට හැකිය. එමෙන්ම, එය ජාතියේ දෙවැනි විශාලතම සමාජ ආරක්ෂක අරමුදල වන මණ්ඩලයෙහි ප්‍රතිරූපය වැඩි කරනු ඇත.

සංක්‍රාන්තිය සහ වැඩකළ සීමිත දින ගණන හේතු කොට ගෙන, 2020 වසර තුළ, කොළඹ සඳහා විදුලි සහ ජල පිරිවැය කාර්යක්ෂමතාවන් සඳහා සාධාරණව ගැලපිය නොහැකිය.

තිරසාර ව්‍යාවසාය

කඩදාසි රහිත පරිසරය

මණ්ඩලයේ 2022 වසර වන විට එහි ප්‍රධාන කටයුතු සහ සහය කටයුතුවලදී කඩදාසි රහිත පරිසරයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පැහැදිලි උපායමාර්ගික දැක්මක් සහ ප්‍රවේශයක් යොදා ගෙන ඇත. ඩිජිටල්කරණ කටයුතු ඊ-පාලනය කරා ජාතික ගමන්මඟ සමඟ සමගාවීම ඉටු කරනු ලැබේ.

එහි අසමසම අවශ්‍යතාවන් හේතු කොට ගෙන, කඩදාසි රහිත පරිසරයක් සමඟ සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය තොරතුරු සහ සන්නිවේදන පද්ධතියක් වෙතට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මෙහෙයුම් ඩිජිටල්කරණය සංවර්ධනට කිරීම අවශ්‍යව ඇත. ව්‍යාපෘති සංවර්ධනය ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) තාක්ෂණික සහ මූල්‍යමය සහය සමඟ ක්‍රියාත්මක වේ. 2021 අගෝස්තු වන විට, මාදුකාංග සංවර්ධන ජීවන චක්‍ර නැවත කියවීම සහ පරිශීලක පිළිඟැනීමේ
පරීක්ෂණයෙන් 60%ක් අවසන් කර තිබුනි. පද්ධතියේ සමාන්තර මෙහෙයුම 2021 සැප්තැම්බර් ආරම්භ කර වසර පුරා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. කඩදාසි රහිත කාර්යාලය සමඟ සම්පූර්ණ පද්ධතිය 2022 වන විට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.

මානසිකව සංක්‍රාන්තිය සමඟ, මුද්‍රිත ලියවිලි භාවිතා කිරීමේ සම්ප්‍රදායික ක්‍රමය තුළ වැඩ කිරීම වෙනුවට ඩිජිටල් උපාංග භාවිතා කිරීමට අපගේ කාර්ය මණ්ඩලය පොළඹවමින් සහ දිරිගන්වමින් අපි සිටිමු.

කඩදාසි රහිත පරිසරයක් කරා සම්පූර්ණ සංක්‍රාන්තියට පෙර සහභාගි විය යුතු වෙනස්කම් කළමනාකරණ පුහුණුවීම්, රට වසා තැබීම හේතුවෙන් ප්‍රමාද වී ඇත. නමුත් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර සමගාමීව එය නිම කිරීම අවශ්‍යය.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

තොරතුරු තාක්ෂණය

තොරතුරු තාක්ෂණ අංශය මෘදුකාංග සංවර්ධනය සහ පද්ධති පරිපාලන අංශවලින් සමන්විත වේ. තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතිය පවත්වා ගැනීම වන අතර, මෙය වඩාත් සාමාජික කේන්ද්‍රීය ව්‍යවහාර නිර්මාණය කළ මෘදුකාංගයක් සමඟ ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාවලියක වර්තමානයේ නිරත වී සිටී.

මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීමේ මෙවැනි සහ අනෙකුත් මූලාරම්භයන් ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝපිතායතනය (ICTA) සමඟ සහයෝගිත්වයෙන් සිදු කෙරේ.

තොරතුරු තාක්ෂණ සහ යටිතල පහසුකම් ආයෝජන

2020 වසර තුළ සිදුකළ ආයෝජනයන්ට කොරෝනා වයිරස් වසංගතය තුළ නිවසේ සිට වැඩකිරීම සහ සිරිත් පරිදි සැලසුම්කළ ආයෝජන මගින් මණ්ඩලයේ මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට ඇතිකළ ක්‍රියාමාර්ග ඇතුළත්ය:

වසර තුළ තොරතුරු තාක්ෂණ ආයෝජන	පිරිවැය
නව ලැප්ටොප් 34	රු. 4,125,358
දුරස්ථ මාර්ගගත පුද්ගලික ජාලයේ (VPN) මෘදු සංකේත @ 2020 වසර තුළ මාසයක් සඳහා රු. 55,170.72	රු. 556,103
පහත ලක්ෂණ සමඟ Microsoft 365 සහයෝගිත්ව මෘදුකාංග • කාර්යාල යෙදුමේ වෙබ් සහ මොබයිල් අනුවාදය • විද්‍යුත් තැපෑල සහ දින දර්ශනය • කණ්ඩායම් වැඩ සහ සන්නිවේදනය • ගොනු ගබඩාකිරීම සහ හුවමාරු කර ගැනීම • ආරක්ෂාව සහ අනුකූලතාව	රු. 841,402

ආරක්ෂිත දුරස්ථ ප්‍රවේශය සමඟ සහයෝගිත්ව Microsoft 365 වසංගත අගුළුදැමීම් තුළ සහ වැඩ වටමාරු කාලසීමාවන් තුළ කාර්යාල වැඩ පවත්වා ගැනීම සඳහා ජාල ලබාගැනීමේ හැකියාව සහතික කරන ලදී.

තොරතුරු තාක්ෂණ ක්‍රියාපටිපාටි සංග්‍රහය

තොරතුරු තාක්ෂණ කාර්යයන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ක්‍රියාපටිපාටි සංග්‍රහය තුළ ලේඛනගත කළ ක්‍රියාපටිපාටිවලට අනුකූලව ඉටු කරනු ලැබේ.

උපස්ථ සහ දත්ත ආරක්ෂාව

උපස්ථ දෛනිකව සිදු කෙරේ. පද්ධති උපස්ථ සහ පරිශීලක පුස්තකාල එක් එක් මාසය අවසානයේදී උපස්ථ කෙරේ. මෙහෙවර පියෙසින් බාහිර ස්ථානයක් තුළ උපස්ථ ගබඩා කෙරේ.

ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම පිණිස ඕනෑම අවස්ථාවක දී මණ්ඩලය මාස දෙකක උපස්ථ රඳවා තබා ගනී.

තොරතුරු සන්නිවේදන තාක්ෂණ ජාලයේ ෆයර්වෝල් ආරක්ෂාව

සියලුම ශාඛා 8 IPVPN තාක්ෂණය හරහා ප්‍රධාන කාර්යාලයේ පද්ධතිය සමඟ සම්බන්ධ කෙරේ. අවශ්‍ය පරිදි කාර්යාලයේ හෝ නිවසේ සිට වැඩ කිරීමට සහ VPN හැකියාව ඇති කරයි. SLT කළමනාකරණය කරන ෆයර්වෝල් සමස්ත ජාලයම ආරක්ෂා කරයි.

පරිශීලක දැනුවත් කිරීම සහ පරිශීලක දැනුම බලාත්මක කිරීම ඉහළ නැංවීම සහ මුරපද ප්‍රතිපත්තිය බලාත්මක කිරීම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අනෙකුත් කාර්යයන් කිහිපයකි.

තොරතුරු තාක්ෂණ තුළ අනාගත සැලසුම්

නව සාමාජික කේන්ද්‍රීය තොරතුරු පද්ධතිය

අපි සාමාජික කේන්ද්‍රීය තොරතුරු පද්ධතියක් සහ ETF සඳහා ද්වාරයක් දියත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටිමු. පවතින දත්ත පද්ධතිය සේවා යෝජක කේන්ද්‍රීය වන අතර, අපගේ මූලික සම්බන්ධතාව ලෙස සේවායෝජකයා ඇත. මේ නිසා, සාමාජික ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීම ඇතුළුව සියලුම ක්‍රියාවලීන් සේවා නියුක්ත සංවිධානය හරහා ගලා යයි. සාමාජිකයින්ට ලියාපදිංචි විය හැකි වුවද, ඔවුන් සේවා යෝජකයෙකු හරහා පැමිණෙන තෙක් ඔවුන්ගේ ලියාපදිංචිය සක්‍රිය නොවේ. මෙය තවදුරටත් රැකියාවක් නොකරන අයට පවා එසේ වන අතර සාමාජිකයින්ට සහ ඔවුන්ගේ සේවා යෝජකයන්ට විශාල අපහසුතාවයක් ඇති කරයි.

වඩාත් සාමාජික හිතකාමී පද්ධතියක අවශ්‍යතාවය හඳුනා ගනිමින්, අපි ICTA හි තාක්ෂණික සහාය ඇතිව සාමාජික කේන්ද්‍රීය පද්ධතියක් කෙරෙහි පද්ධති සංවර්ධකයෙකු සමඟ වැඩ කරමින් සිටිමු. අපගේ මෙහෙයුම්වල සංකීර්ණ ස්වභාවය හේතුවෙන්, පද්ධතිය අභිරුචි ලෙස ගොඩනගා ගත යුතුය.

නව පද්ධතිය සමඟ, සේවකයින්ට සෘජුවම පද්ධතිය සමඟ ලියාපදිංචි වී ප්‍රකාශන සහ ඔවුන්ගේ වාර්ෂික ශේෂයන් පරීක්ෂා කළ හැකිය. ඔවුන්ගේ සේවා යෝජකයන් හරහා යාමේ කරදරයකින් තොරව ඔවුන්ට සෘජුවම සාමාජික ප්‍රතිලාභ සඳහා අයදුම් කළ හැකිය.

නව සාමාජික කේන්ද්‍රීය ක්‍රමය 2021 මාර්තු සිට මැයි දක්වා පැරණි ක්‍රමයට සමාන්තරව ක්‍රියාත්මක වනු ඇත. නව ක්‍රමය 2022 මැයි මාසයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

පද්ධති සහ වෙනස කළමනාකරණ පුහුණුව

නව තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් සිය වැඩ කටයුතු වලට බලපාන සියලුම ETF කාර්ය මණ්ඩලය සඳහා වය භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව අපි පුහුණු කටයුතු සිදු කරන්නෙමු. අපගේ සේවා යෝජක කේන්ද්‍රීය ක්‍රමයේ සිට නව සාමාජික කේන්ද්‍රීය ක්‍රමය දක්වා සංක්‍රමණය වීමට සහාය වීම සඳහා වෙනස් කළමණාකරණ පුහුණු කිහිපයක අවශ්‍යතාවය ද අපි අපේක්ෂා කරමු.

නව ETF වෙබ් අඩවිය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වත්මන් වෙබ් අඩවිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අපි නව, වඩාත් සාමාජික හිතකාමී වෙබ් අඩවියක් සඳහා වැඩ කරමින් සිටිමු. නව අඩවිය 2021 නොවැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතය.







නීති අංශය

නීති අංශය මණ්ඩලයේ සියලුම නීතිමය කටයුතු සඳහා උපදේශන සේවා ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන අතර, සහකාර සාමාන්‍යාධිකාරී (නීති) අධීක්ෂණය යටතේ ක්‍රියා කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස් කිරීම සහ සේවා යෝජක සබඳතා - C&ER) වෙත වාර්තා කරයි.

ප්‍රාදේශීය කාර්යාල ජාලය පිහිටුවීමෙන් පසුව, ප්‍රාදේශීය මට්ටමින් සියලුම නීතිමය කටයුතු භාර නීති නිලධාරීන් සමඟ අදාළ සියලුම නීතිමය කටයුතු විමධ්‍යගත කර ඇත. අනුකූලතා ක්‍රියාකාරකම් වලදී රැස් කිරීම සහ සේවා යෝජක සබඳතා වෙනුවෙන් ගොනු කරනු ලබන නඩු කටයුතු කිරීම සඳහා නීති අංශය අනෙකුත් අංශ සමඟ ක්‍රියාත්මක වේ.

මූල්‍ය අංශය

ආයතනික වාර්තාකරණය පිළිබඳ විශිෂ්ඨත්වය හඳුනා ගැනීම

මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2019 ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (APFASL) වාර්ෂික වාර්තා සම්මාන උළෙලේදී ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා කාණ්ඩය යටතේ අඛණ්ඩව දෙවන වසරටත් රන් සම්මානයක් සමඟින් පිළිගැනිණි. APFASL යනු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ යාන්ත්‍රණයයි. ආයතනික වාර්තාකරණය සහ මූල්‍ය හෙළිදරව් කිරීම් ක්ෂේත්‍රයේ විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පෙන්නුම් කළ රාජ්‍ය අංශයේ ආයතන මෙම සම්මානයෙන් පිදුම් ලබයි.



අභ්‍යන්තර විගණන අංශය

මණ්ඩලයෙහි අභ්‍යන්තර විගණන කාර්යය මෙහෙයවනු ලබන්නේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී වෙත සෘජුවම වාර්තා කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණනය) විසිනි. අභ්‍යන්තර විගණන අංශය මණ්ඩලයේ සියලුම පද්ධති සහ ක්‍රියාවලි පවත්වාගෙන යන බව සහතික කිරීමේ වගකීම දරයි.

දැනට පවතින විගණන විමර්ශනවල සොයාගැනීම් ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයේ විගණන කමිටුවට (BAC) නිතිපතා වාර්තා කරනු ලැබේ. අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහන් කරමින් විගණන සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ BAC වෙත ඉදිරිපත් කෙරේ.

මණ්ඩලයේ විගණන කමිටුවට විසින් මණ්ඩලයෙහි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වල විෂය පථය, ප්‍රමාණය සහ සඵලතාවය අධීක්ෂණය කර සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණන සැලැස්මට විරෙහිව විගණන ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ පිළිබඳ යාවත්කාලීන සමාලෝචනය කිරීම, සැලකිය යුතු විගණන සොයාගැනීම් සහ සම්පත් අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ පූර්වාරක්ෂාකාරී පියවර ගැනීමට ආයතනික කළමනාකාරිත්වයට උපදෙස් දීම මෙයට ඇතුළත් වේ.

අභ්‍යන්තර විගණන මණ්ඩලයෙහි ප්‍රාදේශීය කාර්යාල ජාලය ආවරණය වන පරිදි නිතිපතා ශාඛා පරීක්ෂා කිරීම් ද සිදු කරයි. මෙම ස්ථානීය පරීක්ෂා කිරීම් වලදී, ක්‍රියාවලි විගණන නිතිපතා පවත්වනු ලැබේ.





අධ්‍යක්ෂ මණ්ඩලය

1. ශ්‍රියාන් ද සිල්වා විජයරත්න මහතා

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

2. නීල් උමගිලිය මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

3. කේ.ඩී. රණසිංහ මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

4. ජූඩ් දිනාල් පීරිස් මහතා

අධ්‍යක්ෂ
ලංකා සේවානියුක්තිකයන්ගේ ෆෙඩරේෂණය විසින් පත් කරන ලදී

5. ආර්.ඒ.එල්. උදය කුමාර මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

6. එල්.එස්. දේවේන්ද්‍ර මහතා

අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

7. ඊ.ඒ. ඒකනායක මහත්මිය

අධ්‍යක්ෂ
වෙළෙඳ හා වාණිජ අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

8. ආරියසේන ගාල්ලගේ මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

9. ඩබ්ලිව් එම්. නුරජිත් සින්

අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත



ශ්‍රියාන් ද සිල්වා විජයරත්න මහතා

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය - විශේෂ උපාධිය (පළමු පෙළ)
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- එක්සත් ජනපදය සහ CGM හි කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ අධි සාමාජික

වෙනත් පත්කිරීම්

- හේමාස් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ හේමාස් කන්සියුමර් ලිමිටඩ් හී කළමනාකාර අධ්‍යක්ෂ

පසුගිය පත්කිරීම්

- සමූහ ප්‍රධාන විධායක නිලධාරී - අබාන්ස් පීඑල්සී
- ටී පේ ලංකා පීඑල්සී හි කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී (එස් ඇන්ඩ් පී ටොප් 20න් එකක් වූ අතර එය "බිලියන් -ඩොලර් සමාගම් යටතේ ආසියාවේ විශිෂ්ඨතම 200" ලෙස පෝර්බ්ස් ජයග්‍රහකයෙක් ලෙස ඔහුගේ රාජකාරී කාලය තුළ හඳුනා ගන්නා ලදී)
- Microsoft ශ්‍රී ලංකා සහ බංගලාදේශයේ දේශීය කළමනාකරු
- සන්ටෙල් ලිමිටඩ් හී අලෙවිකරණ හා විකුණුම් අධ්‍යක්ෂ
- නෙස්ලේ පීඑල්සී හී සන්නාම කළමනාකරු



නීල් උමගිලිය මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- එක්සත් ජනපදයේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ අධි සාමාජික
- බ්‍රිතාන්‍ය කළමනාකරණය ආයතනයේ සාමාජික

පසුගිය පත්කිරීම්

- ඩයල් ටෙක්ටයිල් ඉන්ඩස්ට්‍රිස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ
- ලංකා බැංකු සභාපති
- ශ්‍රී ලංකා මුදල් මණ්ඩල සාමාජික
- ICTA අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- NCED හි සාමාජික
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මණ්ඩල සාමාජික



කේ.ඩී. රණසිංහ මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය
- ඇමෙරිකා එක්සත් ජනපදයේ මිචිගන් රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

පසුගිය පත්කිරීම්

- ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති
- ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ (IMF), වොෂින්ටන් ඩී. සී.ල ඇමෙරිකා එක්සත් ජනපදය (බංගලාදේශය, භූතානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව නියෝජනය)
- එච්ඩීඑෆ්සී බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ
- ලංකා විදුලි බල මණ්ඩලයේ අධ්‍යක්ෂ
- වෙස්ට් කෝට් පවර් (පුද්ගලික) සමාගමේ සභාපති
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලය



ජූඩ් දිනාල් පීරිස් මහතා

අධ්‍යක්ෂ
ලංකා සේවානියුක්තිකයන්ගේ ෆෙඩරේෂණය විසින් පත් කරන ලදී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- යාන්ත්‍රික ඉංජිනේරු
- චික්සත් රාජධානියේ ලන්ඩන් ව්‍යාපාර පාසලෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

වෙනත් පත්කිරීම්

- ලංකා හාම්පුතුන්ගේ සංගමයේ සභා සාමාජික
- ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු



ආර්.ඒ.එල්. උදය කුමාර මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
- ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික
- ඇමෙරිකා චික්සත් ජනපදයේ ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයේදී ප්‍රාග්ධන වෙළෙඳපොල වැඩසටහන සාර්ථකව නිම කිරීම

වෙනත් පත්කිරීම්

- වර්තමානයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි
- APFA හි කළමනාකරණ මණ්ඩලයේ සාමාජික (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශය)
- රජයට අයත් පහත සඳහන් ව්‍යවසායන් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- සෙලින්දියා ආයෝජන සමාගම
- පොල් පර්යේෂණ ආයතනය
- කුරුණෑගල වැවිලි සමාගම
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
- බුද්ධ සාසන අරමුදල



එල්.එස්. දේවේන්ද්‍ර මහතා

අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- නීති උපාධිය
- චික්සත් රාජධානියේ කාර්මික සම්බන්ධතා පිළිබඳ ඩිප්ලෝමාව
- කම්කරු ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව (ජාත්‍යන්තර කම්කරු සංගමය, පිනීවා)
- පුහුණු ක්‍රමවේදය පිළිබඳ ඩිප්ලෝමාව (ජාත්‍යන්තර කම්කරු සංගමය, ටියුරින්)

වෙනත් පත්කිරීම්

- ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ මහා ලේකම්
- ජාත්‍යන්තර ප්‍රවාහන සේවකයින්ගේ සංගමයේ විධායක මණ්ඩලයේ සාමාජික
- දකුණු ආසියා කලාපීය වෘත්තීය සංගමයේ උප සභාපති

පසුගිය පත්කිරීම්

- ජාතික ගෙවීම් කොමිෂන් සභාවේ සාමාජික
- ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ
- ජාතික පුවත් සභාවේ සාමාජික
- ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජික
- ශ්‍රී ලංකා ෆෙඩරේෂනයේ සාමාජික

වෙනත් ජයග්‍රහණයන්

ජනාධිපති ජාතික සම්මානයේදී දේශබන්දු සම්මානයෙන් පිදුම් ලැබීම



ඊ.ඒ. ඒකනායක මහත්මිය

අධ්‍යක්ෂ
වෙළෙඳ හා වාණිජ අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී (ව්‍යාපාර සංඛ්‍යා ලේඛණ) පිළිබඳ උපාධිය
- කැලණිය විශ්ව විද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- මොරටුව විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (මෙහෙයුම් පර්යේෂණ) උපාධිය

වෙනත් පත්කිරීම්

- වෙළෙඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම්

පසුගිය පත්කිරීම්

- කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ



ආරියසේන ගාල්ලගේ මහතා

අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කොළඹ විශ්ව විද්‍යාලයෙන් LL.B. උපාධිය

වෙනත් පත්කිරීම්

- පොලොන්නරුව දිස්ත්‍රික් සිමාසහිත සමූපාකාර ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂ
- අවුරුදු 28ට වැඩි පළපුරුද්ද සමඟ ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක් ලෙස කටයුතු කිරීම

පසුගිය පත්කිරීම්

- මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂ
- උතුරු මැද පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති
- ජනතා පොහෝර සමාගමේ අධ්‍යක්ෂ
- පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ



ඩබ්ලිව් එම්. නුරජිත් සින්

අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

වර්තමාන පත්කිරීම්

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ප්‍රධාන කාර්යාලය) නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු (ආවරණ)
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- ශ්‍රී ලංකා පොදුජන ප්‍රවාහන සේවක සංගමයේ සභාපති

ආයතනික කළමනාකරණාකාරීත්වය





සාමාන්‍යාධිකාරී

1. ඩී.පී.ජී. ප්‍රනාන්දු මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු

2. ඒ ජේ එම් එස් ජයසුන්දර මහතා
3. කේ එස් වැලිවිට මහතා
4. උදය වික්‍රමනායක මහතා
5. ජී.ඒ.එස්. සුමනසේන මහත්මිය
6. ඩබ්ලිව් ජී කේ රත්නායක මහතා

සහකාර සාමාන්‍යාධිකාරීවරු

7. එම් ඒ කේ අලුත්ගමගේ මහතා
8. ජේ කේ පී රංජිත් මහතා
9. පී එල් අයි සී පී අල්විස් මහත්මිය
10. වී එන් ජයරත්න මහත්මිය
11. කේ ජී එන් රත්නායක මහතා
12. එච් එම් ඒ ජේ කුමාර මහතා
13. පුෂ්පරංග වීරසේකර මහතා
14. එච් ජී ඩී එන් ප්‍රසන්න මහතා



ඩී.පී.සී. ප්‍රනාන්දු මහතා
සාමාන්‍යාධිකාරී

නිපුනතාව සහ පළපරුද්ද

- ප්‍රමුඛ පෙලේ 'Big 4'ගණකාධිකාරී ආයතනයක විගණනය සහ සහතික කිරීම පිළිබඳ පළපුරුද්ද.
- නිෂ්පාදනය, වෙළෙඳාම, දේපල සංවර්ධනය, මෝටර් රථ සහ විවේකය යන විවිධ කර්මාන්ත තුළ වසර 25කට වැඩි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
- ප්‍රාදේශීය මට්ටමේ නව ව්‍යාපාර සංවර්ධනයට නිරාවරණය සමඟ වර්ධනය සහ පුළුල්කිරීම සඳහා ව්‍යාපාර පරිවර්තනය කරමින් ශක්තිමත් මඟක වාර්තාවක් ඇතිව ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි විශාල සම්පිණ්ඩනයන් හී මූල්‍ය සහ උපායමාර්ගික කළමනාකරණය තුළ ජ්‍යේෂ්ඨ තනතුරු දැරීම.
- කටාර් සහ මාලදිවයිනේ විශාල සම්පිණ්ඩනයන් හී පරිපාලිත සමාගම්වල විධායක නොවන අධ්‍යක්ෂවරයෙක්/ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කිරීම.
- ගණකාධිකරණය සහ තොරතුරු තාක්ෂණයට අදාළ වෘත්තීය තුළ සම්පත් දායකයෙක් වෙමින් ජාත්‍යන්තර ආයෝජක මණ්ඩල පැවැත්වීම තුළ නිරාවරණය.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන (විශේෂ ගෞරව) විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික
- ඕස්ට්‍රේලියාවේ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ අධි සාමාජික
- බ්‍රිටිස් පරිගණක සමාජයේ අධි සාමාජික, චක්සත් රාජධානිය (FBCS)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ අධි සාමාජික
- වරලත් සහතික ලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික, චක්සත් රාජධානිය



ඒ ජේ එම් එස් ජයසුන්දර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දායක මුදල් එකතු කිරීම හා සේවා යෝජක සම්බන්ධතා)
2021.10.09 දින විශ්‍රාම ගන්නා ලදී

නිපුනතාව සහ පළපරුද්ද

- ප්‍රාදේශීය කළමනාකර ලෙස 1999දී මණ්ඩලය හා එකතු විය. (බදුල්ල, හැටන්,මහනුවර,කෑගල්ල සහ කුරුණෑගල පිහිටි ප්‍රාදේශීය කාර්යාලවල සේවය කර ඇත)
- බදුල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ මෙයට පෙර සේවය කර ඇත.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය
- වයඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- කාම්හෝජයේ තාක්ෂණය පිළිබඳ IIC විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය



කේ එස් වැලිවිට මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අභ්‍යන්තර විගණනය)

නිපුනතාව සහ පළපරුද්ද

- පුද්ගලික හා රාජ්‍ය අංශයේ සංවිධානවල මූල්‍ය සහ විගණනය පිළිබඳ වසර 30ට වැඩි පළපුරුද්ද.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ අධි සාමාජික
- ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජික



උදය වික්‍රමනායක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(විමර්ෂණ)

නිපුනතාව සහ පළපරුද්ද

- ශ්‍රී ලංකාවේ බැංකුකරණ සහ ප්‍රාග්ධන වෙළෙඳපොල තුළ වසර 29ක් ඇතුළුව මූල්‍ය සේවා අංශය තුළ වසර 33කට වැඩි පළපුරුද්ද. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා හවුල්වීමට පෙර එන්ඩීබී බැංකුව පීවිල්සී හා අනුයුක්තව සිට ඇත.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (පන්තියක් සහිත විශේෂ උපාධිය) පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජික

ආයතනික කළමනාකරණාකාරීත්වය



ජී.ඒ.එස්. සුමනසේන මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)

නිපුනතාව සහ පළපරුද්ද

- ප්‍රමුඛ පෙලේ 'Big 4'ගණකාධිකාරී ආයතනයක විගණනය සහ සහතික කිරීම පිළිබඳ පළපුරුද්ද.
- නිෂ්පාදන, අපනයන අංශයේ සම්පිණ්ඩන සහ වෙළෙඳාම තුළ කර්මාන්ත සමූහයක් තුළ වසර 20කට වැඩි පළපුරුද්ද.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය (විශේෂ උපාධිය) පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- එක්සත් රාජධානියේ කාඩිෆ්ෆ් මෙට්ට්‍රොපොලිටන් වෙතින් ව්‍යාපාර පරිපාලනය (සාමාන්‍ය උපාධිය) පිළිබඳ විද්‍යාපති උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික



ඩබ්ලිව් ජී කේ රත්නායක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සාමාජික සේවා)

නිපුනතාව සහ පළපරුද්ද

- ප්‍රමුඛ පෙලේ සහ විදේශයන් හී පිළිගත් ආයතනවල සුළු හා විශාල පරිපාලන කණ්ඩායම්වල පුළුල් නිරාවරණය සහිතව ප්‍රධාන විධායක නිලධාරී සහ පරිපාලන කළමනාකරු යන තනතුරුවල වසර 24කට වැඩි විස්තීර්ණ පරිපාලන පළපුරුද්ද සතුය.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජික
- එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ II අදියර නිමකර ඇත



එම් ඒ කේ අලුත්ගමගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

නිපුනතාව සහ පළපරුද්ද

- ගණකාධිකාරීවරයෙක් ලෙස 1999දී සේවයට එකතු වී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය දෙපාර්තමේන්තුව තුළ වසර 22කට වැඩි පළපුරුද්ද.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධිය
- කැලණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජික
- ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ සහය සාමාජික
- ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජික



ජේ කේ පී රංජිත් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(බලාත්මක කලාපය 1) 2021.10.11 දින සිට
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

නිපුනතාව සහ පළපරුද්ද

- බහු ජාතික සමාගම් ඇතුළුව රාජ්‍ය මෙන්ම පුද්ගලික අංශයේ සංවිධානවල ජ්‍යේෂ්ඨ මට්ටමේ කළමනාකාරිත්ව පළපුරුද්ද.
- ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය අධ්‍යක්ෂ ලෙස සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ව්‍යාපෘතියක් වන GFATM හි ව්‍යාපෘති මූල්‍ය ප්‍රධානී ලෙස සේවය කර ඇත.
- වසර 24ක් කොකා කෝලා ශ්‍රී ලංකා හී සේවය කළ අතර එහි මූල්‍ය අංශය තුළ ජ්‍යේෂ්ඨ තනතුරු කිහිපයක් දරා ඇත.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ හවුල්කාරත්වයෙන් ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් පිරිනමන ලද කම්කරු නීතිය හා කාර්මික සබඳතා පිළිබඳ විධායක ඩිප්ලෝමාව අවසන් කර ඇත.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය.
- එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජික
- පොත් තබන්නන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජික
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික
- CBA හි සාමාජිකත්වය
- CGMA (USA) හි සාමාජිකත්වය



පී එල් අයි සී පී අල්විස් මහත්මිය

සහකාර සාමාන්‍යාධිකාරී
(බලාත්මක කලාපය 3)

නිපුනතාව සහ පළපරුද්ද

- පිළිවෙලින් පෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සහ රුහුණ විශ්ව විද්‍යාලයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ සහකාර ලේඛකාධිකාරී යන ප්‍රධාන තනතුරු දරා ඇත.
- පුද්ගලික අංශයේ සහ විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශයේ සේවය කර ඇත.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (පළමු පෙළ) උපාධිය
- පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධිය (විශේෂීකරණය වතාක්ෂණ විද්‍යාව)
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය.



වී එන් ජයරත්න මහත්මිය

සහකාර සාමාන්‍යාධිකාරී
(දායක මුදල් එකතු කිරීම)

නිපුනතාව සහ පළපරුද්ද

- ගණකාධිකාරිවරයෙක් ලෙස සේවයට එක් වී වසර 26කට වැඩි පළපුරුද්ද.
- ඩීවිස්අයි සැමිසන් එක්ස්පෝර්ට්ස් ලිමිටඩ් හී ගිණුම් විධායක ලෙස සේවය කර ඇත.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කැලණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජ වේදී(විශේෂ) උපාධිය
- ඕස්ට්‍රේලියාවේ කළමනාකරණය පිළිබඳ ආයතනයේ ව්‍යාපාර පාසලෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (MBA) විද්‍යාපති උපාධිය.
- ඕස්ට්‍රේලියාවේ සහතික ලත් කළමනාකරණ ගිණුම් පිළිබඳ ආයතනයේ සාමාජික (CMA).



කේ ජී එන් රත්නායක මහතා

සහකාර සාමාන්‍යාධිකාරී -
පරිපාලන හා මානව සම්පත්

(පසුගිය වසර 2 තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් සහ සහකාර සාමාන්‍යාධිකාරී ප්‍රසම්පාදන රාජකාරී ආවරණය කර ඇත)

නිපුනතාව සහ පළපරුද්ද

- පුද්ගලික අංශයේ සහ රජයේ සංස්ථාවල තනතුරු දරමින් මානව සම්පත් සහ පරිපාලනය පිළිබඳ වසර 24කට වැඩි පළපුරුද්ද.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කැලණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධිය
- පිරිස් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනයේ සහය සාමාජික



එච් එම් ඒ ජයන්ත කුමාර මහතා

සහකාර සාමාන්‍යාධිකාරී -
නීති හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්.

නිපුනතාව සහ පළපරුද්ද

- නීති නිලධාරී ලෙස 2004 දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා එකතු වී එහි නීති දෙපාර්තමේන්තුවේ වසර 17කට වැඩි පළපුරුද්ද.
- කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත "කම්කරු නීතිය අවබෝධ කර ගැනීම" හි "සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත" හි යාවත් කළ පරිච්ඡේදයේ කතෘ.
- කම්කරු අමාත්‍යාංශය විසින් කම්කරු අධ්‍යයනය පිළිබඳ ජාතික ආයතනය විසින් පවත්වන "කම්කරු නිලධාරීන් සඳහා කම්කරු නීතිය"විෂය ආවරණය කරන කථිකාචාර්යවරයෙකි.
- වර්තමානයේ බලාත්මක නෛතික හා බලාත්මක AS 400 පරිගණක මොඩියුල සංවර්ධනය කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය නියෝජනය කරන ප්‍රධාන සම්පත් දායකයෙකි.
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට යෝජිත සංශෝධන කෙටුම්පත් කිරීමට දායක වූ ප්‍රධාන සම්පත් දායකයෙකි.
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "නීති කටයුතු සඳහා ක්‍රියාපටිපාටි සංග්‍රහය" කෙටුම්පත් කිරීමට මැදිහත් වූ ප්‍රධාන සම්පත් දායකයෙකි.

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විද්‍යාපති උපාධිය
- පෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් LLM
- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් LLB උපාධිය
- ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ
- ප්‍රසිද්ධ නොතාරිස් හා දිවුරුම් කොමසාරිස්
- ලියාපදිංචි සමාගම් ලේකම්.

ආයතනික කළමනාකරණාකාරීත්වය



පුෂ්පරංග වීරසේකර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණය)

නිපුනතාව සහ පළපරුද්ද

- මෘදුකාංග, දෘඩාංග, ඉලෙක්ට්‍රොනික් සහ ජාලගතකරණය පිළිබඳ විශේෂඥ ප්‍රවීනත්වය සමඟ ඉංජිනේරු ව්‍යාපෘති සැලසුම් කිරීම, විශ්ලේෂණය, නිර්මාණය, වැඩසටහන්ගත කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුළුල් පළපුරුද්ද

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපාධිය (විශේෂීකරණය: පරිගණක ඉංජිනේරු විද්‍යාව)
- එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්සයර් විශ්ව විද්‍යාලයෙන් පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ (IESL) සහය සාමාජික
- කෘතිම බුද්ධි (AI) පද්ධති වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව
- JAVA වැඩසටහන් සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව



එච් ජී ඩී එන් ප්‍රසන්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(සාමාජික සේවා) වැඩබලනඟ

නිපුනතාව සහ පළපරුද්ද

- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අධීක්ෂණ නිලධාරියෙක් ලෙස එකතු වී ඇත. බලාත්මක කිරීම, පරිපාලනය සහ මානව සම්පත් අංශ පිළිබඳ ප්‍රධාන අංශවල නිරාවරණය සතුය.
- චීනයේ වූහාන් ෆයිබර් නිවසේ තොරතුරු තාක්ෂණ පුහුණුව පිළිබඳ විදේශීය නිරාවරණය ලබාගෙන ඇත
- ජාත්‍යන්තර කම්කරු සංගමය සහ යුනිසෙෆ් විසින් සංවිධානය කළ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගි වී ඇත.
- කම්කරු අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනයේ කථිකාචාර්ය

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- රුහුණු විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය.
- චීනයේ වූහාන් හී හස්ටි විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය

ආයතනික පාලනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අර්ධ-රාජ්‍ය ආයතනයක් වන අතර, එය ආයතනික යහ පාලනය ප්‍රධාන ව්‍යාපාර අවශ්‍යතාවක් ලෙස සලකයි. මණ්ඩලය එහි ව්‍යාපාර මෙහෙයුම් තුළ සියලුම ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලවීමට බැඳී සිටී. මණ්ඩලය එහි පාලන පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා මණ්ඩලය මෙහෙයවීමේදී විනිවිදභාවය, විශ්වාසනීයත්වය සහ අනුකූලතාව යන ප්‍රධාන මූලධර්මවලින් මණ්ඩලය මෙහෙයවනු ලබයි.

පාලන ව්‍යුහය ප්‍රස්ථාරිකව පහත නිරූපනය කෙරේ:

මණ්ඩලයේ ආයතනික පාලන ව්‍යුහය විශේෂිත කාර්යභාරයන් සහ වගකීම් සහ පැහැදිලි වාර්තාකරණ මාර්ග සමඟ බහු-විධ පාලන ආයතනවලින් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය මණ්ඩලයේ උපාය මාර්ගික දිශාව, මූල්‍ය අරමුණු, සම්පත් වෙන්කිරීම සහ අවදානම් රුචිය පිළිබඳව ඉහළම කළමනාකරණය සමඟ පාලනය සහ විචාරවත්බව ලබා දේ.



අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු
අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු විශේෂිත වගකීම් සහ පැහැදිලිව නිශ්චිත විධානයන් මත ක්‍රියාත්මක වේ. කමිටුවේ සභාපතිවරු කමිටුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහ අදාළ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සිදු කිරීම සඳහා වගකිව යුතුය.

කළමනාකරණ කමිටුව
මෙහෙයුම් තීරණ කළමනාකරණය සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබන ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම වෙත පවරනු ලැබ ඇත. කළමනාකරණ කමිටුව දෛනික මෙහෙයුම් තීරණ ගැනීමට සහ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී වෙත නිර්දේශ සිදු කිරීමට ස්ථාපිත කර ඇත.

ආයතනික පාලනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම හැසිරීම ඵලදායි අයුරින් සකස් කරමින් යහපත් පාලන ව්‍යූහයන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති රාමු සකස් කිරීමේ ඉහළම වගකීම උසුලයි. නියාමන වෙනස්වීම්, මතුවන අවදානම් සහ අවස්ථා සහ අභ්‍යන්තර වෙනස්වීම් පිළිබිඹු කිරීමට පාලන ව්‍යවහාර නිරන්තරව සමාලෝචනය කර යාවත්කාලීන කෙරේ.

මණ්ඩලයේ පාලන රාමුව පහත දක්වා ඇති බාහිර සහ අභ්‍යන්තර මෙහෙයුම් උපකරණ කීහිපයක් සමඟ අනුකූලවීම සඳහා සංවර්ධනය කරනු ලැබ ඇත.

- 1986 අංක 40 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත.
- මූල්‍ය රෙගුලාසි (රජය)
- රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව)
- මනා භාවිතයන් සංග්‍රහය (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව)
- ප්‍රධාන පාර්ශ්වකරුවන් කණ්ඩායම්වල අයිතීන් ඉටු කරමින් ආයතනික ක්‍රියා කරන ආකාරය ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කරන CA ශ්‍රී ලංකා විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය,
- ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩල පනත
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
- සේවකයින්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ආමන්ත්‍රණය කරන 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත සහ එහි සංශෝධන
- චකිතු කිරීමේ නියෝජිතයන් සඳහා බදු අධිකාරීන් විසින් නිකුත් කරන ලද පනත්, චක්‍රලේඛ, ගැසට්
- අදාළ රජයේ චක්‍රලේඛ (භාණ්ඩාගාරය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)

1. අධ්‍යක්ෂ මණ්ඩලය

1.1. අධ්‍යක්ෂ මණ්ඩලය

රජය සහ එහි පාර්ශ්වකරුවන් වෙනුවෙන් අරමුදලේ භාරකාරත්වය තුළ ව්‍යවස්ථාපිත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් ය. කාර්යක්ෂම මෙහෙයුම් පිළිබඳ සහතිකය සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව ලබා දෙන අභ්‍යන්තර පාලනය පිළිබඳ ඵලදායී ක්‍රමයක් මණ්ඩලයේ කළමනාකරණය පවත්වා ගන්නා බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය උත්සාහ ගනී.

1.1.1. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම්

වඩා ඉහළ විවිධත්වය ඇති කිරීම සඳහා අධ්‍යක්ෂවරු බහුවිධ පසුබිමකින් (මූල්‍ය, වෙළෙඳාම, සේවා යෝජක සංගමය, වෘත්තිය සමිති යන ආදිය) ලබා ගනී. මෙය ඔවුන්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කළ කරුණුවලට අදාළව ස්වාධීන දැක්මක් ලබාදීමට හැකියාව ඇති කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින් නවයෙන් සමන්විත වේ.

- අමාත්‍යාංශය විසින් නම්කරන සාමාජිකයින් හතරක්
- මූල්‍ය විෂයභාර අමාත්‍ය විසින් නම්කරන නියෝජිතයෙක්
- වෙළෙඳ විෂයභාර අමාත්‍ය විසින් නම්කරන නියෝජිතයෙක්
- ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් නම්කරන එක් සාමාජිකයෙක්
- සාමාජිකයින් 100,000කට වැඩියෙන් සිටින සෑම වෘත්තීය සමිතියක විධායකය සමඟ උපදේශයෙන් අමාත්‍ය විසින් නම් කරන සාමාජිකයින් දෙදෙනෙක්

1.1.2. අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය පොදු සම්පත්වල භාරකරුවෙක් ලෙස අවංකව සහ සද්භාවයෙන් යුතුව එහි අනුගම්‍ය අයිතිවාසිකම් සහ වගකීම් ක්‍රියාවට නැංවිය යුතුය. විධිමත් සැලසුම් කිරීම් නොමැතිව සිදුකරන යම් තීරණ හෝ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලය අවසාන වශයෙන් ජනතාව විසින් දැරිය යුතු බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය සෑම අවස්ථාවක දී ම එහි භාරදූර වගකීම් පිළිබඳ සවේතනික විය යුතුය.

1.1.3. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍යයෙන් මාසික කාලාන්තරයක දී සහ අවශ්‍ය අවස්ථාවක රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩලය 2020 වසර තුළ 07 වරක් හමුවිය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ඵලදායිත්වය වැඩි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පෙර වැඩකරන දින තුනකට නොඅඩුව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හරිනු ලැබේ.

2020 දී පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල පැමිණීම පහත දක්වා ඇත.

නම	සහභාගි වූ රැස්වීම් ගණන	2020 මූල්‍ය වසර තුළ පවත්වන ලද රැස්වීම් ගණන	සහභාගි වූ රැස්වීම්වල ප්‍රතිශතය
ශ්‍රියාන් ද සිල්වා විජයරත්න මහතා	07	07	100%
නීල් උමගිලිය මහතා	07	07	100%
කේ.ඩී. රණසිංහ මහතා	07	07	100%
ප්‍රඩ් දිනාල් පීරිස් මහතා	04	07	57%
ආර්.ඒ.එල්. උදය කුමාර මහතා	07	07	100%
එල්.එස්. දේවේන්ද්‍ර මහතා	07	07	100%
ඊ.ඒ. වීකනායක මහත්මිය	05*	07	71%
ආරියසේන ගාල්ලගේ මහතා	07	07	100%
ඩබ්ලිව් එම්. නුරපිත් සින්	04	07	57%

සටහන: * ඊ.ඒ. වීකනායක මහත්මිය 2020 පෙබරවාරි 24 දින පත්කරන ලදී

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ආමන්ත්‍රණය කළ යුතු කරුණු සහ ගැටළු :-

- ප්‍රතිපත්ති සකස් කිරීම
- අරමුදලේ කාර්යසාධනය නියාමනය සහ ඇගයීම
- ඉහළම සදාචාර ප්‍රමිති සමඟ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සහතික කරමින් පරිපාලිත සමාගම්/ ආශ්‍රිත සමාගම සහ අනෙකුත් ආයෝජනවල පරමාර්ථ අනුව කාර්යසාධනය නියාමනය සහ ඇගයීම.

- වාර්ෂික කාර්යසාධන සමාලෝචනය
- කාරක ප්‍රාග්ධනය කළමනාකරණය
- කාර්තුමය, අර්ධ වාර්ෂික සහ වාර්ෂික කාර්යසාධන වාර්තා විශ්ලේෂණය සහ සක්‍රිය ක්‍රියාමාර්ග ගැනීම

1.2 අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට වෘත්තීමය වශයෙන් සුදුසුකම් සහිත අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් සහ සේවය සඳහා පිවිසීම ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටිය, නීතිය සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබාදීම සඳහා විශ්වාසී සහ අදාළ තොරතුරු කාලීන ආකාරයකින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙන බවට සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පාලනය වන ක්‍රියාපටිපාටි අනුගමනය කරන බව සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා කාලීන ආකාරයකින් බෙදා හරිනු ලබන බව ලේකම් විසින් සහතික කළ යුතුය.

1.2.1. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

සම්මත අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි අනුගමනය කරන බව සහ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සම්බන්ධයෙන් නෛතික අවශ්‍යතා පිළිබඳ මඟපෙන්වීම ලබාදෙන බව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහතික කළ යුතුය. ඊට අමතරව, ලේකම්ගේ රාජකාරියට පහත දෑ සම්බන්ධ වේ -

- අදාළ ලියවිලි සමඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දැන්වීම, රැස්වීම් වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හැරීම
- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධව පසු විපරම් කටයුතු
- අභ්‍යන්තර සහ බාහිර තොරතුරු ලබාදීම මගින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සහයවීම

1.3 අධ්‍යක්ෂ මණ්ඩල තුළනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට ආයතනය ඉහළම යහ පාලන ප්‍රමිතීන් කරා ඵලදායීව කළමනාකරණය කරමින් මෙහෙයවීමට සහ ආයතනික පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දක්ෂතාව, නිපුණත්වය සහ පළපුරුද්ද සතුය. ඔවුන් දැක්ම, නායකත්ව ගුණාංග, ප්‍රත්‍යක්ෂ වූ දක්ෂතාව සහ අවංකකව සහිත පුද්ගලයින් වෙති. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ පුද්ගලික විස්තර මෙම වාර්තාවේ 35 සිට 37 දක්වා පිටුවල දැක්වේ.

1.2.1. ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ප්‍රමාණවත් කාලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍යයෙන් මාසික කාලාන්තරයක් අතර රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ගතකරන සාමාන්‍ය කාලය පැය 3ක් පමණ වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා පරීක්ෂාවෙන් කියවා අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සාමාන්‍යයෙන් රැස්වීමට වැඩකරන දින තුනකට නොඅඩු කාලයක් තුළ බෙදා හරිනු ලැබේ.

1.4 සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී සමස්ත පාලන ව්‍යුහය තුළ වැදගත් පුරුකක් වන අතර, එහි උපාය මාර්ගික දිශානතිය කරා කණ්ඩායම සහ මණ්ඩලය මෙහෙයවීම සඳහා ඔහු වගකීමට බැඳී සිටී. ප්‍රධාන කටයුතුවලට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ කලින් නිශ්චිත කරගත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් සහ වැඩසටහන් පිළියෙල කිරීම සඳහා ද ඔහු වගකීමට බැඳී සිටී.

1.2.1 සභාපතිගේ පත්කිරීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී වේ.

සභාපති අමාත්‍යවරයා විසින් පත් කෙරේ.

1.2.2 සභාපතිගේ වගකීම්

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී නිවැරදි උපාය මාර්ගික දිශානතිය කරා සමස්ත කණ්ඩායම සහ මණ්ඩලය මෙහෙයවීමට සමස්ත පාලන ව්‍යුහය තුළ වැදගත් පුරුකක් ලෙස සේවය කරයි. ප්‍රධාන කටයුතුවලට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ කලින් නිශ්චිත කරගත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් සහ වැඩසටහන් පිළියෙල කිරීම සඳහා ද ඔහු වගකීමට බැඳී සිටී.

1.2.3 උපායමාර්ගික සහ මෙහෙයුම් තුළනය

බලය පිළිබඳ සුදුසු තුළනය කාර්යභාරයන් හි පැහැදිලිතාව සහ වගකීම් ඵලදායී ලෙස වෙන් කිරීම තුළින් සහතික කෙරේ. සභාපතිගේ කාර්යභාරය සාමාන්‍යාධිකාරීගේ කාර්යභාරයෙන් වෙනස් කර ඇත. සභාපති විධායක අධ්‍යක්ෂවරයෙක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දෙන අතර සාමාන්‍යාධිකාරී මෙහෙයුම් නායකත්වය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල තනතුරක් නොදරයි.

සභාපති සහ සාමාන්‍යාධිකාරීගේ ප්‍රධාන කාර්යභාරය/වගකීම් පහතින් දැක්වේ:

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත උපායමාර්ගික දැක්ම

ඉහළ මට්ටමේදී උපායමාර්ගික හැසිරීම සකස් කිරීම

සියලුම උපායමාර්ගික දිශානතින් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීත්වය සහතික කිරීම

සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ඵලදායී සහභාගිත්වය ඇති කිරීම

ශ්‍රී ලංකා රජය ඇතුළුව සියලුම පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී සන්නිවේදනය පවත්වා ගැනීම

ප්‍රමාණවත් තොරතුරු සියලුම අධ්‍යක්ෂවරුන්ට ලබාගත හැති බව සහතික කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සදාචාර හැසිරීම ස්ථාපිත කිරීම

සාමාන්‍යාධිකාරී

දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පරමාර්ථ සකස් කරමින් උපාය මාර්ගික දැක්ම ක්‍රියාවට නැංවීම

ආයතනික සැලැස්මේ දක්වා ඇති කාර්යසාධන අරමුණු අත්කර ගැනීම

ඉලක්ක පිළිබඳ නිරන්තර නියාමනය සහ ඒවායේ අත්කරගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම්දීම

මණ්ඩලය අනුමත අවදානම් රුචිය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනය තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම

ජ්‍යේෂ්ඨ කළමනාකරණයට මෙහෙයුම් නායකත්වය ලබාදීම

ආයතනික පාලනය

2 වගවීම සහ විගණනය

2.2 මූල්‍ය වාර්තාකරණය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සහ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති නියාමන පනතට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරනු ලැබේ.

2.2.1 ව්‍යවස්ථාපිත සහ නියාමන වාර්තාකරණය

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තියට අනුව, විගණකාධිපති මණ්ඩලයේ විගණකවරයා වේ.

2.2.2 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණකගේ වගකීම

97 පිටුවේ දක්වා ඇති විගණකාධිපතිගේ වාර්තාව බලන්න.

2.2.3 කලමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මණ්ඩලයේ මෙහෙයුම් පිළිබඳ ගැඹුරු විස්තරයක් ලබාදෙන 20 සිට 33 දක්වා පිටුවල දක්වා ඇති කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ බලන්න.

2.3 අභ්‍යන්තර පාලනය

2.3.1 අභ්‍යන්තර පාලන කාර්යය

මණ්ඩලයට එයටම අයත් අභ්‍යන්තර විගණන අංශයක් ඇති අතර, ඉන් විගණන කමිටුව තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අභ්‍යන්තර විගණන වාර්තා මඟින් අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මව සහ අවංකකම සමාලෝචනය කරයි.

2.3.2 විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලනයන් හී ඵලදායිත්වය සමාලෝචනය කිරීම

අභ්‍යන්තර විගණන අංශය මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයන් ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිත්වය පිළිබඳ විගණන කමිටුවට නිරන්තරව වාර්තා කරයි.

අනුකමිටු

ආයතනික පාලනයේ පූර්ව අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම පිණිස ඇතැම් නියමයන් හා අනුගතව ක්‍රියාකිරීමට මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය බැඳී සිටී. එහිලා අනු කමිටු ස්ථාපනය කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවක් වන්නේ ය. ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුවල ඵලදායී ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම සඳහා මෙම කමිටු මණ්ඩලයට සහය වන අතර ආයතනය පුරා දිවෙන සියලු ක්‍රියාදාමයන් පිළිබඳව සවිමත් තීරණවලට එළඹීමට ද එම කමිටු වග බලා ගනිති. මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගැටලු නිරාකරණය කිරීම පිණිස අදාළ ප්‍රවීණත්වයකින් හෙබි වෘත්තිකයන් ගෙන් මෙම කමිටු සමන්විත විය යුතු වන්නේ ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇති ඇතැම් ප්‍රධාන කමිටු සමහරක් පහත දක්වා ඇත.

විගණන කමිටු වාර්තාව

සංයුතිය
සභාපති

ආර්.ඒ.එල් උදය කුමාර මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත

සාමාජිකයින්
කේ.ඩී. රණසිංහ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

නීල් උමගලිය මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2020 වසර තුළ කමිටුවේ සංයුතිය

2020 මූල්‍ය වසර තුළ නොවෙනස්ව පැවති කමිටුවේ සංයුතිය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වේ. කමිටුව මූල්‍ය වෘත්තිකයෙක් වන භාණ්ඩාගාර නියෝජිත විසින් මෙහෙයවන ලබන අතර, අනෙකුත් සාමාජිකයින් දෙදෙනා ඉහලින් ශ්‍රේණිගත කර්මාන්තයේ ප්‍රවීනයන් වෙති.

කමිටුවේ ලේකම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් PED 55 චක්‍රලේඛය යටතේ දෙන ලද විධිවිධානවලට අනුව විගණන කමිටුවේ ලේකම් ලෙස ද කටයුතු කරයි.

නිරන්තර සහභාගිවන්නන්

- සාමාන්‍යාධිකාරී
- අතිරේක සාමාන්‍යාධිකාරී
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
- සියලුම ප්‍රාදේශීය සහ අංශ ප්‍රධානීන්

ආරාධනය අනුව සහභාගිවන්නන්

- විගණකාධිපතිගේ (සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ බාහිර විගණක) නියෝජිත
- රේඛීය අමාත්‍යංශය එනම් මුදල් අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක

කමිටු රැස්වීම්

විගණන කමිටුව මූල්‍ය වසර පුරා ක්‍රියාත්මක වූ අතර වසංගත තත්ත්වය හමුවේ විධිමත් රැස්වීම් තුනක් පැවැත්වීමට සමත් විය. සමාලෝචිත වසර තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම්වලදී පැමිණීම පහත පරිදි වේ.

2020 දී පවත්වන ලද රැස්වීම් : 03

නම	රැස්වීම් දින		
	12.03.2020	30.07.2020	10.12.2020
ආර්.ඒ.එල් උදය කුමාර මහතා	√	√	√
කේ.ඩී. රණසිංහ මහතා	√	√	√
නීල් උමගලිය මහතා	√	√	√

පැමිණීම √
සමාව ගැනීම X

විගණන කමිටුවේ ගණපූරණය සාමාජිකයින්ගේ බහුතරයකි. එසේ වුවත්, කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් තමන්ගේ කාර්යභාරය ඉටුකිරීම පිණිස සියලුම සාමාජිකයින් 2020 දී සියලුම රැස්වීම්වලට සහභාගි විය.

විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ කාර්යභාරය වන්නේ සාමාජිකයින් සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ගේ හිමිකම සුරක්ෂිත කිරීම පිණිස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩයේ ක්‍රමානුකූල පාලනය සහතික කිරීමයි.

ආයතනයේ ව්‍යාපාරයේ ස්වභාවය සැලකිල්ලට ගනිමින්, මණ්ඩලය වෙනම අවදානම් කමිටුවක් පත්කර ඇත. එබැවින් විගණන කමිටුව අභ්‍යන්තර පාලනය සහ අනුකූලතාව සහ වාර්තාකරණ දෘෂ්ටිකෝණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

විෂයපථය

මූල්‍ය වාර්තාකරණය සහ නියාමන අනුකූලතාව

- නියාමන බලධාරීන්, රජයේ චක්‍රලේඛ, අදාළ නීති සහ රෙගුලාසි සහ අදාළ වාර්තාකරණ ප්‍රමිති වැනි අවශ්‍යතාවන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන බව සහ තොරතුරු ප්‍රමාණවත් පරිදි අනාවරණය කරන බව සහතික කිරීම සඳහා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ක්‍රමානුකූල පාලනය.
- 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත (සංශෝධිත පරිදි) සහ මූල්‍ය පනත ඇතුළුව අනෙකුත් අදාළ පනත් සහ රෙගුලාසිවලට විධිමත් අනුකූලතාව සමාලෝචනය කිරීම.

අනුකමිටු

අභ්‍යන්තර පාලනය

- අදාළ චක්‍රලේඛ අනුව අභ්‍යන්තර පාලනයන් හී ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කර තක්සේරු කිරීම සහ මහජන සම්පත් ආරක්ෂා කිරීම අනුව විශේෂ අවධානය අවශ්‍ය ක්ෂේත්‍ර ඉස්මතු කිරීම.

අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන කාර්යයන් හි ස්වාධීනත්වය, ඵලදායිත්වය සහ නිපුනත්වය එහි සම්පත් අවශ්‍යතාව සමාලෝචනය කර ඇගයීම සහ අභ්‍යන්තර විගණන කාර්යයන් ඉහළ නැංවීම සඳහා නිර්දේශ සිදු කිරීම.
- අභ්‍යන්තර විගණන අංශය සහ බාහිර විගණකවරුන් අතර සම්බන්ධීකරණය සහතික කිරීම.
- අභ්‍යන්තර විගණන සැලැස්ම මෙන්ම සැලකියයුතු අභ්‍යන්තර විගණන සොයාගැනීම් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.

බාහිර විගණනය

- මණ්ඩලයේ බාහිර විගණනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතට අනුකූල වෙමින් රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව විගණකාධිපති විසින් සිදු කරයි.
- විගණන කමිටුව විසින් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නියෝජනය සහිත සුදුසු සන්නිවේදන සිදු කර හඳුනාගත් අපගමනයන් නිවැරදි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය නිර්දේශ සිදු කරයි.

විගණන කමිටු රැස්වීම් තුළ ප්‍රධාන අවධානිත ක්ෂේත්‍ර පිළිබඳ සාරාංශය

සමාලෝචිත වසර තුළ, විගණන කමිටුව විසින් වෙන් නොකළ සාමාජික ශේෂය, මූල්‍ය වාර්තාකරණය, ප්‍රාදේශීය ක්‍රියාපටිපාටි අත්පොත්, නව ICTA ව්‍යාපෘතිය, හිටපු සේවක ශේෂ, බාහිර සහ අභ්‍යන්තර විගණන කරුණු සම්බන්ධයෙන් නිසි සලකාබැලීම සිදු කර ඇත. එබැවින්, එම මැදිහත්වීම්වලින් මණ්ඩලය මගින් අනුගමනය කරන සම්ප්‍රදායික පද්ධතිවලින් ඇතිවන දුර්වලතා කිහිපයක් අවම කිරීම සඳහා අදහස් ශක්තිමත් කිරීමට සැලකියුතු බලපෑමක් තිබූ බව කමිටුව තරයේ විශ්වාස කරයි. ICTA සමඟ සහයෝගිත්වයෙන් කරගෙන යන නව පද්ධති සංවර්ධනය විධිමත් පාලන යාන්ත්‍රණයක් සමඟ කඩිනම් කරනු ලබන අතර, නවීන ERP විසඳුම සාමාජිකයින්ගේ ධනයේ සුරක්ෂිතභාවය සහතික කිරීමට වඩාත් පරිශීලක හිතකාමී කාර්යක්ෂම සහ විශ්වාසී ආකාරයකින් කටයුතු කිරීමට මණ්ඩලය ශක්තිමත් කරනු ඇත.

ඉදිරි ගමන් මඟ

මණ්ඩලයේ අරමුණු සහ පරමාර්ථ සාර්ථකව අත්කර ගැනීම ඉලක්ක කළ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, සම්පත් භාවිතය, පාලනය සහ අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධ කරුණු කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට නියාමනය සහ වාර්තාකරණය මගින් යහපත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සාක්ෂාත් කර ගැනීම පිණිස විගණන කමිටුව අඛණ්ඩව නියැලී සිටී.

විගණන කමිටුව වෙනුවෙන්

(අත්සන කළේ)
ආර්.එ.එල්. උදය කුමාර මහතා
සභාපති
විගණන කමිටුව

2021 මාර්තු

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

පසුබිම

අභ්‍යන්තර හා බාහිර කම්පන, තාක්ෂණික නවෝත්පාදන, කර්මාන්ත එකට හමුවීම, නිතර නිතර මූල්‍ය හා බැංකු අර්බුද සහ කොවිඩ් -19 වසංගතය පැතිරීම වැනි හදිසි අවස්ථා වර්ධනය වීම ව්‍යාපාරික සංවිධානවලට, විශේෂයෙන්ම අරමුදල් කළමණාකරුවන්ට විය හැකි මෙහෙයුම් සහ වෙළෙඳපොළ අවදානම් පිළිබඳව වඩාත් විමසිලිමත් වීමට බල කරයි. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ අවදානම් කළමනාකරණ ව්‍යවහාරවල අවදානම් සහ ඵලදායිත්වය සම්පව නියාමනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සහ අභ්‍යන්තර අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර ඇත. වියහැකි අවදානම් ඉවත්කිරීමට හෝ අවම කිරීමේ අදහස ඇතිව මණ්ඩලයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ අවදානම් ලේඛණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි ව්‍යවසාය අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ද කටයුතු කරමින් සිටී.

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව 2020 දී ස්ථාපිත කරන ලදී. පහත ලැයිස්තුගත සාමාජිකයින් මෙම කමිටුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබ ඇත.

- කේ.ඩී. රණසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/කමිටුවේ සභාපති
- නීල් උමගලිය මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/කමිටුවේ සාමාජික
- ආර්.ඒ.එල්. උදය කුමාර මහතා - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත/කමිටුවේ සාමාජික
- කේ.එස්. වැලිවිට මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි

ප්‍රධාන අවදානම් නිරාවරණ සහ මණ්ඩලය එහි ව්‍යාපාර මෙහෙයුම්වලදී මුහුණ පාන අවදානම්වලට අදාළව එවැනි අවදානම් නිරාවරණ නියාමනය සහ පාලනය කිරීම සඳහා ගනු ලැබූ පියවර සමාලෝචනය ඇතුළුව මණ්ඩලයේ අවදානම් කළමනාකරණ රාමුව සහ කටයුතු පාලනය කිරීමේ වගකීම ඉටු කිරීම තුළ අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

සාමාජිකයින් ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සියලුම ප්‍රාදේශිය ප්‍රධානීන් සහ මණ්ඩලයේ අංශ ප්‍රධානීන් සමඟ මණ්ඩලයේ සභාපති විසින් මෙහයවනු ලබන කළමනාකරණ අවදානම් කමිටුව (MRC) අඛණ්ඩ පදනමක් මත මණ්ඩලයේ මෙහෙයුම් සහ වෙළෙඳපොල අවදානම් නියාමනය කරයි.

අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥාප්තිය

කළමනාකරණ අවදානම් කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රඥාප්තිය අනුව කටයුතු කළ යුතුය.

අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම්

2020 වසර තුළ, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පැවති සීමාකිරීම් හමුවේ, අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීම් දෙකක් පවත්වන ලදී.

2020 වසර තුළ කටයුතු

2020 වසර තුළ, අවදානම් කළමනාකරණ කමිටුව එහි පරීක්ෂාකාරිත්වයන් තුළ පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

දත්ත ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව, ෆයර්වෝල් තොරතුරු තාක්ෂණ ක්‍රියාපටිපාටි සංග්‍රහය ක්‍රියාත්මක කිරීම, නව ICT ව්‍යාපෘතිය, ආපදා පිළියම් සැලැස්ම, විසිරී ඇති සාමාජික ශේෂ, බැංකු ගිණුම් මෙහෙයුම්, අනුප්‍රාප්ත සැලැස්ම, අරමුදලට ගෙවියයුතු දායක මුදල් එකතු කිරීම, ආයෝජනය සහ ආයෝජන ක්‍රියාපටිපාටි සංග්‍රහය සහ නව අවදානම් පැතිකඩ.

2020 සහ ඉදිරියට කමිටුවේ අවධානය

ප්‍රඥාප්තියට අනුව, අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ඇත.

- යම් වැදගත් නියාමන ගැටළු
- මණ්ඩලයට වැදගත් මතුවන අවදානම්
- නව වැදගත් අවදානම් හෝ වර්තමාන කීර්තිනාම අවදානම්වලට මණ්ඩලය නිරාවරණය කළ හැකි නව හෝ යෝජිත ව්‍යාපෘති, ආයෝජන, සේවා හෝ ව්‍යාපාර
- ද්‍රවශීලතාවය, ණය, වෙළෙඳපොළ හෝ මෙහෙයුම් අවදානම සම්බන්ධ අනෙකුත් වැදගත් කරුණු.
- මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය
- විවිධ පොලී අනුපාත තත්ත්වයන් යටතේ මණ්ඩලයේ ඉපැයීම්වල සංවේදීතාව
- සාමාජිකයින් සඳහා වාර්ෂික ලාභාංශ ප්‍රකාශන අනුපාතය
- මණ්ඩලයේ කාර්යසාධනය කෙරෙහි පොදුවේ ආර්ථික ප්‍රවණතා සහ විශේෂයෙන්ම පොලී අනුපාත ප්‍රවණතාවල ඇති විය හැකි බලපෑම.
- වත්කම්, වගකීම් සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් බාහිර රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති යන දෙකටම අනුකූල වීම.
- වත්මන් මෙහෙයුම් පරිසරය සහ නව තාක්ෂණයන්හි උපාය මාර්ගික සංවර්ධනය ඇතුළුව මණ්ඩලයේ තොරතුරු තාක්ෂණයට (IT) සම්බන්ධ අවදානම් සහ මණ්ඩලයේ තාක්ෂණික යටිතල පහසුකම් හා සම්බන්ධ අවදානම්.
- නීතිමය, නියාමන සහ සදාචාරාත්මක අවශ්‍යතා සමඟ මණ්ඩලයේ අනුකූලතාව සම්බන්ධයෙන් අවදානම් තක්සේරු කිරීම.
- සුදුසු පරිදි, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම්කරණය, මූල්‍ය පාලනයට අදාළ අවදානම, මානව ප්‍රාග්ධනය, ස්ථාවර ආදායම් සහ කොටස් ආයෝජන සම්බන්ධ ගැටළු.

අනුකමිටු

ERM විෂයපථය

ප්‍රාග්ධන ව්‍යුහය තුළ යෝජිත ERM ආරක්ෂක මාර්ග තුනකින් සමන්විත වේත

1 වැනි ආරක්ෂක මාර්ගය	2 වැනි ආරක්ෂක මාර්ගය	3 වැනි ආරක්ෂක මාර්ගය
▽	▽	▽
දෛනික අවදානම් කළමනාකරණය	අවදානම් කළමනාකරණ කාර්යය	ස්වාධීන සහතිකය
▽	▽	▽
අංශ	අවදානම් කළමනාකරණ කමිටුව	අවදානම් කළමනාකරණ කමිටුව/ විගණන කමිටුව
• අවදානම් හිමිකම • ඵලදායී අභ්‍යන්තර පාලනයන් • තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් අවදානම් කළමනාකරණ වාර්තා • මූලික කාර්යසාධන දර්ශක පදනම් අවදානම	• අවදානම් උපදේශය • අවදානම් පුහුණුව • අවදානම් නියාමනය • නියාමන අනුකූලතාව	• අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ත ක්‍රියාකාරිත්වය සහ ඵලදායිත්වය • අභ්‍යන්තර විගණනය • විමර්ෂණ

(අත්සන් කළේ)

කේ.ඩී. රණසිංහ

අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුවේ සභාපති

ආයෝජන කමිටුව

ආයෝජනය අනුව මණ්ඩලයේ මූලික පරමාර්ථය වන්නේ මූල්‍ය බැඳීම් ආපසු ගෙවීමට ද්‍රවශීලතාව කළමනාකරණය කරමින් මූලික කොටස ආරක්ෂා කිරීමත්, බලයලත් ආයෝජන මත සුදුසු පරිදි භාවිතා කරමින් ප්‍රශස්ත ආයෝජන ප්‍රතිලාභ ලබාදීමත් ය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයෝජන කමිටුව පහත සඳහන් අරමුණු තුන අත්කරගැනීම සහතික කරගැනීමට උත්සාහ දරයි.

- **ආරක්ෂාව**

සැලකියයුතු ආයෝජන අවස්ථාවන් ආරක්ෂා කිරීම මණ්ඩලයේ මූලික අරමුණ වේ. මෙම අවශ්‍යතාවයට සමගාමීව, ඉතා සුදුසු රජයේ සුරැකුම්පත්වල ආයෝජන කළඹේ සැලකියයුතු කොටසක් ආයෝජනය කිරීමට මණ්ඩලය නැඹුරු වේ.

- **ද්‍රවශීලතාව**

ආයෝජන කළඹ සාධාරණව අපේක්ෂා කළ හැකි සියලුම මෙහෙයුම් අවශ්‍යතාවයන් සපුරාලීමට මණ්ඩලයට පහසුකම් ඇති කිරීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාව පවතී.

- **ආයෝජන මත ඉපයීම**

ආයෝජනයේ බලයලත් ආදර්ශ භාවිතා කරන ඉහළම ලබාගත හැකි ප්‍රතිලාභ ලබාගැනීමට ආයෝජන කළඹ සැලසුම් කළ යුතුය.

ආයෝජන කමිටුව සාමාජිකයින් හය දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් අවම වශයෙන් මාසයකට වරක් අවශ්‍යතාව මත හමුවේ. වෙළෙඳපොල තත්ත්වයන් යටතේ පදනම් වූ අරමුදල් සඳහා සුදුසු ආයෝජන අවස්ථාවන් මත එය තීරණය වේ.

ආයෝජන කමිටුවේ සංයුතිය

- ආයෝජන කමිටුව
- භාණ්ඩාගාර නියෝජිතයන්
- රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයන්
- සාමාන්‍යාධිකාරී
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණනය)
- නිරීක්ෂකයෙකු ලෙස
- කොටස් කමිටුව
- සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
- කළමනාකරු මූල්‍ය
- ආයෝජන විශ්ලේෂකයින් තිදෙනෙක්

කළමනාකරණ කමිටුව

මණ්ඩලයේ මෙහෙයුම් කළමනාකරණය කිරීමේ වගකීම සභාපතිවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ පාලනය යටතේ පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් වගකිව යුතුය. හොඳින් සලකා බලා තීරණ ගැනීමේදී සභාපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම මණ්ඩලයට තොරතුරු සහ අවශ්‍ය පැහැදිලි කිරීම් සපයයි. ඔවුන් මෙහෙයුම් සැලසුම් සහ අයවැය සකස් කරන අතර මණ්ඩලයේ අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගනිමින් අරමුදල කාර්යක්ෂම කළමනාකරණය සඳහා පද්ධති, ක්‍රියා පටිපාටි සහ පාලනයන් තහවුරු කරයි.

එබැවින් කළමනාකරණ කමිටුව වරින් වර ප්‍රගති පරීක්ෂණය මණ්ඩලයේ අනිවාර්ය අංගයකි. මෙම කමිටුව පහත දෑ කෙරෙහි අවධානය යොමු කිරීමට බැඳී සිටී:

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති පෙර රැස්වීම්වල ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ.
- කාර්ය සාධන ක්‍රියාදාමයෙහි ඇතිවන පරතර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.
- ඉදිරි කාර්තුව සඳහා මුදල් ප්‍රවාහ සහ ප්‍රක්ෂේපිත අවශ්‍යතා පිළිබඳ විවේචනාත්මක ඇගයීම
- ණය/මුදල් කළමනාකරණය
- හදිසි මිලදී ගැනීම් වැලැක්වීම සඳහා ප්‍රසම්පාදන පසුබෑම් (ඇත්නම්) පසු විපරම් කිරීම
- සේ.අ.අ. සහ සේ.භා.අ. සහ බදු වැනි ව්‍යවස්ථාපිත හිඟ මුදල් ගෙවීම් සහතික කිරීම
- මණ්ඩලයේ තීරණ ගැනීමට සහාය වීම සඳහා සාධාරණීකරණයන් සමඟ අවශ්‍ය තාක්ෂණික වැඩිදියුණු කිරීම්
- විවිධ මාධ්‍ය ඔස්සේ පළවන පැමිණිලි ඇතුළුව ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය/ අතෘප්තිමත්භාවය පිළිබඳ පසුවිපරම් කටයුතු කරමින් ඒවා වැඩි දියුණු කිරීම/නිවැරදි කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම
- සංශෝධිත ආයතනික සැලැස්මට ඇතුළත් කළ යුතු යම් නව යෝජනා
- පරිපාලනය සහ පිහිටුවීම් සම්බන්ධ සියලු කාරණා
- වෙනත් යම් විදිනෙදා මෙහෙයුම් ගැටළු.

කළමනාකරණ කමිටුවේ සංයුතිය

- සභාපති
- සාමාන්‍යාධිකාරී
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

අවදානම් කළමනාකරණය

සමස්ත අවදානම් කළමනාකරණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ පෙළේ විශ්‍රාම පාරිතෝෂිකවලින් එකක් ලෙස සලකයි. එහි ප්‍රමාණය සහ වෙළෙඳපොල මත එහි බලපෑමට අනුව, මණ්ඩලය ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ ඉතා වැදගත් ආයතනයක් වන අතර, එය එහි සාමාජිකයින්ට උපරිම විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමේ අරමුණ ඇතිව පුද්ගලික සහ අර්ධ-රාජ්‍ය අංශයේ සේවකයින්ගේ දිගුකාලීන විශ්‍රාම ඉතුරුම් කළමනාකරණය කරන අතර රජයේ සමස්ත මූල්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා ද සහය වේ.

එමනිසාම අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ උපායමාර්ගය මූලිකවම සාමාජිකයින්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම පිණිස සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ මෙහෙයුම් පාලනයන් පවත්වාගෙනයාම මත පදනම් වේ. විවිධාංගීකරණය කළ ආයෝජන කළඹ මත ආයෝජනය කළ ප්‍රාග්ධනය ආරක්ෂාව සහතික කිරීම සඳහා මණ්ඩලයේ ආයෝජන කළඹ තුළ සැලකියයුතු කොටස රජයේ සුරැකුම්පත්වලින් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළ, කාර්ය මණ්ඩලය සඳහා නිවසේ සිට වැඩ කිරීමේ වැඩපිළිවෙල, කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කිරීමට සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත්කළ ආරක්ෂිත උපදෙස් දැඩිව පිළිපැදීම ඇතුළුව කොවිඩ් 19 වසංගතයට ප්‍රතිචාර දැක්වීමේදී මණ්ඩලය විසින් පියවර ගණනාවක් ගනු ලැබූ අතර, දායක මුදල් සිදුකිරීම, ආපසු ගෙවීමේ හිමිකම් සහ ප්‍රතිලාභ හිමිකම් වැනි පොදු ජනතාවට අවශ්‍ය සියලුම සේවාවන් කලාපීය ජාලය ඇතුළුව දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ මණ්ඩලය විසින් පවත්වා ගනී.



ණය අවදානම

කිසියම් අවස්ථාවක ණයගනුවා විසින් ණයදෙනුවා හට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හරින විට ණය අවදානම උද්ගත වෙයි. මගින් එක් ණය ගනුවකු වෙනුවෙන් දැරිය යුතු පිරිවැය ඉහළ නැංවෙන අතර ණයදෙනුවෙකුගේ දෘෂ්ඨි කෝණයෙන් බලන විට ණය ඒකරාශි වීමක් ලෙසද සැලකිය හැකිය. අත්හැර දැමූ වටිනා මූල්‍ය අවස්ථාවල ප්‍රතිඵලයක් ලෙස විශේෂ කාලසීමාවක් තුළ ණය හිමියෙකුට අත්කරගත හැකිව තිබුණ ආර්ථික සහ මූල්‍ය ප්‍රතිලාභ ණය අවදානම සීමා කරයි. 2020 දෙසැම්බර් 31 දිනට, මණ්ඩලයේ අරමුදල්වලින් 77.5%ක් අවදානම් රහිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. එමනිසා, වඩා පහළ මට්ටමක ණය අවදානම පවත්වා ගැනීමට මණ්ඩලය සමත් වී ඇත. ණයකරවල ආයෝජන මුළු කළඹින් 1.3කට දායක වේ. මණ්ඩලය විස්තරාත්මක විශ්ලේෂණයක් තුළින් තෝරාගත් ආයෝජන ශ්‍රේණියේ ආයතනික ණය උපකරණවල පමණක් ආයෝජනය කරන බව අවධාරණය කළ යුතුය. තවද, ප්‍රති මිලදිගැනීමේ ගිවිසුම් සහ අනපේක්ෂිත ප්‍රති මිලදිගැනීමේ ගිවිසුම් ප්‍රමාණවත් රජයේ සුරැකුම්පත්වලින් සුරක්ෂිත කෙරේ. මෙම අවදානම් වැලැක්වීමේ ක්‍රියාමාර්ග ණය අවදානම අවම මට්ටමක තබාගැනීමට මණ්ඩලයට සහය වී ඇත.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානමට යම් ආයතනයක මෙහෙයුම් හැකියාව පිරිහීමට ලක් කළ හැකිය. මූල්‍යකරණ සහ ක්‍රමානුකූල අවදානම තීරණය කිරීමෙන් පසු එය ශේෂ්‍ය අවදානමක් වන අතර අභ්‍යන්තර ක්‍රියාපටිපාටි, සේවකයින් සහ පද්ධති බිඳවැටීම්වලට අදාළ අවදානම් එයට ඇතුළත්ය. මණ්ඩලයේ මෙහෙයුම් ආදායමේ ප්‍රධාන මූලාශ්‍රයන්ට තොරතුරු තාක්ෂණ හානිය, මානව දෝෂ සහ මැදිහත්වීම සහ ස්වභාවික ආපදා ඇතුළත්ය. මෙවැනි අවදානම් අවම කිරීම සඳහා, මණ්ඩලය විසින් මනා මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාවට නංවා ඇත. මෙහෙයුම් කටයුතු ස්වාධීන අභ්‍යන්තර විගණකවරයෙක් විසින් විගණනය කරන අතර, සොයාගත් දුර්වලතා සහ අපගමනයන් වහාම ආමන්ත්‍රණය කිරීම සඳහා විගණන සොයා ගැනීම් මාසික පදනමක් මත සාකච්ඡා කරනු ලබයි.

වෙළෙඳපොල අවදානම

මූල්‍ය වෙලෙඳපොලවල අවිනිශ්චිතතාවයන් වෙළෙඳපොල අවදානම කරා ආයතනවල අවදානමකට භාජනය වීම වැඩි කරයි. පොලී අනුපාතවල උච්චාවචනයන් සහ ස්කන්ධ අවදානම වෙළෙඳපොළ අවදානමේ මූලික සංරචක ලෙස හඳුනාගෙන ඇත. වෙළෙඳපොල අවදානම් ආයෝජන මත ප්‍රතිලාභය පිරිහීමට ලක් කරයි. භාණ්ඩාගාර බැඳුම්කර මත පොලී අනුපාත ඉහළ යන ගම්‍යතාවයක් පෙන්නුම් කරන විට, අගය පහත වැටීමට

නැඹුරු වේ. එමෙන්ම ඊට පටහැනිව, පොලී අනුපාත ක්‍රමයෙන් අඩුවීමක් (මිල අවදානමක්) නිරූපණය කරන විට, අරමුදල් ලාභ උත්පාදන හැකියාවට බාධා කරන අඩු අනුපාතයකින් (ප්‍රතිආයෝජන අවදානම) නැවත ආයෝජනය කිරීමට සිදුවේ. වෙළෙඳපොළ අවදානම වෙත නිරාවරණය අපගාමක කාලසීමාවන් සහ ප්‍රතිලාභ සහිත භාණ්ඩාගාර බැඳුම්කර ලබාගැනීමේ උපාය මාර්ගයත් සමඟ යම්තාක් දුරකට අවම කර ගෙන ඇත. ප්‍රාග්ධන වෙලෙඳපොල තුළ අහිතකර අවිනිශ්චිතතාවයන් ප්‍රාග්ධන වෙලෙඳපොල උපකරණවල, ප්‍රධාන වශයෙන් කොටස්වල වටිනාකම ක්ෂයවීමකට හේතු විය හැකිය. ප්‍රධාන ක්‍රියාකාරී වෙළෙඳපොල අංශ කිහිපයක පැවැත්ම පුළුල් කිරීම මඟින් විවිධාංගීකරණය වූ ආයෝජන කළඹකට ප්‍රවේශය ලබා ගැනීම, මිල පරාසයන් පිළිපැදීම වැනි ක්‍රියාමාර්ග අවම කිරීම සිදුවන මූල්‍ය පාඩු වළක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකිය. ප්‍රති ආයෝජන ක්‍රියාත්මක කිරීමට පෙර විස්තීර්ණ විශ්ලේෂණයක් සිදු කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කොටස්වල ආයෝජනය සමස්ත ආයෝජන බිඳවැටීමෙන් 3.48%ක් වන බැවින්, මණ්ඩලයේ ස්කන්ධ කළඹට සමස්ත බලපෑම සාපේක්ෂව අඩුය.

ද්‍රවශීලතා අනුපාතය

කෙටිකාලීන මූල්‍ය ඉල්ලුම් සපුරාලීමට වඩා අඩු මුදල් ප්‍රමාණාත්මතාව සරලව ද්‍රවශීලතා අවදානම් ලෙස අර්ථ දැක්විය හැකිය. මණ්ඩලයේ දෘෂ්ටිකෝණයෙන් බලන කල, මෙම වර්ගීකරණය යටතට වැටෙන අවදානම් ද අනාගත ආයෝජන අවස්ථාවන් වැලැක්විය හැකි අතර, මූල්‍ය ආයෝජනවල වෙළෙඳපොල හැකියාව අඩු කරනු ඇත.

සාමාන්‍යයෙන්, ආපසු ගෙවීමෙන් පසු ශුද්ධ දායකත්වය මණ්ඩලයේ ද්‍රවශීලතා ස්ථාවරයේ ඉහළ යාමක් පෙන්නුම් කරමින් මසකට රුපියල් මිලියන 639 ක ධනාත්මක මුදල් ප්‍රවාහයක් ලබා ගනී. 2020 අවසානය වන විට, ආදායම සහ කල්පිරීමේ ආදායම වැනි අනෙකුත් මුදල් ප්‍රවාහයන් හැර වාර්ෂික ආපසු ගෙවීම් මුළු මුදල් ප්‍රවාහවලින් 72%ක් නිරූපණය කරයි. වඩාත්ම ද්‍රවශීල ආයෝජනය ලෙස සැලකෙන රජයේ සුරැකුම්පත්වල අරමුදල්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ආයෝජනය කෙරෙන බැවින්, මණ්ඩලය ද්‍රවශීලතා උගුලට හසු නොවීය. මෙම යාන්ත්‍රණය ඕනෑම ද්‍රවශීලතා සංරෝධයකට එරෙහිව අමතර ස්වාරක්ෂකයක් සපයයි. නිෂ්ක්‍රීය අරමුදල්වලින් සාධාරණ ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමේ අරමුණින්, මණ්ඩලය දෛනික ද්‍රවශීලතා කළමනාකරණ මෙවලමක් ලෙස එක රැයකින් ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් වෙළෙඳපොළේ ආයෝජනය කරයි. එබැවින් අරමුදලේ ද්‍රවශීලතා අවදානම ද අඩු මට්ටමක පවතී.

අවදානම් බලපෑම් අනුකෘතිය



අවදානම් තක්සේරුව



උපායමාර්ගික අවදානම

1. වෙළෙඳපොළ අවදානම
2. තාක්ෂණික අවදානම
3. සමාජ-ආර්ථික සහ දේශපාලන අවදානම
4. තොරතුරු පද්ධති අවදානම

මෙහෙයුම් අවදානම

5. මෙහෙයුම් අවදානම
6. අභ්‍යන්තර පාලන අවදානම
7. මානව ප්‍රාග්ධනය සහ ශ්‍රම අවදානම
8. ප්‍රසම්පාදන අවදානම

මූල්‍ය අවදානම

9. ආයෝජන අවදානම
10. වංචා අවදානම

අනුකූලතා අවදානම

11. කීර්තිනාම අවදානම
12. අනුකූලතා අවදානම

අවදානම් කළමනාකරණය

අංකය	අවදානම	අවදානමේ බලපෑම/දැඩිකම			සිදුවියහැකි /වියහැකි සම්භාවිතාව			බලපෑම් අඩුකිරීමේ උපායමාර්ගය
		පහළ	මධ්‍යම	ඉහළ	පහළ	මධ්‍යම	ඉහළ	
01	වෙළෙඳපොළ අවදානම			✓		✓		ස්ථාවර ආදායම් කළඹේ කාලය මුසු කිරීම ස්ථාවර ආදායම් නිෂ්පාදන නිසිලෙස මුසු කිරීම කොටස් කළඹ විවිධාංගීකරණය
02	තාක්ෂණික අවදානම	✓				✓		තොරතුරු තාක්ෂණ උපස්ථ නිතිපතා පවත්වාගෙන යාම ආරක්ෂිත භාරකාරත්වය පවත්වා ගැනීම ලේඛන පරිලෝකනය කිරීම ප්‍රති-වයිරස කාලානුරූපව යාවත්කාලීන කිරීම
03	සමාජ-ආර්ථික සහ දේශපාලන අවදානම (කොවිඩ් 19 වැනි වසංගත)			✓	✓			ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම සකස් කිරීමේදී සමාජ-ආර්ථික සහ දේශපාලන සාධක ඇගයීම
04	තොරතුරු පද්ධති අවදානම			✓	✓			අතින් සිදුකරන DRP ක්‍රියාත්මක කිරීම ස්වයංක්‍රීය උපලේඛනගත උපස්ථ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම SSL සහතිකය ලබා ගෙන http සිට https දක්වා වීතැන්වීම ෆයර්වෝල් නිරීක්ෂණය කිරීම- පරිපාලක ද්වාර පුහුණුවක් සංවිධානය කිරීම
05	මෙහෙයුම් අවදානම	✓			✓			සේවකයින් නිතිපතා පුහුණු කිරීම ධනාත්මක ආකල්ප සහිත අදාළ කුසලතා සහ නිපුණතා ඇති පළපුරුදු සුදුසුකම්ලත් පුද්ගලයින් බඳවා ගැනීම. නිසි අභ්‍යන්තර පාලන පද්ධති
06	අභ්‍යන්තර පාලන අවදානම	✓			✓			අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් අභ්‍යන්තර පාලනයන් අධීක්ෂණය කිරීම
07	මානව ප්‍රාග්ධනය සහ ශ්‍රම අවදානම	✓				✓		නිසි අභිප්‍රේරණ ක්‍රමවේදයක් අනුගමනය කිරීම පුද්ගලයන් සඳහා නිවැරදි වෘත්තීය මාර්ගය කිසිදු බලපෑමකින් තොරව නිසි ආකල්පයකින් යුතු අවශ්‍ය නිපුණතාවය, කුසලතා ඇති පුද්ගලයින් බඳවා ගැනීම.
08	ප්‍රසම්පාදන අවදානම	✓			✓			සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා විනිවිද පෙනෙන ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම.
09	ආයෝජන අවදානම	✓			✓			විවිධ කාල නිෂ්පාදනවල පරිණත වීමට ආයෝජනය කිරීම කල්පිරීම් සහ එකතු කිරීම නැවත ආයෝජන අවස්ථා සමඟ සැලසුම් කිරීමට නියමිතය
10	වංචා අවදානම			✓	✓			අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් වංචා සිදුවියහැකි යයි සැක කළ හැකි ක්ෂේත්‍රවල නිරන්තර පදනමක් මත විගණන පවත්වනු ලැබීම
11	කීර්තිනාම අවදානම		✓		✓			මණ්ඩලයේ කාර්යසාධනය එහි අරමුණුවලට අනුකූල බව සහතික කිරීම සඳහා මාසික පදනමක් මත අයවැයගත ක්‍රියාවලියක් සහ අයවැයගත පාලනයක් තබා ගැනීම
12	අනුකූලතා අවදානම	✓			✓			අදාළ නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාව සහතික කිරීම



මූල්‍ය තොරතුරු

ලාභ හෝ අලාභ ගිණුම සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		සමූහය		මණ්ඩලය	
		2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31	2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31
			ප්‍රතිඵලාපනය කළ		ප්‍රතිඵලාපනය කළ
	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුළු ආදායම					
පොළී ආදායම	4	33,422,690	31,583,490	33,397,541	31,554,779
ශුද්ධ වෙළෙඳ ආදායම	5	237,141	(144,896)	-	-
ලාභාංශ ආදායම	6	442,950	481,081	442,950	481,081
ලාභ/අලාභ ගිණුම් මත මූලික වත්කම් සාධාරණ අගයට ගැළපීමෙන් ලද ලාභ/අලාභ	7	(142,983)	(388,437)	(142,983)	(388,437)
වෙනත් ආදායම්	8	1,059,896	445,951	1,031,958	429,011
		35,019,694	31,977,188	34,729,466	32,076,433
මුළු මෙහෙයුම් ආදායම					
සේවක මණ්ඩල වියදම්	9	1,370,236	1,370,681	1,290,108	1,292,861
පරිපාලන මණ්ඩල වියදම්	10	233,422	209,009	186,834	179,517
මූල්‍ය වියදම්	11	20,227	27,368	3,923	4,122
සාමාජික වියදම්	12	453,682	523,298	453,682	523,298
ක්ෂය වීම සහ ක්‍රමක්ෂය වීම	13	67,104	74,662	48,735	53,983
ප්‍රවර්ථන වර්ෂයේ සාමාජිකයින්ට ගෙවූ පොළිය		246,088	260,709	246,088	260,709
හානිකරණ අයකිරීම/(ආපසු හැරවීම)	14	(74)	399	(74)	399
වෙනත් වියදම්	15	69,496	98,718	-	-
		2,460,181	2,564,844	2,229,296	2,314,889
බදුවලට පෙර ලාභය		32,559,513	29,412,344	32,500,170	29,761,544
ආදායම් බදු වියදම	16	(4,542,879)	(4,155,085)	(4,492,839)	(4,242,123)
බදුවලට පසු ලාභය		28,016,633	25,257,259	28,007,331	25,519,421
පෙර වර්ෂයේ ලාභයට ගැලපීම		-	(108,073)	-	(108,073)
වර්ෂය සඳහා ලාභය		28,016,633	25,149,186	28,007,331	25,411,348
ලාභය ආරෝපනය					
සමාගම් කොටස් හිමියන්		28,015,703	25,175,402	28,007,331	25,411,348
පාලනයට ප්‍රයෝජනවත් නොවන අයිතීන්		930	(26,216)	-	-
වර්ෂය සඳහා ලාභය		28,016,633	25,149,186	28,007,331	25,411,348

ලාභ හෝ අලාභ ගිණුම සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		සමූහය		මණ්ඩලය	
		2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31	2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31
			ප්‍රතිඵලාපනය කළ		ප්‍රතිඵලාපනය කළ
	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000
අනෙකුත් විස්තීර්ණ ආදායම					
විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට වර්ගීකරණය කළ හෝ කළ හැකි අයිතම					
වෙනත් විස්තරාත්මක සංචිත (කොටස්) තුළින් සාධාරණය අගයට මාරු කිරීම		(586,588)	(8,665)	(586,588)	(8,665)
වෙනත් විස්තරාත්මක සංචිත (ණයකර) තුළින් සාධාරණය අගයට මාරු කිරීම		22,610	1,513	22,610	1,513
විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට වර්ගීකරණය නොකළ අයිතම					
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මුදල මත ආයුගණනක ලාභය/(අලාභය)		(45,601)	(41,900)	(45,601)	(41,900)
වර්ෂය සඳහා වෙනත් අනෙකුත් විස්තීර්ණ ආදායම/ (වියදම) මත ආදායම් බදු		-	-	-	-
වර්ෂය සඳහා වූ බදු පසු වෙනත් මුළු විස්තීර්ණ ආදායම		(609,579)	(49,053)	(609,579)	(49,053)
වර්ෂය සඳහා වූ බදු පසු මුළු විස්තීර්ණ ආදායම		27,407,054	25,100,133	27,397,752	25,362,295
විභජනය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම					
සමාගමේ කොටස් හිමිකරුවන්		27,406,124	25,126,349	27,397,752	25,362,295
පාලන නොවන අයිතිය		930	(26,216)	-	-
බදු වලට පසු වර්ෂය සඳහා වූ මුළු විස්තරාත්මක ආදායම		27,407,054	25,100,133	27,397,752	25,362,295
ඉ/ගෙ රඳවාගත් ලාභය		3,680,717	3,699,948	3,214,003	2,929,788
අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගය යටතේ නිශ්චය කරන ලද මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය)		259,293	2,077	259,293	2,077
විසර්ජනය සඳහා වූ ලාභය		28,016,633	25,149,186	28,007,331	25,411,348
විසර්ජනය සඳහා වූ මුළු ලාභය		31,956,643	28,851,211	31,480,627	28,343,213
අඩුකලා :යෝජිත විසර්ජනය - ලාභාංශය 5.0% (2019 - 5.0%)		(17,371,087)	(15,705,756)	(17,371,087)	(15,705,756)
පොලී ආදායම - 3%		(10,422,652)	(9,423,454)	(10,422,652)	(9,423,454)
අඩුකලා :ලාභාංශය - ලංකා ලුනු සමාගම		-	(67,500)	-	-
අඩුකලා :පාලන නොවන අයිතිය		(930)	26,216	-	-
විසර්ජනයෙන් පසු ලාභය		4,161,973	3,680,717	3,686,887	3,214,003

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට		සමූහය		මණ්ඩලය	
		2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31	2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31
			ප්‍රතිඡ්ඨාපනය කළ		ප්‍රතිඡ්ඨාපනය කළ
	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්					
මුදල් හා මුදලට සමාන දෑ		718,088	591,254	680,784	548,572
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම්	17	2,930,900	2,699,451	2,930,900	2,699,451
පරිපාලිතය සමාගමෙහි ආයෝජන	18	-	-	470,961	470,961
වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම්	19	7,638,149	7,899,643	7,638,149	7,899,643
ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම්	20	361,008,932	324,974,213	360,695,932	324,688,318
වෙනත් වත්කම්	21	3,137,957	3,454,166	2,621,831	2,839,598
දේපල, පිරියත හා උපකරණ	22	1,083,679	1,259,768	299,275	364,213
කල්බදු දේපල	23	2,788	3,485	-	-
අස්පෘශ්‍ය වත්කම්	24	743	1,039	743	1,039
ආයෝජන දේපල	25	4,587,406	3,813,493	4,587,406	3,813,493
මුළු වත්කම්		381,108,643	344,696,512	379,925,982	343,325,287
වගකීම්					
පොළිය දරන ණය සහ ණය ගැනුම්	26	77,285	199,354	-	-
ප්‍රදාන සහ සහනාධාර	27	28,073	29,137	-	-
නිශ්චිත ප්‍රතිලාභ බැරකම්	28	513,974	477,383	286,616	252,600
ප්‍රවර්ථන බදු වගකීම්	29	2,596,843	1,940,265	2,596,843	1,940,265
අනෙකුත් වගකීම්	30	380,382	515,545	161,922	175,542
විලම්භිත බදු වගකීම්	31	51,283	7,050	-	-
වෙන් කිරීම්	32	301,945	104,603	301,945	104,603
මුළු වගකීම්		3,949,784	3,273,335	3,347,325	2,473,010
මුළු ශුද්ධ වත්කම්		377,158,858	341,423,177	376,578,656	340,852,277
සාමාපික අරමුදල	33	375,215,484	339,244,338	375,215,484	339,244,338
සංචිත		1,838,258	2,074,653	1,363,172	1,607,939
පාලනය නොවන අයිතිය		105,116	104,186	-	-
සාමාපිකයින්ට අයත්වන ශුද්ධ වත්කම්/පාලනය නොවන අයිතිය		377,158,858	341,423,177	376,578,656	340,852,277

පිටු අංක 66 සිට 95 තුළ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

නිවැරදි බවට සහතික කළේ

(අත්සන් කළේ.)
එම්.ඒ.වී.කුමුදිනී
මූල්‍ය කළමනාකාරිනී

(අත්සන් කළේ.)
පී.ඒ.එස්. සුමනසේන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූදල්)

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදි.

(අත්සන් කළේ.)
ඩී.පී.පී. ප්‍රනාන්දු
සාමාන්‍යාධිකාරී

(අත්සන් කළේ.)
ශ්‍රියාන් ද සිල්වා විජයරත්න
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

ස්ථාවර වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට

රු. '000

සමූහය	මණ්ඩලයේ සාමාජිකයින්ට අයිති						
	රඳවාගත් ලාභ	විකුණුම් සඳහා ලබ හැකි සංචිත	වෙනත් සංචිත	ලාභාංශ සැමයිම් සංචිත අරමුදල	පශ්චාත් අත්කර ගැනීමේ සංචිත	පාලනය නොවන අයිතිය	එකතුව
2019.01.01 දිනට ශේෂය	2,929,788	(1,779,750)	(27,334)	142,000	770,160	137,902	2,172,766
අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් නැවත මැනීම මත ශුද්ධ සාධාරණ ලාභ/(අලාභ)	-	(7,153)	-	-			(7,153)
පෙර වසරේ දායක මුදල් ගැලපීම	-	-	-	-			-
සාමාජික අරමුදල් ශේෂය මත පොළිය 3%	(9,423,454)	-	-	-			(9,423,454)
ලාභාංශ 5%	(15,705,756)	-	-	-			(15,705,756)
වසර සඳහා සමුච්චිත ලාභය	25,519,421	-	-	-		(26,216)	25,493,205
අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය යටතේ නම්කළ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ ලාභ/(අලාභ)	2,077	-	-	-			2,077
උපචිත ලාභ/(අලාභ)	-	-	(41,900)	-			(41,900)
පරිපාලිතයෙන් ගෙවූ ලාභාංශ						(7,500)	(7,500)
පරිපාලිත ස්කන්ධය තුළ වෙනස්වීම					(303,446)		(303,446)
2019.12.31 දිනට ශේෂය	3,322,075	(1,786,902)	(69,234)	142,000	466,714	104,186	2,178,839
පෙර වසරේ ගැලපීම	(108,073)	-	-	-	-	-	(108,073)
2019.12.31 දිනට ගලපන ලද ශේෂය	3,214,003	(1,786,902)	(69,234)	142,000	466,714	104,186	2,070,766
වෙනත් විස්තරාත්මක ආදායම් තුළින් සාධාරණ අගයට ක්‍රමක්ෂය කළ මූල්‍ය වත්කම් නැවත මැනීම මත ශුද්ධ සාධාරණ ලාභ/(අලාභ)	-	(563,978)	-	-			(563,978)
සාමාජික අරමුදල් ශේෂය මත පොළිය 3%	(10,422,652)	-	-	-			(10,422,652)
ලාභාංශ 5%	(17,371,087)	-	-	-			(17,371,087)
වසර සඳහා සමුච්චිත ලාභය	28,007,331	-	-	-		930	28,008,262
අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය යටතේ නම්කළ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ ලාභ/(අලාභ)	259,293	-	-	-			259,293
උපචිත ලාභ/(අලාභ)	-	-	(45,601)	-			(45,601)
පරිපාලිතයෙන් ගෙවූ ලාභාංශ							-
පරිපාලිත ස්කන්ධය තුළ වෙනස්වීම					8,372		8,372
2020.12.31 දිනට ශේෂය	3,686,887	(2,350,880)	(114,835)	142,000	475,086	105,116	1,943,374

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට

රු. '000

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	මණ්ඩලයේ සාමාජිකයින්ට අයිති				
	රඳවාගත් ලාභ	වෙනත් විස්තරාත්මක ආදායම් සංචිතය තුළින් සාධාරණ අගය	වෙනත් සංචිත	ලාභාංශ සැමයිම් සංචිත අරමුදල	එකතුව
2019.01.01 දිනට ශේෂය	2,929,788	(1,779,750)	(27,334)	142,000	1,264,704
අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් නැවත මැනීම මත ශුද්ධ සාධාරණ ලාභ/(අලාභ)	-	(7,153)	-	-	(7,153)
පෙර වසරේ දායක මුදල් ගැලපීම	-	-	-	-	-
සාමාජික අරමුදල් ශේෂය මත පොළිය 3%	(9,423,454)	-	-	-	(9,423,454)
ලාභාංශ 5%	(15,705,756)	-	-	-	(15,705,756)
වසර සඳහා සමුච්චිත ලාභය	25,519,421	-	-	-	25,519,421
අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය යටතේ නම්කළ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ ලාභ/(අලාභ)	2,077	-	-	-	2,077
උපචිත ලාභ/(අලාභ)	-	-	(41,900)	-	(41,900)
2019.12.31 දිනට ශේෂය	3,322,075	(1,786,902)	(69,234)	142,000	1,607,939
පෙර වසරේ ගැලපීම	(108,073)	-	-	-	(108,073)
2019.12.31 දිනට ගලපන ලද ශේෂය	3,214,003	(1,786,902)	(69,234)	142,000	1,499,866
අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් නැවත මැනීම මත ශුද්ධ සාධාරණ ලාභ/(අලාභ)	-	(563,978)	-	-	(563,978)
සාමාජික අරමුදල් ශේෂය මත පොළිය 3%	(10,422,652)	-	-	-	(10,422,652)
ලාභාංශ 5%	(17,371,087)	-	-	-	(17,371,087)
වර්ෂයේ සමුච්චිත ලාභය	28,007,331	-	-	-	28,007,331
අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය යටතේ නම්කළ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ ලාභ/(අලාභ)	259,293	-	-	-	259,293
ආයුගණක ලාභය/පාඩුව	-	-	(45,601)	-	(45,601)
2020.12.31 දිනට ශේෂය	3,686,887	(2,350,880)	(114,835)	142,000	1,363,172

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සමූහය		මණ්ඩලය	
	2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31	2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක අලෙවියෙන් ලත් මුදල	1,105,330	263,759	1,105,330	263,759
ක්‍රමක්ෂය පිරිවැයට නම්කළ මූල්‍ය උපකරණවල කල්පිරීම්	58,633,298	128,394,676	58,633,298	128,394,676
ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරකවල කල් පිරීම්	177,043	124,578	177,043	124,578
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය උපකරණ මිලදි ගැනීම් සඳහා ගෙවීම	(1,524,550)	(828,966)	(1,524,550)	(828,966)
ක්‍රමක්ෂය පිරිවැයට නම්කළ මූල්‍ය උපකරණ මිලදි ගැනීම සඳහා ගෙවීම	(97,052,503)	(160,674,715)	(97,052,503)	(160,674,715)
ණය සහ ලැබීම් මූල්‍ය උපකරණ සඳහා ලබාදෙන ලද ණය	(394,438)	(239,676)	(394,438)	(239,676)
පාරිභෝගිකයින්ගෙන් ලද මුදල්	1,250,297	1,748,418	-	-
සැපයුම්කරුවන්ට ගෙවූ මුදල්	(1,068,145)	(1,711,011)	-	-
ලද පොළිය	35,910,067	31,440,122	35,910,067	31,440,122
ලද ලාභාංශ	438,677	291,553	438,677	291,553
ලද වෙනත් ආදායම්	218,474	399,859	218,474	399,859
ගෙවූ මෙහෙයුම් වියදම්	(1,296,951)	(1,221,942)	(1,296,951)	(1,221,942)
ගෙවූ සාමාජික වියදම්	(236,276)	(332,405)	(236,276)	(332,405)
ගෙවූ ආදායම් බදු	(3,649,906)	(4,690,504)	(3,649,906)	(4,690,504)
ගෙවූ පොළිය	(262,393)	(283,956)	(246,088)	(260,709)
ගෙවූ නීර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	(11,501)	(12,591)	-	-
ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ගෙවූ බිම් කුලිය	(1,458)	(9,477)	-	-
වසර 5 ශිෂ්‍යත්ව ගෙවීම/ආපසු ගෙවීම	(95,883)	(92,207)	(95,883)	(92,207)
උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම	(12,252)	(71,616)	(12,252)	(71,616)
මෙහෙයුම් ක්‍රියාකාරම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	(7,873,071)	(7,506,101)	(8,025,958)	(7,498,194)
ආයෝජන ක්‍රියාකාරකම්				
දේපල සහ උපකරණ මිලදී ගැනීම	(22,114)	(274,412)	(16,873)	(249,515)
දේපල සහ උපකරණ විකිණීමෙන් ලත් මුදල	956	2,595	-	38
ආයෝජන අත්කරගැනීම	(25,431)	(26,421)	-	-
ලද ලාභාංශ	25,149	28,711	-	-
සේවක ණය ශුද්ධ (ප්‍රදාන)/නැවත ගෙවීම්	(1,674)	707	-	-
ආයෝජන ක්‍රියාකාරම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	(23,114)	(268,819)	(16,873)	(249,477)
මූල්‍ය ක්‍රියාකාරකම්				
ලද දායක මුදල්	26,745,015	27,366,900	26,745,015	27,366,900
ආපසු ගෙවීම්	(18,567,668)	(19,806,558)	(18,567,668)	(19,806,558)
ගෙවූ මූල්‍ය වියදම්	(2,303)	(2,168)	(2,303)	(2,168)
ගෙවූ ලාභාංශ	(30,000)	(16,950)	-	-
පොළිය දරන ණය සහ ණයගැනීම් ආපසු ගෙවීම	-	-	-	-
මූල්‍ය කල්බදු වගකීම යටතේ මූලික මුදල ගෙවීම	(5,719)	(6,757)	-	-
මූල්‍ය ක්‍රියාකාරම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	8,139,325	7,534,466	8,175,044	7,558,173
මුදල් හා මුදලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	243,140	(240,454)	132,212	(189,499)
ජනවාරි 1 දිනට මුදල් හා මුදලට සමාන දෑ	403,755	644,209	548,572	738,070
දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදලට සමාන දෑ	646,895	403,755	680,784	548,572

භාණ්ඩාගාර බැඳුම්කර කළඹේ වෙළෙඳපොල අගය

2020/12/31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල වටිනාකම

(රු. '000)

වර්ෂය	ප්‍රකාශිත අගය	මිලදී ගැනීමේ පිරිවැය	වෙළෙඳපොල අගය	ක්‍රමක්ෂය පිරිවැය
2020	-	-	-	-
2021	13,239,550	13,372,115	13,921,434	13,651,748
2022	69,732,096	74,848,201	77,305,262	73,869,659
2023	32,955,648	36,363,123	37,333,199	35,426,071
2024	15,276,181	15,086,700	17,198,208	15,659,742
2025	29,360,884	29,613,683	34,862,666	30,515,199
2026	25,485,000	24,345,961	30,932,145	25,505,227
2027	31,253,141	32,418,470	38,850,290	33,072,465
2028	28,289,079	28,655,815	35,322,342	29,615,507
2029	6,825,000	7,329,674	9,389,016	7,426,281
2030	7,518,684	7,988,339	9,304,702	8,072,400
2031	6,050,000	6,050,564	7,706,375	6,257,923
2033	5,126,118	5,247,410	6,733,951	5,504,020
2034	2,825,000	2,816,447	3,456,727	2,902,443
2035	1,426,190	1,522,598	1,894,193	1,568,512
2039	7,600,000	7,676,208	9,736,086	7,979,900
	282,962,571	293,335,308	333,946,596	297,027,099

2019/12/31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල අගය

(රු. '000)

වර්ෂය	ප්‍රකාශිත අගය	මිලදී ගැනීමේ පිරිවැය	වෙළෙඳපොල අගය	ක්‍රමක්ෂය පිරිවැය
2020	1,310,000	1,365,396	1,335,713	1,335,321
2021	13,239,550	13,372,115	13,860,496	13,682,113
2022	68,269,879	73,360,994	73,123,533	73,127,161
2023	25,110,648	28,278,398	27,270,181	27,616,846
2024	8,676,181	8,400,597	9,371,265	8,845,772
2025	28,520,884	28,761,978	30,483,022	29,676,115
2026	20,985,000	19,762,773	23,012,067	20,653,649
2027	22,984,641	23,661,163	25,467,253	24,219,823
2028	25,089,079	25,355,084	27,271,366	26,190,411
2029	6,825,000	7,329,674	8,161,029	7,456,998
2030	1,268,684	1,330,930	1,358,369	1,348,831
2031	6,050,000	6,050,564	6,687,505	6,257,729
2033	5,126,118	5,247,410	5,766,014	5,508,219
2034	2,825,000	2,816,447	2,917,752	2,902,226
2035	1,426,190	1,522,598	1,601,667	1,571,192
2039	7,600,000	7,676,208	8,011,520	7,980,157
	245,306,854	254,292,327	265,698,750	258,372,563

රජයේ සුරැකුම්පත්වල සාධාරණ අගය මහ බැංකුව විසින් ප්‍රකාශිත පිළිවෙලින් 2019 සහ 2020 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනීමේ හා විකිණීමේ මිලගණන්වල සාමාන්‍යයන් මත පදනම් වේ.

ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල අගය

2020/12/31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල අගය

සමාගමේ නම	මිලදී ගත් දිනය	නිදහස් කරගත් දිනය	ණයකර ගණන.	ණයකර පිරිවැය රු. '000	විකුණුම් කරයට	වෙළෙඳපොල අගය රු. '000	වෙළෙඳපොල අගය අනුපාතය (වාර්ෂික)	ක්‍රමක්ෂය පිරිවැය රු. '000
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්	28.10.2016	27.10.2021	1,494,900	149,490	90.00	134,541	12.00%	152,685
හැටන් නැෂනල් බැංකුව	01.11.2016	01.11.2023	547,100	54,710	107.19	58,644	13.00%	55,899
පීපල්ස් ලිසින් ෆිනෑන්ස් පීඑල්සී	16.11.2016	16.11.2021	4,000,000	400,000	100.00	400,000	12.60%	406,352
එල් බී ෆිනෑන්ස් පීඑල්සී	11.12.2017	11.12.2022	2,000,000	200,000	100.00	200,000	12.75%	201,397
පීපල්ස් ලිසින් ෆිනෑන්ස් පීඑල්සී	18.04.2018	18.04.2023	5,000,000	500,000	100.00	500,000	12.80%	545,238
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්.	23.07.2018	22.07.2023	1,859,700	185,970	100.00	185,970	12.00%	195,814
සම්පත් බැංකුව පීඑල්සී	28.02.2019	28.02.2024	1,750,000	175,000	114.32	200,060	13.90%	195,460
සීඒෆ්සීසී බැංකුව පීඑල්සී	28.03.2019	28.03.2024	7,500,000	750,000	100.00	750,000	13.50%	827,394
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	10.09.2019	10.09.2024	13,500,000	1,350,000	100.00	1,350,000	11.25%	1,397,019
හැටන් නැෂනල් බැංකුව පීඑල්සී	23.09.2019	22.09.2024	3,500,000	350,000	100.00	350,000	12.30%	361,795
ජතික සංවර්ධන බැංකව පීඑල්සී	24.09.2021	24.09.2025	4,750,000	475,000	100.00	475,000	9.50%	487,116
සීඒෆ්සීසී බැංකුව පීඑල්සී	23.10.2021	23.10.2025	5,000,000	500,000	100.00	500,000	9.00%	508,630
එකතුව				5,090,170		5,104,215		5,334,797

ලැයිස්තුගත කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2020 දෙසැම්බර් 31 දිනට මිලගණන් මත පදනම් වේ.

2019/12/31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල වටිනාකම

සමාගමේ නම	මිලදී ගත් දිනය	නිදහස් කරගත් දිනය	ණයකර ගණන.	ණයකර පිරිවැය රු. '000	විකුණුම් කරයට	වෙළෙඳපොල වටිනාකම රු. '000	වෙළෙඳපොල වටිනාකම අනුපාතය (වාර්ෂික)	ක්‍රමක්ෂය පිරිවැය රු. '000
ජතික සංවර්ධන බැංකව පීඑල්සී	24.06.2015	24.06.2020	6,000,000	600,000	87.00	522,000	9.40%	653,580
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්	28.10.2016	27.10.2021	1,494,900	149,490	90.00	134,541	12.00%	152,685
හැටන් නැෂනල් බැංකුව	01.11.2016	01.11.2023	547,100	54,710	100.00	54,710	13.00%	55,899
පීපල්ස් ලිසින් ෆිනෑන්ස් පීඑල්සී	16.11.2016	16.11.2021	4,000,000	400,000	100.00	400,000	12.60%	406,352
එල් බී ෆිනෑන්ස් පීඑල්සී	11.12.2017	11.12.2022	2,000,000	200,000	100.00	200,000	12.75%	201,467
පීපල්ස් ලිසින් ෆිනෑන්ස් පීඑල්සී	18.04.2018	18.04.2023	5,000,000	500,000	100.00	500,000	12.80%	545,238
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්.	23.07.2018	22.07.2023	1,859,700	185,970	100.00	185,970	12.00%	195,875
සම්පත් බැංකුව පීඑල්සී	28.02.2019	28.02.2024	1,750,000	175,000	104.85	183,488	13.90%	195,460
සීඒෆ්සීසී බැංකුව පීඑල්සී	28.03.2019	28.03.2024	7,500,000	750,000	100.00	750,000	13.50%	827,394
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	10.09.2019	10.09.2024	13,500,000	1,350,000	100.00	1,350,000	11.25%	1,397,019
හැටන් නැෂනල් බැංකුව පීඑල්සී	23.09.2019	22.09.2024	3,500,000	350,000	100.00	350,000	12.30%	361,795
එකතුව				4,715,170		4,630,709		4,992,762

ලැයිස්තුගත කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2019 දෙසැම්බර් 31 දිනට මිලගණන් මත පදනම් වේ.

ස්කන්ධ ආයෝජන ප්‍රකාශය

2020 දෙසැම්බර් මස 31 දිනට වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය මත නැවත වර්ගීකරණය කරන ලද ලැයිස්තු ගත කොටස් වෙළඳපොල

	ආයෝජන සමාගමේ නම	සත්‍ය පිරිවැය	සාධාරණ අගය	වෙළෙඳපොල අගය 2020.12.31
		රු. '000	රු. '000	රු. '000
1	ඒසීවල් කේබල්ස් පීවිල්සී	27,384	29,519	42,097
2	ඒහොට් දේපල සමාගම	58,213	31,083	32,925
3	එයිටිකන් ස්පෙන්ස් පීවිල්සී	381,225	123,228	151,282
4	එයිටිකන් ස්පෙන්ස් හොටෙල් එව් පීවිල්සී	206,275	64,246	78,233
5	ආසිරි සර්පිකල් පීවිල්සී	6,066	6,066	10,421
6	බහිරහා ෆාර්ම් පීවිල්සී	287,633	137,751	167,989
7	කාසන් කම්බර්බැච් පීවිල්සී	16,147	8,088	10,038
8	සෙන්ට්‍රල් ෆිනෑන්ස්	261,647	249,321	193,925
9	සිලෝන් ඉන්වෙස්ට්මන්ට්	8,575	3,636	5,221
10	සිලෝන් ගාර්ඩියන් ඉන්වෙස්ට්මන්ට්	143,302	44,828	62,602
11	කලම්බු පෝර්ට් ලෑන්ඩ් පීවිල්සී	55,327	9,240	9,030
12	කොම් බෑන්ක් පීවිල්සී	1,152,796	808,502	690,080
	කොම් බෑන්ක් (X) පීවිල්සී	478,660	326,508	271,072
13	ඩිවිත්සීසී බැංකුව පීවිල්සී	648,946	368,487	260,758
14	ඩොක්යාර්ඩ් පීවිල්සී	437,865	107,673	150,916
15	ඩයලොග් ඇක්සියටා පීවිල්සී	278,071	281,680	299,622
16	ඊඩන් හෝටෙල්ස් පීවිල්සී	75,885	29,266	17,876
17	එව්විත්බී පීවිල්සී	5,270	5,270	5,774
	එව්විත්බී (X) පීවිල්සී	131,288	107,511	88,956
18	එව්විත්බී ඇෂුවරන්ස් පීවිල්සී	36,455	36,455	52,618
19	ජෝන් කීල්ස් පීවිල්සී	15,800	8,329	10,454
20	ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීවිල්සී	2,836,575	2,873,826	2,576,118
21	කැලණි කේබල්ස් පීවිල්සී	5,368	5,094	6,873
22	ලංකෙම් සිලෝන් පීවිල්සී	16,823	2,098	2,715
23	ලංකා අයිඕසී පීවිල්සී	14,207	14,207	20,124
24	ලාෆ් ගෑස් පීවිල්සී	815	806	1,221
25	ලාෆ් පවර් පීවිල්සී	815	230	461
26	එන්ඩීබී බැංකුව පීවිල්සී	1,121,311	906,433	706,251
27	ඕවර්සීස් රියලිටි පීවිල්සී	31,238	31,238	32,910
28	පීපල්ස් ලීසින් සමාගම පීවිල්සී	136,251	121,282	108,813
27	පීපල්ස් ඉන්ෂුවරන්ස් පීවිල්සී	34,464	34,464	43,580
29	ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් පීවිල්සී	5	43	40
30	රේණුක හෝල්ඩින්ග්ස් පීවිල්සී	114,532	56,538	44,006
31	රිසස් එනර්පි පීවිල්සී	61,415	53,852	57,975
32	රිචර්ඩ් පීරිස් කම්පැනි පීවිල්සී	12,302	12,302	18,542
33	රෝයල් සෙරමික්ස් පීවිල්සී	51,683	46,044	106,772
34	සම්පත් බැංකුව පීවිල්සී	403,072	345,770	313,091
35	සෙලාන් බැංකුව පීවිල්සී	361,424	232,407	201,661
	සෙලාන් බැංකුව (X) පීවිල්සී	75,925	49,751	50,619
36	සින්ගර් ෆිනෑන්ස් පීවිල්සී	23,608	15,202	17,423
37	ශ්‍රී ලංකා ටෙලිකොම් පීවිල්සී	110,326	105,670	111,284
38	ට්‍රාන්ස් ඒෂියා පීවිල්සී	37,073	39,864	37,748
39	වැලිබල් පවර් පීවිල්සී	47,195	32,746	41,062
40	වැලිබල් වන් පීවිල්සී	43,277	30,137	44,431
	එකතුව	10,252,535	7,796,691	7,155,610

2020 දෙසැම්බර් මස 31 දිනට වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය මත නොවත වර්ගීකරණය කරන ලද ලැයිස්තු ගත නාවන කොටස් වෙළඳපොල ආයෝජන

	සමාගමේ නම	පිරිවැය	ශුද්ධ වත්කම් අගය 2019.12.31	ශුද්ධ වත්කම් අගය 2020.12.31
		රු. '000	රු. '000	රු. '000
1	ෆිට්ච් රේටින් ලංකා ලිමිටඩ්	1,649	2,856	3,880
2	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් ලිමිටඩ්	73,650	216,905	263,434
	එකතුව	75,299	219,761	267,314

2020.12.31 දිනට පරිපාලිත සමාගමේ ආයෝජන

	සමාගමේ නම	පිරිවැය
		රු. '000
3	ලංකා සෝල්ට් ලිමිටඩ්	470,961
	එකතුව	470,961

2020.12.31 දිනට ලාභ හෝ අලාභ තුළින් සාධාරන අගය මත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත කොටස් ආයෝජනය

	සමාගමේ නම	සත්‍ය පිරිවැය	සාධාරණ අගය	වෙළෙඳපොල අගය 2020.12.31
		රු. '000	රු. '000	රු. '000
1	ඒසීඒ කේබල්ස් පීඑල්සී	29,075	28,467	37,631
2	කොම් බෑංකුව පීඑල්සී	1,387,640	999,190	859,909
	කොම් බෑංකුව (X) පීඑල්සී	151,826	119,326	99,066
3	ඩයලොග් ඇක්සියටා පීඑල්සී	192,048	191,200	208,782
4	එච්එන්බී පීඑල්සී	680,702	605,803	532,010
	එච්එන්බී (X) පීඑල්සී	155,795	131,706	115,367
5	ජෝන් කීල්ස් හොල්ඩින්ග්ස් පීඑල්සී	224,631	251,456	244,579
6	ලංකා අයිඕසී පීඑල්සී	104,371	57,429	65,086
7	ලාෆ් ගෑස් පීඑල්සී	3,196	2,786	4,220
8	ලාෆ් පවර් පීඑල්සී	3,196	796	1,592
9	පීපල්ස් ලීසින් පීඑල්සී	4,369	4,369	4,292
11	සම්පත් බැංකුව පීඑල්සී	888,305	663,786	585,018
12	සෙලාන් බැංකුව පීඑල්සී	79,221	56,359	48,904
	සෙලාන් බැංකුව (X) පීඑල්සී	123,316	89,047	90,600
13	සිංගර් ෆිනෑන්ස් පීඑල්සී	48,443	29,530	33,846
	එකතුව	4,076,133	3,231,251	2,930,900

2020.12.31 දිනට ලැයිස්තුගත ඒකක භාර

	වර්ගය	සත්‍ය පිරිවැය	සාධාරණ අගය	වෙළෙඳපොල අගය 2020.12.31
		රු. '000	රු. '000	රු. '000
1	කොමිට්‍රස්ට් කොටස් අරමුදල	14,261	23,661	23,704
2	නැෂනල් ස්කන්ධ අරමුදල	41,681	116,962	134,303
3	නාමල් වර්ධන අරමුදල	4,500	51,992	57,218
	එකතුව	60,442	192,615	215,225

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සාංගමික තොරතුරු

1.1. නීත්‍ය පිහිටීම සහ නෛතිකභාවය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය (ETFB) 1980 අංක 46 දරන පනතින් ස්ථාපිත රජයට අයත් ව්‍යවසායක් වන අතර, 1981 මාර්තු 01 දින මෙහෙයුම් ආරම්භ කරන ලදී. මණ්ඩලය මුදල් අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වේ.

ලංකා ලුනු සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත, නීත්‍ය පදිංචිය සහිත පොදු සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි ලිපිනය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හම්බන්තොට මහලේවාය යන ස්ථානයේ ලිහිටා ඇත.

1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

වසර තුළ, මෙම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මණ්ඩලයේ සහ එහි පරිපාලන සමාගම්වල ප්‍රධාන කටයුතු පහත පරිදි වේ:

සමාගමේ නම	ව්‍යාපාර ස්වභාවය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	රජයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ හිමිකම් නොලබන රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර, ඔවුන්ගේ සේවා යෝජකයින් සිය සේවකයින්ගේ දළ ඉපයීම්වලින් 3% ක් මාසිකව අරමුදල වෙත ප්‍රේෂණය කිරීම අවශ්‍යය. සංක්‍රමණ සහ ස්වයං-රැකියාලාභී අංශවල සේවකයින්ට ද අරමුදල වෙත විශේෂිත අවම දායක මුදලක් ගෙවීම මගින් ස්වේච්ඡා පදනම මත අරමුදලේ සාමාජිකයින් විය හැකිය. අරමුදල කළමනාකරණය කිරීමට අමතරව, ETF මණ්ඩලය සේවකයින්ට ඔවුන්ගේ සේවා කාලය තුළ සමාපිය සහ සුභසාධන ප්‍රතිලාභ රාශියක් ලබා දේ.
ලංකා ලුනු සමාගම	සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යය ලුනු නිෂ්පාදනය සහ බෙදාහැරීමයි.

1.3. මව් ව්‍යවසාය සහ අත්‍යන්ත මව් ව්‍යවසාය

සමාගම සතු අත්‍යන්ත මව් ව්‍යයසායක් නොමැත - ETFB මව් සමාගම වේ.

1.4. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වගකීම

ETFB හි අධ්‍යක්ෂ මණ්ඩලය 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS) අනුව සමූහයේ සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

1.5. නිකුතුව සඳහා බලය ලබාදුන් දිනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 29 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුකූලව නිකුතුව සඳහා බලය ලබා දෙන ලදී.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සම්පිණ්ඩනය

2.1. පොදු ප්‍රතිපත්ති

2.1.1. මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කරන ආයතනයේ වත්කම් සහ වගකීම් ස්වභාවය අනුව කාණ්ඩගත කර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය පිළිබිඹු කරන පරිදි ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. වාර්තා කරන දිනයෙන් මාස 12ක් තුළ සහ මාස 12ට වැඩි කාලයකින් පසුව අයකිරීම හෝ නිරවුල් කිරීම පිළිබඳ විශ්ලේෂණයක් මෙහි ඉදිරිපත් කරනු ලැබේ.

2.1.2. අනුකූලතා ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (LKAS/SLFRS) අනුකූල වේ.

ලංකා ලුනු සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS for SMEs) අනුව පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

2.1.3. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

මණ්ඩලය අනාගතය සම්බන්ධයෙන් යම් යම් ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකරයි. ඇස්තමේන්තු සහ විනිශ්චයන් අනාගතයේ අපේක්ෂාවන් ඇතුළුව ඓතිහාසික පලපුරුද්ද සහ වෙනත් සාධක මත පදනම් වී අඛණ්ඩව ඇගයීමට ලක් කරයි.

සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ලංකා ලුනු සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්මේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලිය තුළ කළමනාකරණයට එහි විනිශ්චයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වේ. විනිශ්චය හෝ සංකීර්ණතාවයේ ඉහළ මට්ටමක් සම්බන්ධවන ක්ෂේත්‍ර හෝ උපකල්පන සහ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවලට වැදගත් වන ක්ෂේත්‍ර පහත පරිදි අනාවරණය කෙරේ.

විනිශ්චයන්

විලම්බිත බදු වත්කම්:

සියලු ආභාවිත බදු අලාභ වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ, අලාභ උපයෝජනය කොටගත හැකි බදු අයකර ගත හැකි අලාභ වල්ලේ ඒවා පවතිනු ලැබෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට ය. හඳුනා ගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස ඉදිරි බදු සැලසුම්කරණයෙහි මූලොපායන් ද සහිත අනාගත බදු අයකර ගත හැකි ලාභ ප්‍රමාණ උද්ගත විය හැකි කාල නිර්ණය හා ඒවායේ මට්ටම මත පදනම් වූ වැදගත් කළමනාකරණ නිශ්චයමතියක් අවශ්‍ය වේ.

2.1.4. මානනය කිරීමේ පදනම

ඇතැම් වත්කම් හා බැරකම් හැරුණු විට මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික සම්මුතිය යටතේ සාධාරණ අගය මත පිළියෙළ කරනු ලැබ ඇත.

ලංකා ලුනු සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමක් මත පිළියෙල කරනු ලැබ ඇත.

2.1.5. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මණ්ඩලය ක්‍රියාත්මක මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල වන, ශ්‍රී ලංකා රුපියල්වලින් අගය කර ඉදිරිපත් කරනු ලබයි.

2.1.6. වැටයිම

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණයන් "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" (LKAS 1) පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 විසින් අවසර දී ඇති පරිදි සඳහන් කර ඇති අවස්ථා හැර ආසන්න රුපියල් දහසට වටයා ඇත.

2.1.7. හිලව් කිරීම

ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපනයක් (IFR අර්ථ නිරූපන කමිටුව සහ ප්‍රමිති අර්ථ නිරූපන කමිටුව විසින් නිකුත් කළ) විසින් අවශ්‍යනම් හෝ අවසර දී ඇතිනම් මිස, ආදායම් සහ වියදම් ආදායම් ප්‍රකාශය තුළ හිලව් නොකෙරේ. හඳුනාගත් ප්‍රමාණ හිලව් කිරීමට නෛතිකව බලාත්මක අයිතියක් ඇත්නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ එකවර වත්කම් මුදාහැර වගකීම් නිරවුල් කිරීමේ අභිප්‍රායක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ ප්‍රමාණය SOFP හි වාර්තා කරයි.

2.1.8. ප්‍රමාණාත්මකබව සහ සමූහනය

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරිත්වය පිළිබඳ අයිතම LKAS 1 විසින් සහ 2016 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ "අනාවරණ මුල්පිරීම" පිළිබඳ LKAS 10 සංශෝධන විසින් අවසර දී ඇති පරිදි වෙන් වැදගත් නොවන්නේම් මිස වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.1.9. අඛණ්ඩතා පැවැත්ම

ETF මණ්ඩලයේ කළමනාකරණය අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට එහි හැකියාව පිළිබඳව තක්සේරු කිරීමක් කර ඇති අතර, දැකිය හැකි අනාගතයක් සඳහා ව්‍යාපාරය කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමට පත් වේ. තවද, අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට මණ්ඩලයේ හැකියාව මත සැලකියයුතු සැකයක් ඇති කරන යම් වැදගත් අවිනිශ්චිතතාව පිළිබඳව කළමනාකරණය දැනුවත් නැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩතා පදනමක් මත අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

ලංකා ලුනු සමාගමේ අධ්‍යක්ෂවරු අඛණ්ඩතා පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමේ හැකියාව පිළිබඳව තක්සේරු කිරීමක් කර ඇති අතර වෙළෙඳාම ඈවර කිරීමට හෝ නැවැත්වීමට ඔවුන්ට අපේක්ෂාවන් නොමැත.

2.1.10. සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් ස්ථිරව යොදා ගෙන ඇති අතර, පසුගිය වසරේ ගිනුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුරූප වේ. පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය වඩාත් යහපත් ලෙස ඉදිරිපත් කිරීම සහ වර්තමාන වසර සමඟ ගැලපීම සඳහා සංශෝධනය කෙරේ.

2.2. ඒකාබද්ධ කිරීමේ පදනම

(අ) ඒකාබද්ධ කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් සමන්විත වේ.

පරිපාලිත සමාගම සමූහය විසින් පාලනය ලබාගත් දිනය වන අත්කර ගත් දිනයේ සිට ඒකාබද්ධ කරන අතර, එකී පාලනය අවසන් වන දිනය දක්වා ඒකාබද්ධ කිරීම අඛණ්ඩව පවත්වා ගනී. පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ මව් සමාගමේ වාර්තා කරන කාලසීමාව සඳහා පිළියෙල කෙරේ.

කෙසේවෙතත්, ආයතන දෙකෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වන අතර ඒවා සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ ඉස්මතු කර දැක්වේ.

සටහන: ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ කෙටුම්පත්කළ, විගණනය නොකළ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ලංකා ලුනු සමාගමේ අවසන් ගිණුම් මත පදනම් වී පිළියෙල කෙරේ.

(ආ) පරිපාලිත සමාගම

පාලිත සමාගම් යනු, ඡන්දය දීමේ අයිතිවාසිකම් වලට අයත් එක් අර්ධයකට වැඩි ප්‍රමාණයේ කොටස් හිමිකාරිත්වයක් පොදුවේ දරනු ලබන්නාවූ ද, අදාළ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශ සෘජුව හෝ වක්‍රව පාලනය කළ හැකි වන පරිදි සමූහය සතුව බලය පවතින්නා වූ ද සියලුම ව්‍යාපාරික ආයතන වන්නේ ය. දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්ත්‍ය සේ සැලකෙන ඡන්දය දීමේ අයිතිවාසිකම් පැවතීම හෝ ඒවායින් සිදුවිය හැකි බලපෑම, සමූහය විසින් වෙනත් ව්‍යාපාර ආයතනයක් පාලනය කරනු ලබන්නේ ද යනුවෙන් තක්සේරුවකට එළැඹීමේදී සලකා බැලෙනු ඇත. පාලනය සමූහය වෙත පවරා දෙනු ලබන දිනයේ සිට පාලිත සමාගම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරේ. එකී පාලනය නතර කෙරෙන දිනයේ සිට ඒවායේ ඒකාබද්ධ කිරීම අත් හැරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

වසර සඳහා සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල මුළු ලාභ සහ අලාභවලට ඒකාබද්ධ කිරීම තුළ ඇතුළත් වන අතර, ඒකාබද්ධ කිරීම තුළ ඇතුළත් සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ සියලුම වත්කම් සහ වගකීම් පිළිවෙලින් ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්වා ඇත.

(ඇ) වාර්තාකරන දිනය

පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස 12ක පොදු වාර්තාකරණ කාලසීමාවක් සඳහා පිළියෙල කෙරේ.

2.3. ලාභ සහ අලාභ මානනය කිරීමේ පදනම

2.3.1. ආදායම

ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒන සහ ආදායම විශ්වාසි ආකාරයෙන් මැනිය හැකිවන ප්‍රමාණයට ආදායම හඳුනා ගනී. පහත සඳහන් විශේෂිත හඳුනා ගැනීමේ නිර්ණායක ආදායම හඳුනා ගැනීමට පෙර සපුරාලිය යුතුය.

භාණ්ඩ බෙදාදුන් විට සහ හිමිකම අතහැර ඇති විට භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම හඳුනා ගනී. වට්ටම් සහ රජය වෙනුවෙන් රැස්කරන විකුණුම් ආශ්‍රිත බදුවලින් ශුද්ධ ලද හෝ ලැබිය යුතු ප්‍රතිශ්ධාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. පහත සඳහන් විශේෂිත හඳුනා ගැනීමේ නිර්ණායක ආදායම හඳුනා ගැනීමට පෙර සපුරාලිය යුතුය.

අ) භාණ්ඩ විකිණීම

භාණ්ඩ බෙදාහැරීම මත පොදුවේ භාණ්ඩයේ සැලකියයුතු අවදානම් සහ හිමිකාරත්වයේ ප්‍රදාන මිලදී ගන්නා වෙත මාරු වෙන විට, භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම හඳුනා ගනී.

ආ) සේවා ඉටු කිරීම

එක් එක් ගිවිසුම සඳහා මුළු ඇස්තමේන්තු කම්කරු ශ්‍රමයේ ප්‍රතිශතයක් ලෙස මේ දක්වා දරන ලද කම්කරු පැය සැලකිල්ලට ගනිමින් තිරණය කරන ලද අවසන් කිරීමේ අදියරට යොමු වීම මගින් සේවා ඉටු කිරීමෙන් ලද ආදායම හඳුනා ගනී. කොන්ත්‍රාත් ප්‍රතිඵල විශ්වාසයෙන් මැනිය නොහැකි අවස්ථාවක, අයකරගත හැකි දරන ලද වියදමේ ප්‍රමාණය දක්වා පමණක් ආදායම හඳුනා ගනී.

ඇ) පොළිය

වත්කම මත සඵල පොළි අනුපාතය සැලකිල්ලට ගනු ලබන කාල කොටස් පදනමක් මත ආදායම හඳුනා ගනී.

ඈ) වෙනත්

වෙනත් ආදායම උපචිත පදනමක් මත හඳුනා ගනී.

2.3.2. පොළිය සහ සමාන ආදායම් සහ වියදම

ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන සියලුම මූල්‍ය උපකරණ, විකිණීමට තබා ඇති ලෙස වර්ග කර ඇති පොළි සහිත මූල්‍ය වත්කම් සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමට නම් කරන ලද මූල්‍ය උපකරණ සඳහා, පොළි ආදායම හෝ වියදම සඵල පොළි අනුපාතිකය (EIR) භාවිතා කර වාර්තා කරනු ලැබේ. EIR යනු මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වගකීම්වල ශුද්ධ ධාරණ අගයට මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හෝ සුදුසු පරිදි වඩා කෙටි කාලයක් තුළින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් සත්‍ය වශයෙන් වට්ටම් කරන අනුපාතයයි. ගණනය කිරීම තුළ මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම්ගත කොන්දේසි සැලකිල්ලට ගන්නා අතර (උදාහරණයක් ලෙස, පෙරගෙවුම් විකල්ප) උපකරණයට සෘජුවම ආරෝපණය කළ හැකි සහ EIR හි අනිවාර්ය අංගයක් වන නමුත් අනාගත ණය අලාභ නොවන යම් ගාස්තු හෝ වර්ධක පිරිවැය ඇතුළත් වේ. පොළි ආදායමට කුපන් ආදායම සහ උපකරණවල වට්ටම් හෝ වාරික ක්‍රමක්ෂය කිරීම මත ඇති යම් ලාභයක් හෝ අලාභයක් ඇතුළත් වේ.

හානිකරණ අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ ඒ හා සමාන මූල්‍ය වත්කම් සමූහයක වාර්තාගත වටිනාකම අඩු කරනු ලැබූ පසු, හානිකරණ අලාභය මැනීමේ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා භාවිතා කරන මුල් පොළි අනුපාතිකය භාවිතයෙන් පොළි ආදායම අඛණ්ඩව හඳුනා ගැනේ.

ETFB පනතේ 22 වැනි වගන්තියට අනුව පොළි වියදම හඳුනා ගන්නා අතර අමාත්‍යවරයාගේ එකඟතාව ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කළ හැකි පරිදි සියයට තුනකට නොඅඩු පොළියක් ගෙවිය යුතුය. එය මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් එම අරමුදලේ මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන් එම වසරේ දෙසැම්බර් 31 වැනි දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පුද්ගලික ගිණුමේ බැර කිරීමට පවතින මුදල මත එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබේ.

2.3.3. ලාභාංශ ආදායම සහ වියදම

ලාභාංශ ආදායමට අදාල ගෙවීම ලැබීමට ආයතනය සතු අයිතිය තහවුරු වන විට, ලාභාංශ ආදායම හඳුනා ගනී. ETFB පනතේ 14 වගන්තියට අනුව ලාභාංශ වියදම හඳුනා ගන්නා අතර, අරමුදලේ මුදල් ආයෝජනය මගින් මුදා හැරී ලාභයෙන් මණ්ඩලය ලාභාංශ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2.3.4. වෙනත් ආදායම

සේවකයින්ගේ සේවා කාලසීමාව තුළ ක්‍රමක්ෂය කරන කාර්ය මණ්ඩල ණය පිළිබඳ සාධාරණ වටිනාකම මැනීම මත පොළි ආදායම සඳහා හැර ගෙවීම ලැබීමට ආයතනයේ අයිතිය තහවුරු කරන විට වෙනත් ආදායම හඳුනා ගනී.

2.4. බදුකරණය

2.4.1. ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු යනු වාර්තා කරන දිනයට පනවා ඇති හෝ පසුව පනවනු ලබන බදු අනුපාත සහ පසුගිය වසර සම්බන්ධයෙන් ගෙවිය යුතු බදුවලට යම් ගැලපීම් භාවිතයෙන් වසර සඳහා බදුකළ හැකි ආදායම හෝ අලාභ මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බදුය.

මණ්ඩලයේ ගෙවිය යුතු ප්‍රවර්තන බදු වසර සඳහා බදුකළහැකි ලාභය මත පදනම් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම මූල්‍ය

ප්‍රකාශනවල වාර්තා කළ පරිදි ආදායම සහ වියදමේ මුලිකාංග මත පදනම් වන අතර, දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලැබේ. අදාළ බදු අනුපාතය 14%කි.

ගෙවිය යුතු ප්‍රවර්තන බදු වසර සඳහා බදුකළහැකි ලාභය මත පදනම් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කළ පරිදි ආදායම සහ වියදමේ මුලිකාංග මත පදනම් වන අතර, දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලැබේ.

2.4.2. විලම්භිත බදුකරණය

වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරන කාලසීමාව සඳහා ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍ර දිනයට සියලුම තාවකාලික වෙනස්වීම් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු වෙන් කෙරේ.

අනාගතයේදී බදුකළහැකි ලාභයට වැඩි කිරීමට අපේක්ෂා කරන සියලුම තාවකාලික වෙනස්වීම් සඳහා සහ යම් භාවිතා නොකළ බදු අලාභ හෝ භාවිතා නොකළ බදු බැර සඳහා විලම්භිත බදු වගකීම් හඳුනා ගනී. වර්තමාන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුකළහැකි ලාභය අයකරගත නොහැකි වියහැකි ඉහළම ප්‍රමාණයට විලම්භිත බදු වත්කම් අගය කරනු ලබයි.

විලම්භිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය එක් එක් වාර්තාකරන දිනයට සමාලෝචනය කරන අතර, අනාගත බදුකළහැකි ලාභවල වර්තමාන තක්සේරුව පිළිබිඹු කිරීමට ගලපනු ලැබේ.

වාර්තා කරන දිනය අවසානයට පනවා ඇති හෝ පසුව පනවනු ලබන බදු අනුපාත මත පදනම් වී විලම්භිත බදු වත්කම් මුදා හැරීමට හෝ විලම්භිත බදු වත්කම නිරවුල් කිරීමට අපේක්ෂා කරන කාලසීමාවන් හි බදුකළහැකි ලාභයට (බදු අලාභ) යොදා ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතවලට විලම්භිත බදු ගණනය කෙරේ.

2.5. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුව

මූල්‍ය ප්‍රකාශ සමාගමේ ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරේ. විදේශීය ව්‍යවහාර මුදලින් සිදුකරන ගනුදෙනු ගනුදෙනුවේ දිනයට පාලනය වන ක්‍රියාත්මක ව්‍යවහාර මුදලට මූලිකව වාර්තා කරනු ලැබේ. විදේශීය ව්‍යවහාර මුදලින් නම් කරන මූල්‍ය වත්කම් සහ වගකීම් ශේෂ පත්‍රයේ දිනයට පාලනය වන හුවමාරු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්වීම් ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. විදේශීය ව්‍යවහාර මුදලින් වෙතිහාසික පිරිවැයට අනුව මනින ලද මූල්‍ය නොවන අයිතම මුලික ගනුදෙනුවේ වුවමාරු අනුපාතිකය භාවිතයෙන් පරිවර්තනය කෙරේ. විදේශීය ව්‍යවහාර මුදලකින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දිනයට හුවමාරු අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ.

2.6. පසුගිය වසරේ ලාභයට ගැලපීම

මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක බව වැඩි කරන බැවින් අතීතානුයෝගීව දෝෂ නිවැරදි කිරීම් ගලපනු ලබයි. ඒ අනුව, රඳවාගත් ඉපයීම්වල ආරම්භක ශේෂය එකී දෝෂ නිවැරදි කිරීමෙන් පසුව නැවත සඳහන් කරනු ලැබේ. පහත සඳහන් පූර්ව කාලසීමා දෝෂ 2019 දී සොයාගෙන නිවැරදි කරන ලදී.

අ) පෙර වසරේ ගැලපිම්වල පහත සඳහන් දෝෂ නිවැරදි කිරීම් ඇතුළත් වේ

නිවැරදි කිරීමේ ස්වභාවය	රු 000′
පහ වසර ශිෂ්‍යත්ව වෙන් කිරීම/ගෙවීම	(117,960)
ලංකා ලුනු සමාගමේ ලාභාංශ - බදු ගැලපිම 2019	(9,450)
ලංකා ලුනු සමාගමේ ලාභාංශ -ගැලපිම 2019	67,500
අඩුවෙන්/වැඩිපුර වෙන්කළ බදු	(85,671)
ගෙවියයුතු රඳවා ගැනීමේ බදු වැඩිපුර වෙන් කිරීම ආපසු හැරවීම	54,260
පරිගණක උපකරණවල අඩුවෙන් වෙන්කළ ක්ෂය කිරීම	(19,177)
දායක මුදල සඳහා පොළිය සහ ලාභාංශ ගැලපිම	73
ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ණයකර මත වැඩිපුර වෙන්කළ පොළිය	(2)
ක්ෂය කිරීම ආපසු හැරවීම (ආයෝජන දේපල)	201
අධිභාර	1,774
අධිභාර අයකිරීම් ආදායම මත පොළිය ආපසු හැරවීම	381
එකතුව	(108,073)

2.7. ආයෝජනය සහ වෙනත් මූල්‍ය වත්කම්

2.7.1. වර්ගීකරණය

2018 ජනවාරි1 දින සිට, මණ්ඩලය එහි මූල්‍ය වත්කම් පහත සඳහන් මැහීම් වර්ගීකරණ තුළ වර්ගීකරණය කරයි.

- සාධාරණ අගයට (අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් හෝ ලාභය හෝ අලාභය තුළින්) පසුකාලීනව මනිනු ලබන මූල්‍ය වත්කම් සහ
- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්.

මෙම වර්ගීකරණය රඳා පවතින්නේ ආයතනයේ මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවහ පිළිබඳ ගිවිසුම්ගත නියමයන් මත වේ.

සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා, ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරනු ලැබේ. වෙළෙඳාම සඳහා තබා නොමැති ස්කන්ධ උපකරණවල ආයෝජන සඳහා, අරමුදල අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) ස්කන්ධ ආයෝජනය සඳහා ගණනය කිරීම සඳහා මුලින්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

හඳුනා ගන්නා අවස්ථාවේදී වෙනස් නොකලැකි තේරීමක් සිදු කර ඇත යන පදනම මත රඳා පවතී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ඉදිරිපත් කරන ප්‍රමාණය පසුකාලීනව ආදායම් ප්‍රකාශනයට මාරු නොකෙරේ. එවැනි ආයෝජන මත ලාභාංශ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

අරමුදළ ණය ආයෝජන වර්ගීකරණය කරන්නේ එවැනි වත්කම් කළමනාකරණය කිරීම සඳහා එහි ව්‍යාපාර මාදිලිය වෙනස්වන විට පමණක්වේ.

2.7.2. නැවත වර්ගීකරණය

නිවාස ණය ලබාදීමේ ව්‍යාපාරයේ යෙදී සිටින ප්‍රධාන බලපත්‍රලාභී විශේෂ බැංකු දෙකක් (ජාතික සංවර්ධන බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව) තුළින් මණ්ඩලය එහි සාමාජිකයින්ට සහ සේවකයින්ට නිවාස ණය යෝජනා ක්‍රම ලබාදීමට අරමුදල් පහසුකම් ලබා දී ඇත. ගිවිසුම්වලට අනුව, බැංකු දෙකම පෙර නිශ්චිත යෝජනා ක්‍රම යටතේ සාමාජිකයින්ට සහ සේවකයින්ට ලබාදෙන ණය මත සම්පූර්ණ ණය අවදානම සහ පරිපාලනය භාර ගැනීමට එකඟ වී ඇත. මණ්ඩලය එම බැංකු සඳහා අරමුදල් ලබාදීම පමණක් සිදුකරන අතර, ඔවුන් එවැනි අරමුදල් විශේෂිත තැන්පතු යෝජනා ක්‍රමයන් යටතේ හඳුනා ගන්නා අතර, ETF මණ්ඩලය වෙනුවෙන් වෙනම තැන්පතු ගිණුමක් පවත්වා ගනී. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, අදාළ බැංකු සමඟ තැන්පතු දක්වා ණය යෝජනා ක්‍රම සඳහා කළ තැන්පත් යටතේ හඳුනාගත් අරමුදල් පහසුකම් දෙක නැවත වර්ගීකරණය කිරීමට මණ්ඩලය තීරණය කරන ලදී.

2.7.3. හඳුනා ගැනීම සහ හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම් නිත්‍ය ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකුණුම්, වත්කම් මිලදී ගැනීමට හෝ විකිණීම කළ දිනය අනුව වෙළෙඳ දිනය හඳුනා ගනී. මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ අරමුදල විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනා නොගනී .

2.7.4. මැණුම්කරණය

මූලික හඳුනාගැනීමේදී, අරමුදල මූල්‍ය වත්කම් එහි සාධාරණ වටිනාකම සමඟ, ලාභ හෝ අලාභ (FVTPL) හරහා සාධාරණ වටිනාකමක් නොලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මනිනු ලබයි. FVTPL ට ගෙන යන මූල්‍ය වත්කම්වල ගණුදෙණු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ.

බද්ධ වූ ව්‍යුත්පන්න සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මුදල් ප්‍රවාහයන් තීරණය කිරීමේ දී මූලික මුදලත් පොළිය පමණක් සලකා බලනු ලැබේ.

2.7.4.1. ණය උපකරණ

ණය උපකරණවල පසුකාලීන මැණුම්කරණය, වත්කම කළමනාකරණය තරමට අරමුදලේ ව්‍යාපාර මාදිලිය සහ වත්කමේ මුදල් ප්‍රවාහ ගතිලක්ෂණ මත රඳා පවතී. අරමුදල ණය උපකරණ වර්ගීකරණය කරන මිනුම්කරණ තුනක් ඇත.

ක්‍රමක්ෂය කළ පිරිවැය : ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා දරාගෙන සිටින වත්කම්වල එම මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කරන අවස්ථාවක ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි. මෙම මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය ආදායම තුළ ඇතුළත් කෙරේ. හඳුනා නොගැනීම මත ඇතිවන යම් ලාභ හෝ අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර විදේශ විනිමය ලාභ සහ අලාභ සමඟ එක්ව වෙනත් ලාභ/(අලාභ) තුළ ඉදිරිපත් කෙරේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශනය තුළ වෙනම පේළියක ඉදිරිපත් කෙරේ.

වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය (FVTOCI) **:** ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා දරාගෙන සිටින වත්කම්, එම වත්කම්වල මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කරන අවස්ථාවක, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබයි. ධාරණ අගය තුළ වෙනස්වීම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා හානිකරණ ලාභ හෝ අලාභ, පොළි ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හඳුනා ගැනීම හැර අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ගනු ලැබේ. මූල්‍ය වත්කම් හඳුනා නොගන්නා විට, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ මෙයට පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධවල සිට ලාභය හෝ අලාභ දක්වා නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/(අලාභ) තුළ හඳුනා ගනී. මෙම මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය ආදායම තුළ ඇතුළත් කෙරේ. විදේශ විනිමය ලාභ සහ අලාභ වෙනත් ලාභ/(අලාභ) තුළ ඉදිරිපත් කරන අතර හානිකරණ වියදම් ආදායම් ප්‍රකාශනය තුළ වෙනම පේළියක ඉදිරිපත් කෙරේ.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය : (FVTPL) ක්‍රමක්ෂය පිරිවැය හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය සඳහා නිර්ණායක නොසපුරන වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පසුකාලීනව මනින ණය උපකරණයක් මත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර එය ඇති වූ කාලසීමාව තුළ වෙනත් ලාභ/(අලාභ) තුළ ශුද්ධ ලෙස ඉදිරිපත් කෙරේ.

2.7.4.2. කොටස් හිමිකම් උපකරණ

අරමුදල පසුකාලීනව සියලුම ස්කන්ධ ආයෝජන සාධාරණ අගයට මනිනු ලබයි. අරමුදලේ කළමනාකරණය අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ස්කන්ධ ආයෝජන මත සාධාරණ අගයේ ලාභ හෝ අලාභ ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා අවස්ථාවේදී, ආයෝජනය හඳුනා නොගැනීමෙන් පසු ලාභය හෝ අලාභයට සාධාරණ අගයේ ලාභ හෝ අලාභවල පසුකාලීන නැවත වර්ගීකරණයක් නොමැත. එවැනි ආයෝජනවලින් ලාභාංශ ගෙවීම් ලබාගැනීමට අරමුදලට ඇති අයිතිය තහවුරු වූ විට වෙනත් ආදායම් ලෙස ආදායම් ප්‍රකාශනය තුළ තවදුරටත් නැවත හඳුනා ගනී.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්වල සාධාරණ අගය තුළ වෙනස්වීම් අදාළ පරිදි ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් ලාභ/(අලාභ) තුළ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මිනින ලද ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ (සහ හානිකරණ අලාභ ආපසු හැරවීම) සාධාරණ අගය තුළ අනෙකුත් වෙනස්වීම්වලින් වෙන වෙනම වාර්තා නොකෙරේ.

මූලික මූල්‍ය උපකරණ

අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනීමේ අවස්ථාවේදි සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

ණය සහ ලැබියයුතු

ණය සහ ලැබීම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු, සහ වෙළෙඳ සහ අනෙකුත් ලැබියයුතු දෑ ඇතුළත් වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් හැරුනු විට සියලුම මූල්‍ය උපකරණ ආරම්භක අවස්ථාවේදීම ගණනය කරනු ලබන්නේ ඒවායේ ගනුදෙනු කිරීම් පිරිවැය සහිත සාධාරණ අගය අනුවය

ණය සහ ලැබීම් යනු සක්‍රිය වෙළෙඳපොලක් තුළ ලැයිස්තුගත නොකළ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වෙති. මූලික අගය කිරීමෙන් පසු, එවැනි මූල්‍ය වත්කම් පසුකාලිනව පිරිවැයට මනිනු ලැබේ. හානිකරණයෙන් ඇතිවන අලාභ විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරයට අනුව සහ මූල්‍ය වගකීම් පිළිබඳ නිර්වචනයට අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මූල්‍ය වගකීම් තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

ලාභය හෝ අලාභය හරහා ගණාණය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් හැරුණු විට සියලුම මූල්‍ය උපකරණ ආරම්භයේදී ගණනය කරනු ලබන්නේ ගනුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධාරණ ගණනය අගයට අනුවය.

පොළිය දරන ණය සහ ණය ගැනීම් ඇතුළත් මූල්‍ය වගකීම් සහ වෙනත් මූල්‍ය වගකීම් (වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු) අත්කර ගැනීමට සෘජුවම ආරෝපිත ගනුදෙනු පිරිවැයට අඩුකළ සාධාරණ අගයට මූලිකව මනිනු ලබන අතර පසුකාලිනව සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණණය කරනු ලබන්නේ නිකුතුව, මත යම් මට්ටම් හෝ අධිමිල සහ සඵල පොළී අනුපාතයේ මුඛ්‍යංග යක් වන පිරිවැය සැලකිලට ගැනීමෙනි.

වගකීම යටතේ බැඳීම මුදාහරින හෝ අවලංගු කරන හෝ කල් ඉකුත්වන විට මූල්‍ය වගකීමක් හඳුනා නොගනී. දැනට පවත්නා මූල්‍ය වගකීමක් සැලකියයුතු වෙනස් නියමයන් මත එකම පාර්ශ්වයේ වෙනත් එකකින් ප්‍රතිස්ථාපනය කරන විට, හෝ දැනට පවත්නා වගකීමක නියමයන් පසුකාලිනව වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙන් කිරීමක් මූල් වගකීම හඳුනා නොගැනීම සහ නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී

2.8. දේපල, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණවල අයිතම ආරම්භක අවස්ථාවේදී පිරිවැයට හඳුනා ගනී. පිරිවයැට මිලදී ගැනුම් මිල, සාජුවම ආරෝපනය වන පිරිවැය සහ අයිතම කොටස් ගැලවීමේ සහ ඉවත් කිරීමේ යම් අනාගත නොවැලැක්විය හැකි පිරිවැයෙහි ඇස්තමේන්තුගත වර්තමාන පිරිවැය ඇතුළත්ය. ඊට අනුරූප වගකීම වෙන් කිරීම් තුළ හඳුනා ගනී.

දේපළ, පිරියත හා උපකරණවල මුලින්ම තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නැවත යථා තත්ත්වයට පත් කිරීමට සහ පවත්වා ගන යාමට දේපළ, පිරියත හා උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව මත දරන ලද වියදම දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස හඳුනා ගනී.

නිශ්චල දේපළ (ආයජන දේපළ) සම්බන්ධයෙන් හැරුණු විට ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන හිනවන ශේෂ ක්‍රමය භාවිතයෙන් ගණනය කෙරේ. සින්නක්කර ඉඩම ක්ෂය කරනු නොලැබේ. දේපළ, පිරියත හා උපකරණවල සියලුම අයිතම මත ක්ෂය කිරීම වෙන් කරන අතර, ඒවායේ අපේක්ෂිත ඵලදායී ආර්ථික කාලය පුරා සුන්බුන් අගය (ඇත්නම්) අඩුකළ ඒවායේ ධාරණ අගයට කපා හරිනු ලැබේ.

මෝටර් රථ	25%
පරිගණක උපකරණ	20%
ගෘහ භාණ්ඩ	15%
සවිකිරීම් හා වැද්දුම්	33.33%
වෙනත් උපකරණ	20%

ගොඩනැගිලිවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය හිනවන ශේෂ ක්‍රමය මත වාර්ෂිකව 6.67% වූ ප්‍රතිශයක් වේ. වත්කම් ක්ෂය කිරීම එය භාවිතයට ලබාගන්නා මාසයේදි ආරම්භ වන අතර, බැහැර කරන මාසයේදී ක්ෂය කිරීම සිදු නොකරයි.

දේපළ, පිරියත හා උපකරණවල යම් අයිතමයක් බැහැර කිරීම මත හෝ කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවේ දී හඳුනා නොගනී.

හඳුනා නොගැනිමී මත ඇතිවන යම් ලාභ හෝ අලාභ වත්කම හඳුනා නොගන්නා වසර තුළ ආදායම් ප්‍රකාශනය තුළ ඇතුළත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

දේපළ, පිරියත හා උපකරණවල ආශ්‍රිත අයිතම සමුච්චිත ක්ෂය කිරීම සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ චෙතිහාසික පිරිවැයට මනිනු ලබයි. වාර්ෂික අනුපාත අඩුකළ වත්කමේ පිරිවැය වෙන් කිරීම දේපළ, පිරියත හා උපකරණවල ක්ෂය කිරීම සඳහා භාවිතා කිරීමට හැකි පරිදි ක්ෂය කිරීම අය කරනු ලැබේ.

කල්බදු ඉඩම මත ගොඩනැගිලි	2.5%
පිරියත සහ යන්ත්‍ර	10%
උපකරණ	10%
ලිබඩු සහ සවිකිරීම්	10%
මෝටර් රථ	
මාර්ග රථවාහන	10%
ට්‍රැක්ටර් හා ට්‍රේලර්	20%
සංවර්ධන වැඩ	20%
වැඩුනු වතුවගා -පොල්	2%

වත්කමක ක්ෂය කිරීමේ අනුපාතය, ඵලදායී ජීව කාලය හෝ සුන්බුන් අගය තුළ සැලකියයුතු වෙනසක් ඇති බවට ඇඟවීමක් ඇත්නම්, නව අපේක්ෂාවන් පිළිබිඹු වීම සඳහා එම වත්කම ක්ෂය කිරීම අතීතානුයෝගිව ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණවල යම් අයිතමයක් බැහැර කිරීම මත හෝ එය භාවිතය හෝ බැහැර කිරීමෙන් කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවේ දී හඳුනා නොගනී. වත්කම හඳුනා නොගැනීම මත ඇතිවන යම් ලාභයක් හෝ අලාභයක් (වත්කමේ ශුද්ධ බැහැර කිරීමෙන් ලත් මුදල සහ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) වත්කම හඳුනා නොගන්නා වසර තුළ ලාභයට හෝ අලාභයට ඇතුළත් කෙරේ.

පෙව වත්කම්

පෙව වත්කම්, පරිණත වූ පෙව වත්කම් සහ පරිණත නොවූ පෙව වත්කම් යනුවෙන් වර්ග දෙකකට බෙදේ. පරිණත වූ පෙව වත්කම් වනුයේ, අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් වූ හෝ නිරතුරුව අස්වනු දැරිය හැකි හෝ වත්කම් වර්ගයෝයි. පරිණත නොවූ පෙව වත්කම් වනුයේ, මේ වන විටත් අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් නොවූ වත්කම් වර්ගයෝයි. පොල් වගා සහ පැල තවාන් පෙව වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ධාරක පෙව වත්කම්වලට, විකිනීමට හෝ අස්වනු නෙලා ගැනීමට අදහස් නොකරන එහෙත්, කෘෂි නිෂ්පාදන ලෙස අස්වනු ලබා ගැනීම පිණිස යොදා නොග ැනෙන පෙව වත්කම් ඇතුළත් වේ.අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වත්කම් හා බැඳී පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභ තමන් වෙත ගලා එනු ඇතැයි සහ එම වත්කම්වල සාධාරණ අගය හෝ පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කරනු ලැබිය හැකි වෙතැයි අස්ථිත්වය විසින් අනුමාන කරනු ලබන කල්හී සහ එම අස්ථිත්වය එකී අදාළ වත්කම් පාලනය කරනු ලබන අවස්ථාවක දී පමණක් එම අස්ථිත්වය තම පෙව වත්කම් හඳුනා ගනියි. පෙව වත්කම් විෂයයෙහි සිදුවන ස්ථීර හායනයවීම් පූර්ණ වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයන් හී අයගත කරනු ලැබ, අදාළ අලාභය නිශ්චය වශයෙන් දැන ගැනීමෙන් පසුව, එකී අලාභය සිදුවූ වසර තුළදී එම වත්කම්වලට අයත් ශුද්ධ ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණවලට අවකරණය කරනු ලැබේ.

ධාරක පෙව වත්කම්

ධාරක පෙව වත්කම්, අංක 16 දරන ලංකා ගිණුම් ප්‍රමිත - දේපළ, පිරියත සහ උපකරණ අනුව, ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හායන අලාභ ඇත්නම් ඒවා ද අඩු කරන ලද පිරිවැය මත, මනිනු ලැබේ.පැල සිටුවීම සහ අස්වනු නෙලීම (පැල රෝපණය කරන ලද ප්‍රදේශය මෝරා වැඩුනු අවස්ථාව වන විට) අතර කාලය තුළ සිදුවූ ඉඩම් පිළියෙළ කිරීම, පුනරුත්ථාපනය, අභිනවයෙන් පැල සිටුවීම, නැවත පැල සිටුවීම, හෝග විවිධාංග ීකරණය, අතුරු පැල සිටුවීම සහ පොහොර යෙදීම යනාදිය සඳහා වූ පිරිවැය පරිණත නොවූ වගාවන් ලෙස වර්ගීකරණය කෙරේ. මෙම පරිණත නොවූ වගාවන්, එකී පරිණත නොවූ වගාවන් සඳහා මූල්‍යනය සලසනු පිණිස යොදා ගැනුනු දිගු කාලීන ණය මුදල්වලට ආරෝපණය වන පොලී ප්‍රමාණ ද ඇතුළු අනෙකුත් ආරෝපිත වන්නා වූ පොදු කාර්ය වියදම් සහිත වූ සෘජු පිරිවැයට අනුව ගෙන හැර දක්වනු ලැබේ. වසර තුළදී එල දරන ධාරක පෙව වත්කම්(පොල්)මත දරනු ලබන වියදම්, පරිණත වූ වගාවන් වෙත මාරු කෙරේ.

2.9. ආයෝජන දේපල

ආයෝජන දේපල යනු කුලී ආදායම් ඉපයීමට හෝ ප්‍රාග්ධන අගය කිරීම සඳහා හෝ මෙම දෙක සඳහා දරනු ලබන දේපල වේ. ආයෝජන දේපල හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලාඑන්නේනම් සහ ආයෝජන දේපලේ පිරිවැය පහසුවෙන් මැනිය හැකිනම් ආයෝජන දේපලක් හඳුනා ගනී.

ආයෝජන දේපල මූලිකවම ගනුදෙනු පිරිවැය ඇතුළත්ව පිරිවැයට මනිනු ලබයි. මුලික හඳුනා ගැනිමෙන් පස, ආයෝජන දේපල වාර්තාකරණ දිනයට වෙළෙඳපොල කොන්දේසි පිළිබිඹු කරන සාධාරණ අගයට සඳහන් කෙරේ. ආයෝජන දේපලේ සාධාරණ අගයන් හි වෙනස්වීම්වලින් ඇතිවන ලාභ හෝ අලාභ එය ඇතිවන කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

මණ්ඩලයේ ආයෝජන දේපල විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගන්නා ධාරණ අගයෙහි වෙනස්වීම් සමඟ විවෘත වෙළෙඳපොල වටිනාකමට සෑම වසර තුනකදීම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ලැබිය යුතු කුලිය කුලී කාලය පුරා සරල මාර්ගික පදනමක් මත විහි දේ. දිරි දිමනාවක් (කුලි රහිත කාලසීමාවක් වැනි) කුලී නිවැසියාට ලබා දෙන අවස්ථාවක, ආයෝජන දේපලේ ධාරණ අගය මෙම පදනම මත කුලී ආදායම හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනම වත්කමක් ලෙස වාර්තාකළ යම් ප්‍රමාණ ඉවත් කෙරේ.

මණ්ඩලයට කොළඹ 2 නවම් මාවතේ අක්කර 2යි රූඩ් 1යි පර්චස් 28ක ප්‍රමාණයේ ඉඩමක් අයත් වන අතර එය 2021 පෙබරවාරි 22 දින රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කර ඇත. රජයේ තක්සේරුකරුගේ වාර්තාව අනුව, ඉඩමේ සාධාරණ අගය 2020 වසර තුළ රු. 4,587,406,450/= දක්වා වැඩි වී ඇත.

2.9.1. (අ) මණ්ඩලයේ ආයෝජන දේපලවල තොරතුරු - ප්‍රමාණ සහ පිහිටීම්

පිහිටීම	ප්‍රමාණය (පර්චස්)	ආයෝජන දේපලේ සාධාරණ අගය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02	388	රු. 4,566,000,000.00

පිහිටීම	ගොඩනැගිලි (වර්ග අඩි)	ආයෝජන දේපලේ සාධාරණ අගය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02	19,319	රු. 21,406,450.00

(ආ) මණ්ඩලයේ ආයෝජන දේපලවල තොරතුරු -තක්සේරු කිරීම්

වෘත්තීය තක්සේරුකරුගේ නම/ස්ථානය සහ ලිපිනය	තක්සේරු ක්‍රමය සහ වැදගත් නිරීක්ෂණය කළනොහැකි යෙදවුම්	නිරීක්ෂණය කළනොහැකි යෙදවුම් සඳහා තක්සේරුවල පරාශය රු.	ආයෝජන දේපලේ සාධාරණ අගය රු.
රජයේ තක්සේරු දෙපාර්තමේනතුව "තක්සේරු නිවස" අංක 748, මරදාන පාර, කොළඹ 10	වෙළෙඳපොල සැසඳුම් ක්‍රමය • පර්චස් එකක මිල • වර්ග අඩියකට මිල	11,823,212.50 පර්චසයට 625 – 1955 වර්ග අඩි	4,566,000,000.00 21,406,450.00

(ඇ) තක්සේරු ශිල්ප ක්‍රම සහ සමූහයේ ආයෝජන දේපලවල සාධාරණ අගය මැනිමේ සංවේදීතාව

තක්සේරු ශිල්ප ක්‍රම	වැදගත් නිරීක්ෂණය කළනොහැකි යෙදවුම්	යෙදවුම්වලට සාධාරණ අගය මැනිමේ සංවේදීතාව
වෙළෙඳපොල සැසඳුම් ක්‍රමය මෙම ක්‍රමය ප්‍රත්‍යාගනනය කරන දේපලේ සාධාරණ අගය තීරණය කිරීමේදී සාධාරණ මැත කාලසීමාවක් තුළ සමාන දේපලක විකුණුම් මිල සලකා බලයි. මෙය ප්‍රමාණය, ස්වභාවය, ස්ථානය සහ විශේෂිත දේපලේ තත්ත්වය තුළ වෙනස්වීම් සඳහා සුදුසු ගැලපීම් සිදු කරමින් සමාන වත්කම්වල මෑතකාලීන සක්‍රිය මිල ගණන්වල තක්සේරු කිරීම හා සම්බන්ධ වේ.	• පර්චස් එකක මිල • වර්ග අඩියකට මිල	ඇස්තමේන්තු සාධාරණ අගය වැඩිවිය/(අඩුවිය) හැකිය පර්චස් එකක මිල වැඩිවිය/(අඩුවිය) හැකිය වර්ග අඩියකට මිල වැඩිවිය/(අඩුවිය) හැකිය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.10. අස්පෘශ්‍ය වත්කම්

2.10.1. බාහිරින් අත්කරගත් අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට මූලික හඳුනා ගැනීම මත මනිනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් පසු, අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට ගෙන යනු ලබයි. අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායි ජීව කාලයන් නියත හෝ අනියත ලෙස තක්සේරු කෙරේ.

ඉහත නිරීක්ෂණ මත පදනම්වී, ගෙවියයුතු බවට පත්වන විට එහි සාමාජිකයාට මුදල් ලබාදීමට මණ්ඩලයට ගිවිසුම්ගත බැඳීමක් ඇත. ඒ අනුව, සාමාජික අරමුදල මූල්‍ය වගකීමක නිර්වචනය සපුරාලයි. එමනිසා, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ - LKAS 08 අනුව, දෝෂය නිවැරදි කිරීමට සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස සාමාජික අරමුදල වර්ගීකරණය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත.

	මණ්ඩලය	
	2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ආරම්භක සාමාජික අරමුදල් ශේෂය	339,244,338	306,454,810
පෙර වසරේ දායක මුදල් ගැලපීම	(3,081)	(7,993)
ලද දායක මුදල්	26,750,691	27,476,206
දායක මුදල් ආපසු ගෙවීම	(18,570,203)	(19,807,895)
සාමාජික අරමුදල් ශේෂය මත පොළිය	10,422,652	9,423,454
ලාභාංශය	17,371,087	15,705,756
දෙසැම්බර් 31 දිනට අවසන් සාමාජික අරමුදල් ශේෂය	375,215,484	339,244,338



අතිරේක තොරතුරු

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } එල්වස්ඩබ්/සී/ඊවිඑෆ්/1/2020/4

මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ඔක්තෝබර් 18 වන දින

සභාපති,
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහ එහි පරිපාලිතයෙහි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" හා මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naoal.gov.lk

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මණ්ඩලය විසින් 1981 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල සේවායෝජකයින් 8,213 කගෙන් අයකරගෙන තිබූ 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 943.74 ක් වූ දායක මුදල් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර සේවායෝජක ගිණුම්වල රඳවා තබාගෙන තිබුණි. අදාල සාමාජික ගිණුම් හඳුනාගෙන එම ගිණුම්වලට බැර කිරීමෙන් තොරව මෙසේ රඳවාගෙන තිබීමෙන් අදාල සාමාජිකයන්ට තම මුදල් අහිමි වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2021 අගෝස්තු 16 දිනට මෙම ශේෂයෙන් රු.මිලියන 381.86 ක් නිරවුල් කරන ලද බව මණ්ඩලයේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 79 (ආ) වගන්තිය ප්‍රකාරව අස්පීත්වයක් විසින් පවත්වාගෙන යනු ලබන සංචිතවල ස්වභාවය හා අරමුණු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ලාභාංශ සම කිරීමේ සංචිතය හා වෙනත් සංචිත යන සංචිත දෙක සම්බන්ධයෙන් එසේ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 73 (අ) ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ධාරණ අගය තීරණය කිරීම සඳහා යොදාගත් මිණුම් පදනම (Measurement Base) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත්, මණ්ඩලය විසින් වත්කම් ප්‍රථමයෙන් හඳුනාගැනීමෙන් පසුව එළඹෙන කාලපරිච්ඡේදවලදී ධාරණ අගය තීරණය කිරීම (Measurement after recognition) සඳහා අනුගමනය කරන ලද පදනම (පිරිවැය, ප්‍රත්‍යාගණනය ආකෘතිය) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය

යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක්

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2020

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයටයොමුව	විස්තරය
(අ)1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත	පනත අනුව අතිකාල සඳහා ගෙවීම් කිරීමේ දී අතිකාල පැයකට සාමාන්‍ය පැයක වැටුප මෙන් එක හමාරක් ගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් අතිකාල පැයකට පැය එක හමාරක් සහ සෙනසුරාදා/ඉරිදා දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණ වීමත් සමඟ දිනක වැටුපක් ද එකතු කර අතිකාල ගෙවීම් කර තිබුණි. තවද, පනත ප්‍රකාරව මණ්ඩලයේ නිලධාරීන් සතියකට දින පහමාරක් සේවය කළ යුතු වන අතර වාර්ෂික නිවාඩු දින 21 කට පමණක් ඉඩ දී ඇති නමුත් ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන්ට වාර්ෂික නිවාඩු 42 ක් ලබා ගැනීමට හා සතියකට දින 5 ක් පමණක් සේවය කිරීමට ඉඩ දී තිබුණි. මේ අනුව, සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලය විසින් ගෙවන ලද රු. මිලියන 13.53 ක් වූ අතිකාල ගෙවීම්වල නිවැරදිතාවය මතභේදාත්මක වේ.
(ආ)මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාතුමාගේ 2014 නොවැම්බර් 10 දිනැති අංක PE/IN/ETF/Gen දරන ලිපිය	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන කාර්ය මණ්ඩල නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සියයට 4.2 ක පොළී අනුපාතය යටතේ එම ණය ලබාදීමට එකඟතාවය පල කර තිබුණ ද මණ්ඩලය විසින් සියයට 4 පොළී අනුපාතය යටතේ රු. මිලියන 2 දක්වා සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය ලබාදී තිබුණි.

(ඇ)2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය	මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය කාර්යය පරිපාටි සංග්‍රහය සඳහා සහ පරිපාලන කාර්යය පරිපාටි සංග්‍රහය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඈ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2000 ජනවාරි 11 දිනැති හා පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මහා භාණ්ඩාගාරයේ නිසි අවසරයකින් තොරව සේවකයන්ට හා අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින්ට අතිරේක දීමනා, දිරි දීමනා හා වෙනත් වර්ගවල මූල්‍යමය ප්‍රතිලාභ නොගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ආහාර දීමනා ලෙස රු.මිලියන 11.34 ක්ද, ඉතිරිකර ගත් නිවාඩු මත දීමනා රු.මිලියන 25.02 ක්ද, වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය රු.මිලියන 91.06 ක්ද, නිවාස ණය පොළී ප්‍රතිපූර්ණ වියදම් රු.මිලියන 10.48 ක්ද ලෙස එකතුව රු.මිලියන 137.90 ක් මහා භාණ්ඩාගාරයේ නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2020 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 6 ක සිදුකර තිබූ පිළිවෙලින් රු. මිලියන 31.41 ක්, රු. මිලියන 30.14 ක් හා රු. මිලියන 49.10 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා පිළිවෙලින් 2015, 2018 හා 2019 වර්ෂයේ සිට ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් ලැයිස්තුගත සමාගම් 12 ක සිදුකර තිබූ ආයෝජනවල 2015 වර්ෂයේදී වෙළඳපොළ අගය රු. මිලියන 902.71 ක් වූ අතර 2015 වර්ෂයේ සිට එම කොටස්, කොටස් වෙළඳපොලේ ගනුදෙනු සඳහා ඉදිරිපත් කර නොතිබූ බැවින් මණ්ඩලයට ප්‍රාග්ධන අලාභ අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම කොටස්වල වෙළඳපළ අගය රු.මිලියන 553.10 ක් දක්වා පහත වැටී තිබුණි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) මණ්ඩලය විසින් ඒකක භාර අරමුදල් තුනක මුදල් ආයෝජනය කර තිබූ අතර ඉන් නාමල් වර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දින වන විට ආයෝජනය කර තිබූ ඒකක 450,000 ක් හි වෙළඳපොල වටිනාකම රු.මිලියන 57.21 ක් විය.මෙම ආයෝජනය සඳහා 2020 වර්ෂය වෙනුවෙන් ලාභාංශ ලැබී නොතිබුණු අතර නාමල් වර්ධන අරමුදලේ ඒකකවල වෙළඳපොල වටිනාකම 2020 වර්ෂයේ වර්ධනය වී තිබුණද 2019 හා 2020 වර්ෂයන්හිදී අරමුදල මූල්‍ය අලාභයන් ලබා ඇති බව එහි මුල්‍ය ප්‍රකාශන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. තවද, එම අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 703 ක් වූ ශුද්ධ වත්කම් වටිනාකම 2020 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 350 ක් දක්වා අඩු වී තිබීම හේතුවෙන් මෙම ආයෝජනය අවදානම් තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) වර්ෂ ගණනාවක සිට ඇල්කඩුව වැවිලි සමාගමෙන් ලැබිය යුතුව පැවති ණයකර පොළි මුදල්වලින් තවදුරටත් ලැබිය යුතු රු.මිලියන 9.39 ක් 2021 ජූලි 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඉ) මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගෙන නොතිබුණි. 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවකු (Primary dealer) ලෙස ලියාපදිංචි වන ලෙසට නියෝග කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි.

(ඊ) රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව සමඟ එකාබද්ධව ක්‍රියාත්මක කරන කාර්ය මණ්ඩල නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා බැංකුව සමඟ එළඹ තිබූ ගිවිසුම අනුව සේවකයින්ගෙන් ආපසු අයකර ගන්නා මූලික මුදල් හා පොළි මුදල් මාස 03 කට වරක් මණ්ඩලය වෙත ප්‍රේෂණය කලයුතු වේ. එසේ වුවද ඊට පටහැනිව බැංකුව විසින් එම මුදල් වර්ෂය අවසානයේ දී තැන්පතු ගිණුමේ ශේෂයට එකතු කර පෙන්වන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් වර්ෂයතුළදී එකතු කරන මුදල් හා පොළී මුදල් වෙනුවෙන් අදාළ වර්ෂය සඳහා මණ්ඩලයට කිසිදු පොලියක් හිමි නොවන බව ද එම මුදල් වෙනත් ආයෝජන මාර්ගයක යොදාගත නොහැකි වන බව ද නිරීක්ෂණය විය. ඒ අනුව 2020 වර්ෂයේ ණය නැවත අයකර ගැනිම් රු. මිලියන 24.47 ක් හා පොළි අයකර ගැනිම් රු.මිලියන 6.15 ක් සඳහා ප්‍රතිලාභ කිසිවක් ලැබී නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 20 (1) වගන්තිය හා 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල (සංශෝධන) පනතේ 7 වන වගන්තිය මගින් කරන ලද සංශෝධන ප්‍රකාරව, මණ්ඩලයට ස්වයං රැකියාලාභීන් ලියාපදිංචි කර ගැනීමට ඉඩකඩ සලසා දී ඇත. එහෙත් 2020 දෙසැම්බර් 31 දිනට ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාගත පරිදි ශ්‍රී ලංකාවේ ස්වයං රැකියාලාභීන් සංඛ්‍යාව 2,746,711 ක් වුවද එයින් සාමාජිකයින් ලෙස අරමුදලට ලියාපදිංචි කර ගෙන ඇති සංඛ්‍යාව 42,694 ක් හෙවත් සියයට 1.55 ක් පමණක් වූ අතර එයින් ක්‍රියාකාරී සාමාජික සංඛ්‍යාව 5,308 ක් විය. අරමුදල් පනත මගින් විශේෂයෙන් නියම කර ඇති මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය තුල වෙනම අංශයක් ස්ථාපිත කර ක්‍රියාකාරී සැලැස්ම තුල උපායමාර්ග දක්වා තිබුණ ද, 2020 වර්ෂයේ දී අලුතින් ලියාපදිංචි කර ගෙන තිබූ සංඛ්‍යාව 481 ක් පමණක් වී තිබුණි.

(ආ) සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයාද වන්නේය. කෙසේ වුවද, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයා විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබුණි. එසේ වුවද, 2020 වර්ෂය අවසාන වන විටත් පනතට අවශ්‍ය සංශෝධනයක් සිදුකර නොතිබුණි.

(ඇ) 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පවතින හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු. මිලියන 17.47 ක් සහ 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු.මිලියන 26.85 ක් වශයෙන් එකතුව රු.මිලියන 44.32 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සාමාජිකයින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබානොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වන සේවායෝජකයින් වෙනුවෙන් මණ්ඩලය විසින් තාවකාලික ලියාපදිංචි අංක ලබා දී අනුව්‍යාජ (Dummy) සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගන්නා සේවායෝජකයින්ගෙන් ලැබෙන දායක මුදල් 'X' නමින් තාවකාලික ගිණුම්වල පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට එම තාවකාලික ගිණුම්වල රු. මිලියන 317.70 ක ශේෂයක් විය. මෙම අනුව්‍යාජ සේවායෝජකයන් මණ්ඩලයේ සත්‍ය සේවායෝජකයන් ලෙස ලියාපදිංචි කර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කර නොතිබීම හේතුවෙන් එම ගිණුම තුල

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පවත්වාගෙනයන දායක මුදල් සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කිරීමට නොහැකිව පැවතුණි.

(ඉ) මණ්ඩලය විසින් 2019 වර්ෂයේදී ඉතිරි කර ගත් නිවාඩු මත රු. මිලියන 18.15 ක් ගෙවා තිබූ අතර වසංගත තත්ත්වය නිසා නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රම හඳුන්වා දී තිබූ 2020 වර්ෂයේදී රු. මිලියන 25.02 ක් ද වැයකර තිබුණි. මෙහි සාධාරණත්වය පිළිබඳ ගැටලු පැන නගී.

(ඊ) මණ්ඩලයේ සාමාජිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා සාමාජිකයා, කාලත්‍රයා සහ සෑම යැපෙන්නෙක් වෙනුවෙන්ම එක් අයෙක් සඳහා මාස්පතා අයකරනු ලබන දායක මුදල රු. 30 ක් ලෙස 2011/10 අංක දරන පරිපාලන හා මානව සම්පත් චක්‍රලේඛනය මගින් සංශෝධනය කිරීමෙන් අනතුරුව වසර 10 තුල එම මුදලේ සංශෝධනයක් සිදුව නොතිබුණි. එහෙත්, 2020 වසර සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ වියදම රු. මිලියන 92.57 ක් වූ අතර ඒ සඳහා සාමාජික දායකත්වය රු. මිලියන 1.51 ක් එනම් සියයට 1.6 ක් පමණක් විය. ඒ අනුව ඉතිරි මුදල වූ රු.මිලියන 91.06 ක් එනම් සියයට 98.4ක් මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි. තවද, 2006/25 අංක හා 2006/08/31 දිනැතිව මණ්ඩලයේ පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශය විසින් නිකුත්කර තිබූ චක්‍රලේඛනයට අනුව "සේවකයාගෙන් යැපෙන රැකියා විරහිත අවිවාහක දරුවන්" මෙම ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන බව සඳහන් කර තිබුණද, දරුවන් සඳහා උපරිම වයස් සීමාවක් නිර්ණයකර නොතිබීම, දරුවන් රැකියා කරන්නේද නැද්ද යන්න පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම, විවාහක අවිවාහක බව පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම ආදී දුර්වලතාද, රෝහල්ගත නොවී ලබන ප්‍රතිකාර යටතේ විශේෂ උපකරණ ලබා ගැනීමේ දී වසර දෙකකට වරක් රු. 5,000 ක උපරිමයකට යටත්ව ප්‍රතිපූර්ණය කල හැකිය යන්න දක්වා තිබුණද, එම බිල්පත් සම්බන්ධයෙන් විශේෂ සඳහනක් පරිගණක පද්ධතියට ඇතුළත් නොකරන බැවින් අදාල කොන්දේසිය පරීක්ෂා කිරීමක් සිදු නොවීමත් ආදී අභ්‍යන්තර පාලන පද්ධති දුර්වලතාද නිරීක්ෂණය විය.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති.

2020 විගණකාධිපතිගේ කෙටුම්පත් වාර්තාව පිළිබඳ මණ්ඩලීය නිරීක්ෂණ

1.2 මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 01 අනුව මණ්ඩලය විසින් සිය වගකීම නිසි ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කර ඇත. මණ්ඩලය විසින් ගිණුම්කරණ කාලච්ඡේදයට අදාල දායක මුදල් සත්‍ය ලැබීම් හා සත්‍ය ගෙවීම් මත පදනම්ව වගකීම් නිසි පරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත. එබැවින් ගිණුම් ප්‍රකාශනවල ඇති සාමාජික මුදල් වගකීමේ වටිනාකම නිවැරදිව සටහන් කර ඇත. නමුත් පහත සඳහන් හේතු නිසා විගණන විමසුමෙහි සඳහන් වටිනාකම් සේවායෝජක ගිණුම්වලින් පුද්ගලික සාමාජික ගිණුම්වලට මාරු කිරීමට නොහැකි වී ඇත.

සේවායෝජකයින් විසින් තම සේවකයන්ගේ දායක මුදල් විස්තර ඇතුලත් කරමින් ඉදිරිපත් කල යුතු Form II සහ R4 ඉදිරිපත් නොකර තිබීමල ඉදිරිපත් කර ඇති ඉහත වාර්තාවල අඩුපාඩු නිසා මෙම මුදල් විභජනය ප්‍රමාදව ඇත. තවද වර්තමානයේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය මත ක්ෂේත්‍ර නිලධාරීන්ට අදාල ආයතන වලට ගොස් මෙම වාර්තා ලබා ගැනීම සහ/හෝ නිවැරදි කර ගැනීමේ අවස්ථාව අහිමිවී ඇතග තවද, සේවකයින් කොටස්කර සීමිත ප්‍රමාණයක් රාජකාරි සඳහා කැඳවීම යන කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මෙම මුදල් තවදුරටත් විභජනය නොකල ශේෂයක් ලෙස ගිණුම් වල පෙන්නුම් කෙරේ.

2020/12/31 වන දින වනවිට අපගේ ගිණුම් අනුව විභජනය නොකළ ලැබීම් ලෙස රු මිලියන 931 ක් පෙන්නුම් කල නමුත් 2016 වර්ෂය වනවිට 1981 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පැවති විභජනය නොකළ මුදල් වල එකතුව වන රු මිලියන 2501 ක ප්‍රමාණය පසුගිය වසර කිහිපය තුළ රු මිලියන 2,319 ක ප්‍රමාණයකින් අඩුකරලීමට මණ්ඩලය විශේෂ ඒකකයක් පිහිටුවීම හරහා විශාල ප්‍රගතියක් අත්පත්කරගෙන ඇත.

මේ අනුව සලකා බලන විට 2020 මූල්‍ය වර්ෂයට අදාලව 2020/12/31 දිනට විභජනය නොකරන ලද ලැබීම් වලින් රු මිලියන 435 ක් 1981 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල වන අතර, ඉන් 2020/12/31 දින සිට 2021/09/28 වන දින දක්වා රු මිලියන 106 ක් අදාල සාමාජික ගිණුම් වලට විභජනය කර ඇත. ඉන්පසු ඉතිරි මුදලින් රු මිලියන 141 ක් විශේෂිත පරිගණක වැඩසටහනක් අනුසාරයෙන් අදාල සාමාජික ගිණුම් වලට විභජනය කිරීමට දැනටමත් කටයුතු කරමින් සිටී.

V-999 අවිනිශ්චිත ගිණුමේ 2020 දෙසැම්බර් 31 දින පැවති රු.12,758,720.00 ශේෂය 2021 අගෝස්තු 16 වනවිට රු.43,174,678.47 කිග එහි සාමාජික සංඛ්‍යාව 81 ක් දක්වා වැඩිවී ඇතග දායක මුදල් ලැබීම් වලට අදාල සේවායෝජක අංක සොයාගැනීමට නොහැකිවීම මත මේවා විභජනය කිරීමට නොහැකිවී ඇතග

(ආ) මණ්ඩලය විසින් මණ්ඩලයේ සංචිත වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ වෙන් වෙන්ව පෙන්වා ඇත. මණ්ඩලය විසින් වෙනත් සංචිත යටතේ දක්වා ඇත්තේ ආයුගණික ලාභ/අලාභ (Acturial gain/ loss) වේ. එය තව දුරටත් හෙළිදරව් කිරීමට අවශ්‍යවේ නම් ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරන්නෙමු.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 හි 29 ඡේදයට අනුව මණ්ඩලය විසින් එහි ජංගම නොවන වත්කම් පිරිවැය ආකෘතිය මත මිණුම්ගත (Measurement) කරනු ලබයි. තවද, එම ප්‍රතිපත්තිය සටහන් අංක 2.7 ඔස්සේ හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. තවදුරටත් හෙළිදරව් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඉදිරියේදී හෙළිදරව් කිරීමට පියවර ගන්නෙමු.

2.2.2 වෙනත් පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

(අ) මණ්ඩලයේ අතිකාල සඳහා සේවකයෙකුට මසකට දින දෙකක් පමණක් අනුමැතිය ලබා දීමටත් මාසයේ පළමු සහ අවසාන සෙනසුරාදා දිනවල පමණක් අතිකාල සේවයේ යෙදවීමටත් රීති සකස් කර ඒ අනුව කටයුතු කර ඇත. මෙම මණ්ඩලය පිහිටවූ කාලයේ සිටම අතිකාල ගණනයේදී PL-1, PL-2, PL-3, MA 1-2, MA 2-2 සහ MA 4 ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සඳහා පමණක් පැයට පැය 1 1/2 බැගින් අතිකාල ගණනය කිරීමටත් ඊට අතිරේකව පැය 08 ක සේවය සඳහා දිනක වැටුප ලබා දීමත් සිදුකර ඇත.

ශ්‍රී ලංකාවේ සියළුම සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා සාප්පු සහ කාර්යාල පනතේ ප්‍රතිපාදන අනුව සේවකයෙකුට වාර්ෂිකව අනියම් නිවාඩු දින 07 හා වාර්ෂික නිවාඩු දින 14 ක් වශයෙන් නිවාඩු දින 21 ක් හිමිවේ. සාප්පු සහ කාර්යාල පනත යටතේ ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ හැර සියළුම රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන තුළ වෛද්‍ය නිවාඩු දින 21 ක හිමිකම පවතින අතර බොහෝ ආයතන වල වාර්ෂිකව ඉතිරි වන වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදයක් ද පවතින බව සඳහන් කරමි. ඒ අනුව වෛද්‍ය නිවාඩු 21 මෙම මණ්ඩලය මගින් පමණක් අදාළ කරගත් ක්‍රමවේදයක් නොවන බව දන්වමි.

සාප්පු සහ කාර්යාල පනත අනුව අතිකාල ගණනය කිරීම සඳහා සතියකට පැය 45 ක කාලයක් සේවය කළයුතු වීම රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන්නකි. දින පහක සේවා කාලය තුළ තේ විවේක ගැනීම හෝ දිවා ආහාරය සඳහා පැය 1/2 කට අඩු කාලයක් ගෙන ඉතිරි කාලය සේවය සඳහා යෙදවීම තුළින් සතියේ වැඩකරන දින 05 තුළින්

සෙනසුරාදා සම්පූර්ණ දිනය සඳහා අතිකාල ගෙවීම් කිරීම සිදුකෙරේ.

(ආ) රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව සමඟ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට සහනපොළිය මත නිවාස ණය ලබාදීමට අදාළව 2021.05.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි නව ගිවිසුමකට ඇතුළත්ව ඇත. එම ගිවිසුම ප්‍රකාරව ණය නිකුත්කිරීමේදී පළමු මිලියන 2 ක සඳහා 4.2% ක පොළියක් සහ ඉතිරි මිලියනය සඳහා 7% ක පොළියක් අයකෙරේ. ඒ අනුව නව ගිවිසුමට අනුව මෙම ණය යෝජනා ක්‍රමයේ තිබූ සියළු අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලද බව දැනුම් දෙමි. (නව ගිවිසුමේ පිටපත ඇමුණුම iv)

(ඇ) මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් මූල්‍ය ගනුදෙණු වලදී මූල්‍ය රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඒ ආකාරයෙන්ම භාවිතා කරනු ලැබේ. එසේ වුවත් මෙහෙයුම් කටයුතු ඉටුකරගැනිමේ පහසුව තකා අභ්‍යන්තරව සකසන ලද මූල්‍ය කාර්යය පරිපාටියක් සකසා ඇති අතර එය හුදෙක්ම උපදෙස් මාලාවක් මිස නීතිමය ලියවිල්ලක් ලෙස භාවිතා නොවේ. එසේ වුවදාල මණ්ඩලයේ මූල්‍ය හා පරිපාලන කාර්යය පටිපාටි සංග්‍රහයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, ඒවා යාවත්කාලීන කොට භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරියේදී ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

(ඈ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන ආහාර දීමනාව ඉතිරි නිවාඩු දින 14 ක් සඳහා ගෙවීම සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය මණ්ඩලය ආරම්භක අවධියේ සිට කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ලබාදුන් ප්‍රතිලාභ වේ. ඒ අනුව මුල් අවධියේ ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ප්‍රමාණවත් වූ අතර, මේ සම්බන්ධව 08/10/2013 පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ලබා දුන් උපදෙස් අනුව මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක PE/IN/ETF/Gen සහ 10.11.2014 දිනැති ලිපිය මඟින් "දිරි දීමනා" ශීර්ෂය යටතේ මෙම සියළු දීමනා සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. එසේම අදාළ දිනයෙන් පසුව කාර්ය මණ්ඩලයට වෙනත් නව දීමනා හඳුන්වා දීමක් සිදු නොවූ බවත් එතෙක් පැවති දිරි දීමනා ක්‍රමවේදය ක්‍රියාත්මක කරමින් තිබෙන බවත් සඳහන් කරමු.

2.2.4 නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සමාගම්වල කොටස් ආයෝජනයෙන් ලාභාංශ ලැබීම හෝ නොලැබීම ඒ සමාගම්වල ක්‍රියාකාරිත්වය මත රදා පවතී. එමෙන්ම එයට ආර්ථික හා එම ක්ෂේත්‍රයට අදාල බාහිර සාධකයන්ද බලපානු ලැබේ. මීට අමතරව 2020 වසරේදී රටතුල පැවති COVID 19 වසංගත තත්වය නිසා මුළු රටම මාස ගණනක් හුදකලා කර වසා දමන ලද අතර රටේ ආර්ථික වර්ධනයද සියයට 3.2ක ඍණ අගයක් ගන්නා ලදී. එමනිසා බොහෝ සමාගම් වලද දෛනික කටයුතු නිසිපරිදි පවත්වාගෙන යාමට නොහැකි වූ අතර ලාභාංශ ප්‍රකාශ කිරීමටද නොහැකි තත්වයක්ද උදෑ වූ බව නොරහසකි. එලෙසම සමහර සමාගම් 2020 වසර සඳහා ලාභාංශ ප්‍රකාශ කලද ගෙවාගැනීමට නොහැකි වුනි. (උදෑ. Trans Asia Rs. 0.50 per share, Ex: Date – 2020.03.18). සංචාරක ක්ෂේත්‍රයට අදාල මෙම සමාගම 2019 වසරේ සඳහන් කළ රු මිලියන 49.10 න් රු මිලියන 39.9 ක්ම නියෝජනය කරයි. එමෙන්ම 2018 වසරට අදාලව සඳහන් කළ රු මිලියන 30.14 ක් නියෝජනය කරන සමාගම, 2021 පළමු කර්තුව තුල රු මිලියන 57.96 ක ප්‍රාග්ධන ලාභයක් සහිතව විකුණා ඇත.

එමෙන්ම 2015 නියෝජනය කරන රු මිලියන 31.41 න් රු මිලියන 29.23 ක් ම නියෝජනය කරන්නේ ද සංචාරක ක්ෂේත්‍රයට අදාල සමාග මකි. ඒ අනුව සංචාරක ක්ෂේත්‍රයේ ඉදිරියේදී ඇතිවිය හැකි දියුණුව අනුව එම ක්ෂේත්‍රයට අදාල සමාගම් වලට ද ලාභාංශ ගෙවීමට හැකියාවක් ඉදිරියේදී ඇතිවිය හැකි අතර අනිකුත් සමාගම් වලටද ආර්ථික වර්ධනය සමගම ලාභාංශ ගෙවීමට හැකියාවක් ඇතිවිය හැක. ඊට අමතරව මිල ගණන් ඉහළ ගියහොත් ප්‍රාග්ධන ලාභ සහිතව මෙම සමාගම් වල කොටස් විකිණිය හැක.

ආ) කොටස් වෙළඳපොළ මිළ ගණන් උච්චාවචනය වීම එම ක්ෂෙත්‍රයට ආවේණිකවූ ලක්ෂණයකි. අපේක්ෂිත සමාගම්වල කොටස්වල වෙළඳපොළ මිළ එහි සත්‍ය පිරිවැයට වඩා ඉහළ අගයක් ගන්නාවිට එම කොටස් විකුණා ප්‍රාග්ධන ලාභ ලබා ගෙන ඇත.

විගණන විමසුමේ සඳහන් සමාගම් 12 ද එවැනි වෙළඳපොළ තත්වයන් යටතේ විකුණා ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

තවද මෙම සමාගම් 12 අතරින් සමාගම් 5 ක්ම සංචාරක ක්ෂේත්‍රයට අදාල හෝටල් සමාගම් වන බැවින් රටතුල සංචාරක ව්‍යාපාරය දියුණුවන වාතාවරණයක් තුල සත්‍ය පිරිවැයට වඩා කොටසක වෙළෙඳපොළ මිල ගණන් ඉහල අගයක් ගන්නා විට ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට අපේක්ෂා කරමු.

ඉතිරි සමාගම් ද කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි ප්‍රධාන පෙළේ සමාගම් බැවින් ඒවායේ වෙළෙඳපොළ මිල සත්‍ය පිරිවැයට වඩා ඉහල අගයක් ගන්නා විට විකුණා ලාභ ලැබීමට අපේක්ෂා කරමු. මෙම සියළුම ආයෝජන දීර්ඝ කාලීන ආයෝජන කළඹ තුල තිබෙන සමාගම් වේ. තවද ,මෙම කොටසට අදාල සමාගම් අතරින් සමාගම් දෙකක් 2020 සහ 2021 වසර වලදී අයිතිවාසිකම් නිකුතුව මඟින් අමතර ප්‍රාග්ධනය රැස්කර ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කර ගැනීමට කටයුතු කර ඇත.

ඇ) ඒකක භාර ආයෝජන වලින් නාමල් වර්ධන අරමුදලේ ආයෝජනයෙන් 55 ක ප්‍රමාණයක් ක්‍රම ක්‍රමයෙන් විකුණන ලදී. දැනට ඉතිරිව ඇති ඒකක 450,000 ද වෙළෙඳපොළේ වාසිදායක තත්වයක් මතු වූ විට ප්‍රාග්ධන ලාභ සහිතව ක්‍රමිකව විකිණීමට බලාපොරොත්තු වේ.

ඈ) මෙම හිඟ මුදල් ගෙවන ලෙස ඇල්කඩුව වැවිලි සමාගමට ලිපි කිහිපයක් යවා ඇත. අවසන් වරට 12.07.2021 දින ලිපියක් යවා ඇත. ඔවුන් දුරකථනයෙන් පවසා සිටින්නේ පවත්නා කොවිඩ් තත්වය හමුවේ සමාගම මූල්‍ය අපහසුතාවයට පත්ව ඇති බවයි. මෙම කටයුත්තට අදාලවන මුදල පොළිය නොගෙවීමක් බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් එම මුදල් එකවර අයකර ගැනීමට ඉඩකඩ ඉතා විරලය. එබැවින්, සාමකාමීව මුදල් අයකර ගැනීම ප්‍රඥාගෝචරය. තවද මෙම සමාගම රජයේ සමාගමකි.

ඉ) මෙම පහසුකම ලබා ගැනීම සඳහා හා පවත්වා ගෙන යාම සඳහා සෑහෙන පිරිවැයක් මණ්ඩලයට දැරීමට සිදුවේ. මෙය ලබා ගැනීම සඳහා මණ්ඩලය විසින් ඉටු කළ යුතු කාර්යයන් මහ බැංකුව විසින් දන්වා ඇත. සේවක බඳවා ගැනීම් සම්පූර්ණ කිරීමෙන් පසුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මහබැංකුව විසින් දන්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා කටයුතු සිදු කරනු ඇත.

වර්තමානයේ පවතින වෙන්දේසි ක්‍රමය අනුව මහ බැංකුව විසින් එක් එක් රජයේ සුරැකුම්පත් සඳහා ලංසු ඉදිරිපත් කළ හැකි උපරිම අනුපාතය (cut off) දක්වනා ඇති නිසා ඉන් ඔබ්බට ඇති අනුපාත යටතේ මහ බැංකුව රජයේ සුරැකුම්පත් නිකුත් කරනු නොලබයි. එවන් තත්වයක් යටතේ රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොලෙන් මිළදී ගැනීමේදී තරඟකාරිත්වය ඉතාම අවම මට්ටමක පවතී.

වර්තමානයේ මෙම (Direct Bidding Facility) පහසුකම රජයේ බැංකුවක් වන මහජන බැංකුව මඟින් කිසිම වියදමකින් තොරව සහ අමතර ශ්‍රම භාවිතයකින් තොරව ලබා ගැනීම සිදු කරනු ලබයි. එය මණ්ඩලයේ කටයුතු පහසු කරයි.

ඊ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වරින් වර දැනුවත් කලද එම ණය නැවත අයවීම් මාස 03කට වරක් මණ්ඩලය වෙත ප්‍රේශණය කර නොමැත. 2021.05.21 සිට ක්‍රියාත්මක නව ගිවිසුමට අනුව ණය නැවත අයවීම් මාස 03කට වරක් අයකර ගැනීම විධිමත්ව සිදු කිරීමට කටයුතු යොදා ඇත.

2.3 වෙනත් කරුණු

අ) 2019 වර්ෂයේදී හඳුන්වා දුන් නව්‍යකරණ වැඩසටහන යටතේ 2019.12. 31 දිනට නව සාමාජිකයින් 1614 දෙනෙක් බඳවාගෙන ඇත.එම නව්‍යකරණ වැඩසටහන යටතේ 2020 වර්ෂයට ඉදිරි සැලසුම් ඉදිරිපත් කර ඇතත් කොරෝනා වසංගත තත්වය තුල ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

ආ) කෝප් කමිටුව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශයට අදාල 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන ලද 1988 අංක 46 දරණ (සංශෝධන) පනත මඟින් ඇතුල් කර ඇත. කෝප් කමිටුවේ නිර්දේශය පිළිබඳව අදාල පාර්ශවයන් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ලැබීය. ඒ අනුව සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා එකම පුද්ගලයෙක් වීම වෙනුවට එම තනතුරු දෙක සඳහා පුද්ගලයන් දෙදෙනෙකු පත් කිරීමට සහ මණ්ඩලයේ ප්‍රධානවිධායක නිලධාරී තනතුර සඳහා මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වරයාව පත් කළ හැකි වන පරිදි පනත සංශෝධනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව අදාල යෝජනා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා විෂය භාර අමාත්‍යාංශය වන මුදල් අමාත්‍යාංශයේ ලේකම් වරයා වෙත යොමුකර ඇත. එසේම මෙම යෝජනා ජනාධිපති ලේකම් වරයා, කම්කරුකොමසාරිස් ජනරාලවරයා ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන් වෙතද, ඒ පිළිබඳව දැනුවත් කිරීම සඳහා මේ වනවිට යොමු කර ඇත.

ඇ) හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ගිණුමේ 2020.12.31 දිනට පැවති ශේෂය රු. 17,469,405.51 කි. (ප්‍රතිලාභ අයදුම්කරුවන් 1079) සාමාජිකයින්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් අයෙකුට වඩා හිමිකම් ලාභීන් සිටින බවට තීරණය වන අවස්ථා පවතී. එකී හිමිකම් ලාභීන් සියළු දෙනාම එකවර ඉදිරිපත් නොවීම සහ ඇතැම් අයට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු (සහතිකපත් කඩිනමින් ඉදිරිපත් නොකිරීම) ඉදිරිපත් කිරීමටඇති අපහසුතාවයන් නිසා ඔවුන්ගේ කොටස්, මණ්ඩල ගිණුමේ රඳවාගෙන, ලේඛණ ඉදිරිපත් කර ඇති අයගේ හිමිකම් කොටස් පමණක් ගෙවීම් කිරීමට කටයුතු කිරීම වර්ථමානයේ අනුග මනය කරනු ලබන ක්‍රියාමාර්ග වේ. එසේ රඳවා ගන්නා ලද ප්‍රතිලාභ කොටස්වල එකතුව සහ චෙක්පත් මඟින් ගෙවන ලද මරණ ප්‍රතිලාභවල ප්‍රතිලාභීන් විසින් ගිණුම්ගත නොකරන ලද චෙක්පත්වල වටිනාකම් එකතුව මෙම ගිණුමෙහි ඇතුලත්වේ. 2021 ජනවාරි සිට 2021 ජූලි මාසය දක්වා මරණ ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා රු.809,752.87 ක මුදලක්හිමිකරුවන් 04 දෙනෙකු වෙත ගෙවා ඇති අතර, 2021.07.31 දිනට හිමිකරුවන්ට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම එම මුදලින් රු. 16,659,652.64 ක් වේ. (මරණ ප්‍රතිලාභ අයදුම්පත් 1075)

ආපසු එවන ලද ප්‍රතිලාභ (Returned Benefits – Slip) ගිණුමේ 2020.12.31 දිනට ශේෂය

2020 විගණකාධිපතිගේ කෙටුම්පත් වාර්තාව පිළිබඳ මණ්ඩලීය නිරීක්ෂණ

රු. 21,792,642.72 කි. (ප්‍රතිලාභීන් 829) මෙම සාමාජිකයින්ට හිමි ප්‍රතිලාභ මුදල් අන්තර් බැංකුගෙ වීම් ක්‍රමය යටතේ ප්‍රතිලාභ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ඔවුන්ගේ බැංකුගිණුම් වෙත යවාඇතත්, එම ඉල්ලුම්කරුවන්ගේ බැංකු ගිණුම් විස්තර වල පැවති දෝෂ සහිතභාවය නිසා අදාල බැංකු විසින් හරවා එවා ඇති මුදල මෙම ගිණුමට ගිණුම්ගතවී ඉහත මුදල සැකසී ඇත. මෙම ප්‍රතිලාභ අයදුම්කරුවන් අතුරින්, 2021 ජනවාරි මස සිට 2021 ජූලි මාසය දක්වා ප්‍රතිලාභ හිමිකරුවන් 138 දෙනෙකු විසින් ඉල්ලම් කර ඇති රු. 10,483,409.39 ක මුදල් ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති අතර, 2021.07.31 දිනට එම මුදලින් ගෙවීමට ඇතිවගකීමේ වටිනාකම රු. 11,309,233.33 ක් වේ. (ප්‍රතිලාභීන් 691)

ආපසු ලැබුණු ප්‍රතිලාභ (Returned Benefits – Cheques & Welfare) ගිණුමේ 2020.12.31 දිනට ශේෂය රු. 5,058,164.23 කි. (ප්‍රතිලාභීන් 603) මෙම ප්‍රතිලාභීන් 603 දෙනාගෙන් 30 දෙනෙක් සඳහා මුදල් ගෙවා ඇත්තේ අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය යටතේ වන අතර ඔවුන් විසින් අපට ලබා දී ඇති බැංකු ගිණුම් විස්තර වල දෝෂ හේතුවෙන් ආපසු ලැබී ඇත. ඉතිරි ප්‍රතිලාභ අයදුම්කරුවන් 573 දෙනා වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකරන ලද චෙක්පත්, එම ප්‍රතිලාභ අයදුම්කරුවන් විසින් බැංකුගත නොකිරීම හේතුවෙන් රැඳී ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රතිලාභ අයදුම්කරුවන් අතරින් 15 දෙනෙකුට 2020 ජනවාරි මස සිට 2021 ජූලි මාසය දක්වා රු. 408,401.59 ක මුදලක් නැවත ගෙවීම් කර ඇති අතර, නොගෙවූ ප්‍රතිලාභීන්ට එම මුදලින් තවදුරටත් 2021.07.31 දිනට ගෙවීමට ඇති වටිනාකම රු.4,649,762.64 ක් වේ. (ප්‍රතිලාභීන් 588)

රඳවාගත් මරණ ප්‍රතිලාභ වෙනුවෙන් නිත්‍යානුකූල හිමිකරුවන් සම්බන්ධ කර ගැනීමට මණ්ඩලය සතුව ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් ඉදිරියේදී පුවත්පත් දැන්වීම් සහ බැංකු මගින් ඔවුන්ගේ තොරතුරු රැස්කර ගෙවීමට අදහස් කරමි.

හිමිකම් නොපාන ලද සාමාන්‍ය ප්‍රතිලාභ සහ සුභ සාධක ප්‍රතිලාභ සඳහා දුරකථන ඇමතුම් හා ලිපි මගින් ඔවුන් දැනුවත් කර මුදල් ගෙවන ලද අතර, ඉදිරියේදී තවදුරටත් එම ක්‍රියා මාර්ග අනුග මනය කරමින් මෙන්ම බැංකු මගින් ප්‍රතිලාභීන්ගේ තොරතුරු ලබාගෙන අදාල ගෙවීම් කිරීමට යෝජනා වී ඇත.

(ඈ) 2017 සිට කම්කරු දෙපාර්තමේන්තුව සේවක අර්ථසාධක අරමුදල සමග මාසිකව ලියාපදිංචි තොරතුරු හුවමාරු කිරීමේදී ක්‍රියාවලියක් සිදුවන අතර, එම තොරතුරු පදනම් කරගෙන අනුව්‍යාජ අංක (Dummy) ස්ථිර සේවායෝජක අංක වලට මාරුකිරීම සිදුකරයිග

තවද, මෙම මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල විසින් ආයතන පරීක්ෂණ කිරීමේදී ලබා ගන්නා ස්ථිර සේවායෝජක අංක අනුවද සේවායෝජකයන් විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි වීමෙන් අනතුරුව එම තොරතුරු අප වෙත දැනුම් දෙන අවස්ථාද තිබෙන අතර එවිටද අනුව්‍යාජ අංක (Dummy) යටතේ ගෙවීම් කරන දායක මුදල් ස්ථිර සේවායෝජක අංක වලට මාරුකිරීම නිරන්තරයෙන් සිදුකරනු ලැබේ.

(ඉ) මාසික දිරිදීමනා පැමිණීමේ ක්‍රමවේදය තුළ සේවකයාට වෛද්‍ය, අනියම් හා වාර්ෂික යන නිවාඩු වර්ග තුනෙන් නිවාඩු ලබාග ැනීමේ හැකියාවක් පවතී. තවද, සේවකයන් විසින් මාසිකව ලබා ගන්නා නිවාඩු මත දිරිදීමනා ගෙවීම පදනම් කරගෙන ඇත. නමුත් සේවකයින් විසින් ඉතිරි කරගන්නා වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් කිරීම වසර 30 කට පමණ පෙර ඇරඹී ක්‍රමවේදයක් වන අතර, එය තවදුරටත් සේවකයන් ලබා ගන්නා නිවාඩු ප්‍රමාණය අඩු කරලීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයක් වන බවත්, බොහෝ මණ්ඩල සහ රාජ්‍ය ව්‍යවසායන්හි පවත්නා දිරි දීමනා ක්‍රමවේදයක් බව සඳහන් කරමි. 2020 වර්ෂයේදී පැවති වසංගත තත්වය හේතුවෙන් නිවසේ සිට රාජකාරී කටයුතු සිදුකිරීම හා යම් සේවක පිරිසක් අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු සඳහා සේවයට පැමිණීම යන හේතු නිසා කිසියම් ක්‍රම වේදයක් අනුගමනය කරමින් දිරි දීමනා ගෙවන ලදි.

(ඊ) වෛද්‍යාධාර දායක මුදල වසර 10 ක කාලයක් තුළ සංශෝධනය නොවීම පිළිගනියි. ඉදිරියේදී එම මුදල වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දෙමි.

සේවකයාගෙන් යැපෙන "රැකියා විරහිත අවිවාහක දරුවන්" ගේ උපරිම වයස අවුරුදු 25 ක් ලෙස මෑතකදී තීරණය කර ඇත. වයස 21 ට වැඩි දරුවන්ට අදාළව වෛද්‍යාධාර ගෙවීම් වලදී ග්‍රාම නිලධාරී සහතික/ උසස් අධ්‍යාපන ආයතන වල සහතික ආදිය මගින් රැකියා නොකරන බව හා අවිවාහක බව තහවුරු කර ගන්නා බව සඳහන් කරමි.

විශේෂ උපකරණ ලබා දීමේදී වසර දෙකකට වරක් රු.5000.00 දක්වා ප්‍රතිපූර්ණය කිරීමට අදාලව පරිෂනක පද්ධතිය යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ.

(අත්සන් කලේ.)

ශ්‍රියාන් ද සිල්වා විජයරත්න
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

සංඛ්‍යාලේඛණ ඇමුණුම

පොලි හා ලාභාංශ අනුපාත



පොලි හා ලාභාංශ අනුපාත



ආදායමට අනුව වියදම



සාමාජික අරමුදල



ශුද්ධ වත්කම්



එකතු කිරීම සහ ආපසු ගෙවීම



අපගේ ලඟාවීම

කොළඹ 1-7
21වැනි මහල, "මෙහෙවර පියෙස", කිරුළ පාර, නාරාහේන්පිට,
කොළඹ 05.
දුර. +94 11 7747295
ෆැක්ස්. +94 11 7747293
විද්‍යුත් ලිපිනය. mgrcol1_7@etfb.lk | rocol1_7@etfb.lk

කොළඹ 8-15
21වැනි මහල, "මෙහෙවර පියෙස", කිරුළ පාර, නාරාහේන්පිට,
කොළඹ 05.
දුර. +94 11 7747279
ෆැක්ස්. +94 11 7747279
විද්‍යුත් ලිපිනය. mgrcol8_15@etfb.lk | rocol8_15@etfb.lk

කොළඹ දිස්ත්‍රික්කය
21වැනි මහල, "මෙහෙවර පියෙස", කිරුළ පාර, නාරාහේන්පිට,
කොළඹ.
දුර. +94 11 7747288
ෆැක්ස්. +94 11 7747288
විද්‍යුත් ලිපිනය. mgrcoldis5@etfb.lk

ගම්පහ
නො: 58/බී, ක්වීන් මේරි මාවත,
ගම්පහ.
දුර. +94 33 2234520
ෆැක්ස්. +94 33 2234520
විද්‍යුත් ලිපිනය. mgrgam@etfb.lk | rogam@etfb.lk

ගාල්ල
නො:30/1/1, ශ්‍රී දේවමිත්ත මාවත,
ගාල්ල.
දුර. +94 91 2245814
ෆැක්ස්. +94 91 2245814
විද්‍යුත් ලිපිනය. mgrgall@etfb.lk | rogall@etfb.lk

කලුතර
නො:294, ගාල්ල පාර,
කලුතර දකුණ.
දුර. +94 34 2237722
ෆැක්ස්. +94 34 2237722
විද්‍යුත් ලිපිනය. mgrkalu@etfb.lk | rokalu@etfb.lk

මහනුවර
නො:79/4, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
මහනුවර.
දුර. +94 81 2233793
ෆැක්ස්. +94 81 2233793
විද්‍යුත් ලිපිනය. mgrkan@etfb.lk | rokan@etfb.lk

අනුරාධපුර
නො:87/25, 1 වැනි පටුමඟ, ධර්මපාල මාවත,
අනුරාධපුර, ශ්‍රී ලංකාව.
දුර. +94 25 2222185
ෆැක්ස්. +94 25 2222150
විද්‍යුත් ලිපිනය. mgranu@etfb.lk | roanu@etfb.lk

කුරුණෑගල
නො:27, ශ්‍රී ලංකා රතුකුරුස ගොඩනැගිල්ල, කච්චෙරි පාර,
කුරුණෑගල.
දුර. +94 37 2228194
ෆැක්ස්. +94 37 2056394
විද්‍යුත් ලිපිනය. mgrkur@etfb.lk | rokur@etfb.lk

කෑගල්ල
නො:247, කෙලින් වීදිය,
කෑගල්ල.
දුර. +94 35 2222991
ෆැක්ස්. +94 35 2222991
විද්‍යුත් ලිපිනය. mgrkeg@etfb.lk | rokeg@etfb.lk

යාපනය
නො:86 1/2, 1 වැනි මහල, නවලර් පාර,
යාපනය.
දුර. +94 21 2220010
ෆැක්ස්. +94 21 2220010
විද්‍යුත් ලිපිනය. mgrjaff@etfb.lk | rojaff@etfb.lk

වවුනියාව
නො:69/1/1, මිල් පාර,
වවුනියාව.
දුර. +94 24 2228225
ෆැක්ස්. +94 24 2228225
විද්‍යුත් ලිපිනය. mgrvavu@etfb.lk | rovavu@etfb.lk

නුවරඑලිය
නො:56, ලෝසන් පාර, ට්‍රයැන්ගල්,
නුවර එලිය, ශ්‍රී ලංකාව.
දුර. +94 52 2224475
ෆැක්ස්. +94 52 2224475
විද්‍යුත් ලිපිනය. mgrnuwa@etfb.lk | ronuwa@etfb.lk

ත්‍රිකුණාමලය
නො:455, මහනුවර පාර, ත්‍රිකුණාමලය.
දුර. +94 26 2056606
ෆැක්ස්. +94 26 2056606
විද්‍යුත් ලිපිනය. mgrtrin@etfb.lk | rotrin@etfb.lk

රත්නපුර
නො: 53/1/2, සේනානායක මාවත,
රත්නපුර.
දුර. +94 45 2222529
ෆැක්ස්. +94 45 2222529
විද්‍යුත් ලිපිනය. mgrratn@etfb.lk | roratn@etfb.lk

මාතර
නො:63/2, කාලිදාස මාවත,
මාතර.
දුර. +94 41 2231877
ෆැක්ස්. +94 41 2231877
විද්‍යුත් ලිපිනය. mgrmat@etfb.lk | romat@etfb.lk

බදුල්ල
නො:9බී, රිවර්සයිඩ් පාර,
බදුල්ල.
දුර. +94 55 2224482 | +94 55 2225357
ෆැක්ස්. +94 55 2230779
විද්‍යුත් ලිපිනය. mgrbadu@etfb.lk | robadu@etfb.lk

හම්බන්තොට
නො:57, විල්මට් වීදිය,
හම්බන්තොට.
දුර. +94 47 2222460 | +94 47 2222462
ෆැක්ස්. +94 47 2222460
විද්‍යුත් ලිපිනය. mgrham@etfb.lk | roham@etfb.lk

අම්පාර
නො:12/ඒ, මල්වත්ත පාර,
අම්පාර, ශ්‍රී ලංකාව.
දුර. +94 63 2224845
ෆැක්ස්. +94 63 2224882
විද්‍යුත් ලිපිනය. mgramp@etfb.lk|roamp@etfb.lk